

# වාර්ෂික පර්යේෂණ සැසිය 2018

# සිංහල අධ්‍යයනයේ අතුරු මාවත්

## Sinhala Studies at Crossroads

සිංහල අධ්‍යයනාංශය | කොළඹ විශ්වවිද්‍යාලය

# වාර්ෂික පර්යේෂණ සැසිය 2018

# සිංහල අධ්‍යයනයේ අතුරු මාවත්

# Annual Research Sessions 2018
# Sinhala Studies at Crossroads

2018 ඔක්තෝබර් 17

සිංහල අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය

Department of Sinhala
Universtiy of Colombo

සාරසංක්ෂේප සංග්‍රහය
වාර්ෂික පර්යේෂණ සැසිය 2018
සිංහල අධ්‍යයනයේ අතුරු මාවත්

මෙහි අඩංගු කිසිදු කරුණක් සම්බන්ධ ව ප්‍රකාශක වගකීමක් නොමැත.

සියලු හිමිකම් ඇවිරිණි

© අචින්ත්‍ය බණ්ඩාර, පූජ්‍ය තිඹිරිවැව සිරිසුමන හිමි

මුද්‍රණය :
කේ.එස්.යූ. ග්‍රැෆික් පුද්ගලික සමාගම
අංක 510, රාජගිරිය පාර, රාජගිරිය.
දූරකථන 011 2884701

ප්‍රකාශනය : සිංහල අධ්‍යයනාංශය,
කොළඹ විශ්වවිද්‍යාලය.

**අනුශාසකත්වය**

ආචාර්ය ලතා ගුරුසිංහ

අංශ ප්‍රධාන සිංහල අධ්‍යයනාංශය

**පර්යේෂණ සැසි ප්‍රධාන**

කථිකාචාර්ය අචින්ත්‍ය බණ්ඩාර

**සම්බන්ධීකාරක**

සහකාර කථිකාචාර්ය පූජ්‍ය තිඹිරිවැව සිරිසුමන හිමි

**සංස්කාරක කමිටුව**

කථිකාචාර්ය අචින්ත්‍ය බණ්ඩාර

සහකාර කථිකාචාර්ය පූජ්‍ය තිඹිරිවැව සිරිසුමන හිමි

සහකාර කථිකාචාර්ය නිලංගි රුවන්පුර

**සංවිධායක කමිටුව**

සහකාර කථිකාචාර්ය චාමලී සෙනෙවිරත්න

සහකාර කථිකාචාර්ය චරිතා රත්නායක

සහකාර කථිකාචාර්ය චතුරිකා අබේරත්න

**ප්‍රචාරක කමිටුව**

සහකාර කථිකාචාර්ය නාලක ජයසේන

සහකාර කථිකාචාර්ය නදී කුමාරි

සහකාර කථිකාචාර්ය රුවිනි නිසංසලා

සහකාර කථිකාචාර්ය නිලක්ෂි ප්‍රනාන්දු

**සම්බන්ධීකරණ කමිටුව**

සහකාර කථිකාචාර්ය වයි. ඩී. ප්‍රියංකර

සහකාර කථිකාචාර්ය චාමලී පලිහවඩන

සහකාර කථිකාචාර්ය එච්. එච්. ඒ. හසිනි කුමාරි හේරත්

සහකාර කථිකාචාර්ය ඩී. එච්. හෂාරා මධුෂානි

සහකාර කථිකාචාර්ය ඩබ්ලිව්. සුපිපි තනූජා හර්ෂණී

# වැඩසටහන් පෙළගැස්ම

| | | | |
|---|---|---|---|
| පෙ. ව. | 8.00 | - | ලියාපදිංචිය |
| පෙ. ව. | 8.30 | - | සමාරම්භක උත්සවය |
| පෙ. ව. | 10.00 | - | පළමු පර්යේෂණ සැසිය |
| පෙ. ව. | 11.20 | - | දෙවන පර්යේෂණ සැසිය |
| ප. ව. | 12.35 | - | දිවා අහාරය |
| | පෝස්ටර් සැසිය | | |
| ප. ව. | 1.30 | - | සමෝධාන සැසිය |
| ප. ව. | 3.15 | - | තෙවන පර්යේෂණ සැසිය |
| ප. ව. | 4.45 | - | සිවුවන  පර්යේෂණ සැසිය |
| ප. ව. | 6.15 | - | සංස්කෘතිකාංගය |



# උපකුලපතිතුමාගේ පණිවිඩය

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශය වාර්ෂික ව පවත්වනු ලබන ශාස්ත්‍රීය පර්යේෂණ සැසියේ අට වන ප්‍රයත්නය වන්නේ මෙය යි. මෙ වර එම සැසියේ තේමාව වන්නේ "සිංහල අධ්‍යයනයේ අතුරුමාවත් " යන්න යි. සිංහල අධ්‍යයනාංශයේ 2018 වසරේ වාර්ෂික පර්යේෂණ සැසියෙහි පූර්ණ පත්‍රිකා ග්‍රන්ථය එළිදැක්වීම වෙනුවෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති වශයෙන් සටහනක් තබන්නට ලැබීම පිළිබඳ ව මම සතුටුවෙමි.

ශ්‍රී ලංකාවේ බොහෝ විශ්වවිද්‍යාලයන්හි මානව ශාස්ත්‍ර පීඨවල වියතුන් ඉදිරිපත් කළ පර්යේෂණවල සාරසංක්ෂේප පත්‍රිකා මෙම පුස්තිකාවේ ඇතුළත් වේ. සිංහල භාෂාව සම්බන්ධයෙන් අභියෝගාත්මක වාතාවරණයක් පවතින මෙ බඳු කාලයක කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශය ශාස්ත්‍රීය ලෝකයට සපයන අග්‍රගණ්‍ය දායකත්වයක් ලෙස මෙම කාර්ය අගයමි. ඉදිරියටත් මෙ වැනි ගවේෂණාත්මක අධ්‍යයනයන්ට පසුබිම සකසමින් ඒ වෙනුවෙන් කටයුතු සම්පාදනය කිරීමට සිංහල අධ්‍යයනාංශයට අවස්ථාව සැලසේවා යි ප්‍රාර්ථනා කරමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක
උපකුලපති
කොළඹ විශ්වවිද්‍යාලය



# පීඨාධිපතිතුමාගේ පණිවිඩය

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශය අට වන වරටත් සංවිධානය කරනු ලබන වාර්ෂික පර්යේෂණ සැසියේ පර්යේෂණ පත්‍රිකා ඇතුළත් ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය කෘතියක් වශයෙන් පළකිරීම ශාස්ත්‍රීය අවකාශය පුළුල් කිරීමකි. "සිංහල අධ්‍යයනයේ අතුරු මාවත්" තේමාකර ගනිමින් එළිදැක්වෙන මෙම කෘතිය සිංහල අධ්‍යයනාංශයේ තවත් එක් අගනා ශාස්ත්‍රීය කටයුත්තකි. විශ්වවිද්‍යාල ආචාර්යවරුන් මෙන් ම විද්‍යාර්ථීන් පර්යේෂණ කාර්යන්ට ද නිරන්තරයෙන් යොමු වියයුතු අතර එම පර්යේෂණවලින් සොයාගනු ලබන ශාස්ත්‍රීය දැනුම් සම්භාරය සිසු පරපුරට මෙන් ම සමාජය වෙත ද සම්ප්‍රේෂණය කිරීමට වගබලා ගත යුතු වෙයි. සිංහල අධ්‍යයනාංශයෙන් සිදුකරන මෙම කර්තව්‍ය ඉතාමත් අගය කළයුතු ශාස්ත්‍රීය ප්‍රයත්නයක් ලෙස මම දකිමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා
පීඨාධිපති
ශාස්ත්‍රපීඨය
කොළඹ විශ්වවිද්‍යාලය



## අංශාධිපතිතුමියගේ පණිවිඩය

සිංහල භාෂාවේ ප්‍රවර්ධනය උදෙසා පර්යේෂණයන්හි අවශ්‍යතාවය හඳුනාගත් අපි ඒ සඳහා වාර්ෂික පර්යේෂණ සැසි සංවිධානය කළෙමු. 2011 වසරෙහි එහි ආරම්භය සනිටුහන් කළ අතර මෙ වර එය පැවැත්වෙන්නේ අට වන වරට යි. සිංහල අධ්‍යයනාංශයෙන් ලාංකේය විශ්වවිද්‍යාලය ක්ෂේත්‍රයෙහි පර්යේෂණයන්ට මහඟු අවස්ථාවක් උදාකර දී ඇත. ඒ සඳහා ලංකාවේ විශ්වවිද්‍යාලය රාශියක විද්වතුන් පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම සුවිශේෂී කරුණකි. නව දැනුම සමාජගත කරනු වස් පර්යේෂණ පත්‍රිකා කෘතියක් ලෙස සම්පාදනය කිරීම අත්‍යවශ්‍ය වේ.

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ ශාස්ත්‍රීය කාර්යන් අතර වාර්ෂික පර්යේෂණ සැසියට ලැබෙනුයේ ප්‍රමුඛතාවයකි. සිංහල අධ්‍යනයේ ප්‍රමුඛතාවය තහවුරු කෙරෙන "සිංහල අධ්‍යයනයේ අතුරු මාවත්" යන්න මෙ වර පර්යේෂණ සැසියේ තේමාව යි. මෙම පර්යේෂණ සැසිය නවක පර්යේෂකයන්ට මහඟු අත්වැලක් වේවා යි පතමි.

ආචාර්ය ලතා ගුරුසිංහ
අංශ ප්‍රධාන
සිංහල අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය

# සංස්කාරක සටහන

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ වාර්ෂික පර්යේෂණ සැසිය නවක හා ප්‍රවීණ පර්යේෂකයන්ගේ ඥානමීමාංශාව උරගා බලන උරගල යි. එම පර්යේෂකයන්ගේ නව පර්යේෂිත දැනුම සම්ප්‍රේෂණය කිරීමට ඉඩකඩ සැකසීම අපගේ අභිලාෂය යි. එම බුද්ධි කලම්බනය ශාස්ත්‍රීය සමාජයේ විමර්ශනයට ලක්කිරීම මෙයින් සිදු වේ.

සිංහල අධ්‍යයනාංශය අටවන වරට සංවිධානය කරන වාර්ෂික පර්යේෂණ සැසිය "සිංහල අධ්‍යයනයේ අතුරු මාවත්" යන්න යි. මෙම තේමාව යටතේ සිංහල භාෂා සාහිත්‍ය හා අනුබද්ධ අනුවිෂය ක්ෂේත්‍ර රාශියක් සම්බන්ධ ව පර්යේෂකයන් සිදු කරන ලද පර්යේෂණ මෙම වාර්ෂික සැසියේ දී විමර්ශනයට පාත්‍ර වේ.

විශ්වවිද්‍යාලයන්හි ආචාර්ය මණ්ඩලවලට පමණක් සීමා වී තිබූ සිංහල අධ්‍යනාංශ පර්යේෂණ සැසිය විශ්වවිද්‍යාලය පද්ධතියෙන් පරිබාහිර ව පර්යේෂණ සිදුකරන ස්වාධීන පර්යේෂකයන්ට ද මෙ වර විවෘත කෙරිණ.

අලුතින් සිංහල අධ්‍යයනාංශ පර්යේෂණ සැසියට එකතු වන සමෝධාන සැසිය හා පෝස්ටර් සැසිය ශ්‍රී ලාංකේය පර්යේෂණ කාමීන්ට නවමු අත්දැකීමක් වනු ඇත.

සිංහල අධ්‍යයන අනෙකුත් විෂය ක්ෂේත්‍ර සමඟ අවියෝජනීය ලෙසින් සම්බන්ධ වී තිබේ. ඒවායේ අන්‍යෝන්‍ය සම්බන්ධය ගවේශණය කිරීම පර්යේෂකයන්ගේ මූලික වගකීම යි. එය හුදෙක් සිංහල අධ්‍යයනවලට ම පමණක් සීමාවීම නො මනා ය. යම්කිසි භාෂාවක් හෝ සාහිත්‍යක් අතුරු මාවත් ඔස්සේ විහිදී යන ආකාරය පර්යේෂණයට ලක් කිරීම අත්‍යවශ්‍ය ම කරුණකි. ඒ සඳහා අවශ්‍ය දායකත්වයක් මෙම පර්යේෂණ සැසියෙන් සැලසෙතැයි අපගේ විශ්වාසය යි.

සංස්කාරකවරු

අචින්ත්‍ය බණ්ඩාර (පර්යේෂණ සැසි ප්‍රධාන)
පූජ්‍ය තිඹිරිවැව සිරිසුමන හිමි (සම්බන්ධීකාරක)

# Session Schedule
# October 17, 2018
# 'Sinhala Studies at Crossroads'

**Session One (Concurrent Sessions)**
10.00am- 11.15am

**Econ Auditorium**
**Sub Theme: Literary Studies**
**Session Organizers:** Ms. Kumudu Karunatne/ Mr. Osanda Gunaratne
**Session Chairperson:** Mr. Piyal Kariyawasam

| | | |
|---|---|---|
| **SSS 16** | මානව පුරුෂාර්ථ ගවේෂණය පිළිබඳ ව සාංදෘෂ්ටිකවාදයේ හා බෞද්ධ දර්ශනයේ එන සංකල්ප ඇසුරෙන් විමර්ශනයක්. | වගීෂානි ජයසූරිය |
| **SSS27** | සූක්ති සමාජීය වාක්කෝෂයː (මංජුල වෙඩිවර්ධනගේ 'දූස්ටකමේ සවුන්දර්ය සහ රත්මලානේ තවත් කතා' කෙටිකතා සංග්‍රහය ආශ්‍රයෙන් කෙරෙන අධ්‍යයනයක්) | පූජ්‍ය කිරිමැටියාවේ සුගුණධම්ම හිමි |
| **SSS37** | A Study on Validity of Prophetic Dreams with Reference to Buddhist Literature | Y. Ariyawansa Thero |
| **SSS06** | ජන කවියා දූප්පත්කම සිය නිර්මාණ ඇසුරේ කතිකාවට ලක් කර තිබෙන අයුරු පිළිබඳ අධ්‍යයනයක්. | ඉසුරු සම්පත් තෙන්නකෝන් |
| **SSS44** | සාහිත්‍ය ශානරවල උපයුක්ත චරිත වටහා ගැනීමට මනෝවිශ්ලේෂණවාදයේ දායකත්වයː ස්වයංජාත නවකතාව ඇසුරින් සිදු කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක් | පූජ්‍ය ඉඳුනිල්පුර ඉන්දානන්ද හිමි |

**MB Ariyapala Auditorium**
**Session Organizers:** Ms. Kalyani Wijesundara/ Ms. Deepachandi Abeysinghe
**Sub Theme: Socio-Anthropological Studies**
**Session Chairperson:** Dr. Pradeep Peris

| | | |
|---|---|---|
| **SSS37** | A Study on Validity of Prophetic Dreams with Reference to Buddhist Literature | Y Ariyawansa Thero |
| **SSS43** | විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වාදීමෙන් පසු ශ්‍රී ලාංකේය ජනවිඥානය සකස් කිරීමෙහි ලා සඟරා මාධ්‍යයේ උපයෝගීතාව | කුමේෂ් ප්‍රභාෂිනි ගමගේ |
| **SSS45** | සුනිල් සාන්ත - සරච්චන්ද්‍ර ගැටුමː ලාංකේය ස්වදේශීකරණ ව්‍යාපාරයේ ප්‍රතිවිරෝධතා පිළිබඳ සංස්කෘතික කියවීමක්. | හිනිදුම සුනිල් සෙනෙවි සමන් කාරියකරවන |
| **SSS09** | පළිඟු මැණිකේ ටෙලි වෘතාන්තය පිළිබඳ (පශ්චාත්) නූතනවාදී අධ්‍යයනයක් | දිෂාන් මධුසංඛ |
| **SSS36** | ආගමික ස්ථානයක් මඟින් සමාජයට සිදු කෙරෙන කෘත්‍යයන් පිළිබඳ ව සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයක් | ජී.කේ.ජී.අයි.එල්. රණසිංහ |

**Faculty Boardroom**

**Sub Theme: Language and Linguistics**

**Session Organizers:** Prof. Sandagomi Coperahewa/ Achinthya Bandara/ Ms. Chamali Seneviratne

**Session Chairperson:** Prof. KNO Dharmadasa

| | | |
|---|---|---|
| **SSS18** | ශ්‍රී ලංකාවේ කවට පුවත්පත්හි භාෂා භාවිතය සහ දේශපාලන සන්නිවේදනය | ගයාන් මධුසංඛ |
| **SSS54** | කුමාරතුංග මුනිදාසගේ භාෂා සැලසුම්කරණ ප්‍රයත්නය පිළිබඳ සිංහල හදාරනු ලබන විද්‍යාර්ථීන්ගේ අවබෝධය පිළිබඳ ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයක් | පූජ්‍ය තිඹිරිවැව සිරිසුමන හිමි<br>නාලක ජයසේන |
| **SSS29** | A Corpus-based Morphological Analysis of Sinhala Non-Finite Verbs | Nimasha Dilshani, Gihan Dias |
| **SSS33** | The use of questions in mediated political debates in Sinhala | Kaushalya Perera |

**Session Two (Concurrent Sessions)**
11.20am- 12.35pm

**Econ Auditorium**
**Sub Theme: Cultural Studies**
**Session Organizers:** Snr. Prof. Ananda Tissa Kumara/ Dr. Jayanthi Bandara
**Session Chairperson:** Senior Prof. Raj Somadeva

| | | |
|---|---|---|
| **SSS02** | ජන කවියෙන් හෙළිවන භූගෝල විද්‍යාත්මක දෘෂ්ටිකෝණය පිළිබඳ ව අධ්‍යයනයක්: | ඩබ්ලිව්.සී. රණසිංහ |
| **SSS39** | වාත්ස්‍යායනගේ කාමභෝගී සාහිත්‍ය අර්ථ රසාත්මකය : කාම සූත්‍රය සත්‍ය යථාර්ථය කොළඹ කේන්ද්‍රීය ආයුර්වේද සම්භාහන මධ්‍යස්ථාන ඇසුරින් | ආර්.එන්. පැතුම් |
| **SSS38** | පොළොන්නරු යුගයේ සංගීතය සහ භාරතීය සබඳතා | නිසංක අබේරත්න |
| **SSS40** | ලක්දිව ස්තූප ප්‍රචලිත වීම සඳහා බලපෑ ආගමික පසුබිම | ඉනෝජ් කෞශල්‍ය අබේනායක |
| **SSS46** | සිංහල සංස්කෘතියේ යාතුකර්මවල ජලය හා බැඳුණු පාරිශුද්ධ සංකල්පය පිළිබඳ අධ්‍යයනයක් (දකුණු පළාත ඇසුරින්) | චතුරිකා අබේරත්න |

**Prof. MB Ariyapala Auditorium**
**Sub Theme: Language and Linguistics**
**Session Organizers:** Prof. Sandagomi Coperahewa/ Mr. Achinthya Bandara/Ms. Chamali Seneviratne
**Session Chairperson:** Dr. Kaushalya Perera

| | | |
|---|---|---|
| **SSS03** | වතු දෙමළ භාෂාව කෙරෙහි සිංහල භාෂාවේ බලපෑම්: සමාජවාග්විද්‍යාත්මක අධ්‍යයනයක් | සුපිපි හර්ෂණී |
| **SSS08** | Internal restrictions in language education towards persons with visual impairments: A study on aspirated and nonaspirated letters in written Sinhala | Ridmi Handapangoda |
| **SSS13** | The Use of Directives by Children and Adults in a Sinhala-Speaking Household | Lawanya Abeysooriya |
| **SSS32** | Gendered Taboo Words; A sociolinguistic study of the use of taboo words among young bilingual men and women in Sri Lanka | DNH Dewasiri |
| **SSS50** | නීතිය ඉගැන්වීමට භාවිත කෙරෙන පාරිභාෂික වචන (සිංහල) පිළිබඳ නීතිය හදාරන විද්‍යාර්ථීන් තුළ පවතින අවබෝධය පිළිබඳ පරීක්ෂාවක් | වයි.ඩී. ප්‍රියංකර |

**Faculty Boardroom**

**Sub Theme: Drama, Performing and Fine Arts**

**Session Organizers:** Dr. Ranjith Senanayake/ Nadee Kumari

**Session Chairperson:** Dr. Saumya Liyanage

| | | |
|---|---|---|
| **SSS58** | අතීත උඩරට වෙස් ඇඳුමේ බහුවිධ ස්වරූප : උඩරට නැට්ටුවන්ගේ පැරණි ම ඡායාරූප ඇසුරෙන් කෙරෙන අධ්‍යයනයක් | සුදේශ් මන්තිලක |
| **SSS56** | වීරයා සමාජය සහ රාජ්‍ය දෘෂ්ටිවාදය :කුසීයෝ ටෙලිනාට්‍ය සහ සමාජ මාධ්‍ය ඇසුරෙන් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක් | නලින් ගල්කන්දආරච්චි |
| **SSS55** | සිනමා තිරය මත සහ තිරයෙන් පිටත 'භික්ෂුව : හෙජමොනික බලධිකාරයේ ප්‍රතිරූප අභියස කලාව | ප්‍රියන්ත ෆොන්සේකා |
| **SSS59** | සැලේ සැලේ මහද සැලේ පෝනි : හැටේ දශකයේ මනස් පුතාගේ සිනමා රංග ප්‍රකාශකයා | අතුල සමරකෝන් |

**Session Three (Concurrent Sessions)**
03.15pm- 04.30pm

**Econ Auditorium**
**Sub Theme: Socio-Anthropological Studies**
**Session Organizers:** Ms. Kalyani Wijesundara/ Ms. Deepachandi Abeysinghe
**Session Chairperson:** Prof. Jayadeva Uyangoda

| | | |
|---|---|---|
| **SSS12** | ඉගෙනුම් ආශ්‍රිත ගැටලු සඳහා උපදේශන මැදිහත්වීම | චාමරි කුමාරි |
| **SSS17** | Influence of gender on perception of landscape: A study of Viharamahadivi park in Colombo | MDB Perera |
| **SSS31** | ශ්‍රී ලාංකික දෙමළ වතු කම්කරු ජනයාගේ ද්වාරකර්ම පිළිබඳ සමාජ මානව විද්‍යාත්මක විමසුමක් (පුස්සැල්ලවත්ත දෙමළ වතු කම්කරු පවුල් 30ක් ඇසුරින්) | කේ. තේෂාන් නිර්මල<br>එම්.එම්. අමිල බණ්ඩාර<br>එම්.ඩී. භාග්‍යා විහාරා සෙව්වන්දි |
| **SSS07** | ජනතා විමුක්ති පෙරමුණේ (ජ.වි.පෙ.) 1971 අප්‍රියෙල් අරගලය කැරැල්ලක් ද? නැතිනම් මාක්ස් - ලෙනින්වාදී විප්ලවීය අරගලයක් වී ද යන්න පිළිබඳ ව ඓතිහාසික විමසුමකි. | මයිකල් ඩී. සිල්වා |
| **SSS34** | පශ්චාත් යටත් විජිත ශ්‍රී ලංකා සමාජය තුළ සමාජ ස්තරායන ප්‍රවර්ගයක් වශයෙන් කුලය ප්‍රතිනිර්මාණය වීම : සමාජ විද්‍යාත්මක කියවීමක් | දිනුෂිකා යාපා අබේවර්ධන |

**Prof. MB Ariyapala Auditorium**
**Sub Theme: Language and Linguistics**
**Session Organizers:** Prof. Sandagomi Coperahewa/ Mr. Achinthya Bandara/Ms. Chamali Seneviratne
**Session Chairperson:** Prof. Ratnasiri Arangala

| | | |
|---|---|---|
| **SSS04** | මධ්‍යම පළාතේ සාමාන්‍ය පෙළ සිසුන්ගේ සිංහල අක්ෂර වින්‍යාස භාවිතය | ඩී.බී.එස්.පී. කුලතුංග |
| **SSS11** | හින්දි - සිංහල, සිංහල - හින්දි භාෂා පරිවර්තනයේ දී ඇතිවන සංස්කෘතික ගැටලු පිළිබඳ ව විමසුමක් | ලපලු විජේසූරිය |
| **SSS19** | Translating selected chapters of the "Language" of Leonard Bloomfield into Sinhalese with a critical essay on challenges occurred when translating | Nayomi Madupani |
| **SSS42** | විශ්වවිද්‍යාලය විද්‍යාර්ථීන් සිංහල ලේඛන ව්‍යවහාරයේ දී අක්ෂර වින්‍යාසය කෙරෙහි දක්වන අවධානය පිළිබඳ අධ්‍යයනයක් | ජයනි සමීරා |

**Session Three (Concurrent Sessions)**
03.15pm- 04.30pm

**Econ Auditorium**
**Sub Theme: Socio-Anthropological Studies**
**Session Organizers:** Ms. Kalyani Wijesundara/ Ms. Deepachandi Abeysinghe
**Session Chairperson:** Prof. Jayadeva Uyangoda

| | | |
|---|---|---|
| **SSS12** | ඉගෙනුම් ආශ්‍රිත ගැටලු සඳහා උපදේශන මැදිහත්වීම | චාමරි කුමාරි |
| **SSS17** | Influence of gender on perception of landscape: A study of Viharamahadivi park in Colombo | MDB Perera |
| **SSS31** | ශ්‍රී ලාංකික දෙමළ වතු කම්කරු ජනයාගේ ද්වාරකර්ම පිළිබඳ සමාජ මානව විද්‍යාත්මක විමසුමක් (පුස්සැල්ලවත්ත දෙමළ වතු කම්කරු පවුල් 30ක් ඇසුරින්) | කේ. හේෂාන් නිර්මල<br>එම්.එම්. අමිල බණ්ඩාර<br>එම්.ඩී. භාග්‍යා විහාරා සෙව්වන්දි |
| **SSS07** | ජනතා විමුක්ති පෙරමුණේ (ජ.වි.පෙ.) 1971 අප්‍රියෙල් අරගලය කැරැල්ලක් ද? නැතිනම් මාක්ස් - ලෙනින්වාදී විප්ලවීය අරගලයක් වී ද යන්න පිළිබඳ ව ඓතිහාසික විමසුමකි. | මයිකල් ඩී. සිල්වා |
| **SSS34** | පශ්චාත් යටත් විජිත ශ්‍රී ලංකා සමාජය තුළ සමාජ ස්තරායන ප්‍රවර්ගයක් වශයෙන් කුලය ප්‍රතිනිර්මාණය වීම : සමාජ විද්‍යාත්මක කියවීමක් | දිනුෂිකා යාපා අබේවර්ධන |

**Prof. MB Ariyapala Auditorium**
**Sub Theme: Language and Linguistics**
**Session Organizers:** Prof. Sandagomi Coperahewa/ Mr. Achinthya Bandara/Ms. Chamali Seneviratne
**Session Chairperson:** Prof. Ratnasiri Arangala

| | | |
|---|---|---|
| **SSS04** | මධ්‍යම පළාතේ සාමාන්‍ය පෙළ සිසුන්ගේ සිංහල අක්ෂර වින්‍යාස භාවිතය | ඩී.බී.එස්.පී. කුලතුංග |
| **SSS11** | හින්දි - සිංහල, සිංහල - හින්දි භාෂා පරිවර්තනයේ දී ඇතිවන සංස්කෘතික ගැටලු පිළිබඳ ව විමසුමක් | ලපඳූ විජේසූරිය |
| **SSS19** | Translating selected chapters of the "Language" of Leonard Bloomfield into Sinhalese with a critical essay on challenges occurred when translating | Nayomi Madupani |
| **SSS42** | විශ්වවිද්‍යාලය විද්‍යාර්ථීන් සිංහල ලේඛන ව්‍යවහාරයේ දී අක්ෂර වින්‍යාසය කෙරෙහි දක්වන අවධානය පිළිබඳ අධ්‍යයනයක් | ජයනි සමීරා |

**Faculty Boardroom**
**Sub Theme: Oriental Studies**
**Session Organizers:** Dr. Premasiri Nagasinghe/ Ms. Ruwini Nisansala
**Session Chairperson:** Senior Professor Ananda Tissa Kumara

| | | |
|---|---|---|
| **SSS49** | ජාතක පොතෙන් නිරූපිත සමාජ සාරධර්ම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (දස පාරමිතාවන්ට අදාළ ජාතක කතා 10 ක් ඇසුරෙන්: | පූජ්‍ය දෙල්තර ඥානානන්ද හිමි<br>ඕ.වී.පී. යසෝදරා කුලරත්න |
| **SSS57** | A critical analysis on Buddhist theory of Momentariness which was challenged by Bādarāyaṇa (with reference to Brahma Sutra) | Rev. Pepiliyawala Narada<br>Dr. W.A. Gamini Wijayasinhe |
| **SSS25** | A study of the act of truth (saccakiriya) utilized in sinhala jātaka stories as a specific writing technique | Ekala Dhamma Nishanthi Thero |
| **SSS14** | කාලිදාසගේ ඍතුසංහාරයේ සිංහල පද්‍යමය පරිවර්තන පිළිබඳ විමසුමක් | පූජ්‍ය ඩබ්. ඉන්දානන්ද හිමි |
| **SSS05** | සද්ධර්මරත්නාකරයේ දේශීය කතා ප්‍රවෘත්තීන්ගෙන් හෙළිවන සමාජීය ජීවිතය පිළිබඳ අධ්‍යයනයක් | ඕ.ජී.එස්.ජී. රුවන්තිලක<br>ජී.කේ. විදානපතිරණ |


**Session Four (Concurrent Sessions)**
04.45pm- 05.45pm

**Econ Auditorium**
**Sub Theme: Drama and Performing Arts**
**Session Organizers:** Dr. Ranjith Senanayake/ Nadee Kumari
**Session Chairperson:** Dr. Sudesh Manthilake

| | | |
|---|---|---|
| **SSS20** | ශාන්තිකර්ම සාහිත්‍යයෙහි නිරූපිත හස්මාසුර පුවත | ඩබ්ලිව්.වී.පී. එච්. රණවීර |
| **SSS22** | ලෙස්ටර් ජේම්ස් පීරිස් සහ සත්‍යජිත් රේගේ සිනමා කෘති අතර තුලනාත්මක අධ්‍යයනයක් | බී. ඒ. එන්. එච්. බණ්ඩාරනායක. |
| **SSS30** | සිවිල් සමාජයේ දෘෂ්ටිවාදී අවකාශය තුළ වාර්ගික ආතතිය (Ethnic tension) කෙරෙහි ශ්‍රී ලංකාවේ සිංහල සිනමාවේ රූප වියමනෙහි (Image Texting) බලපෑම | උෂා අරුණි |

**Prof. MB Ariyapala Auditorium**
**Sub Theme: Language and Linguistics**
**Session Organizers:** Prof. Sandagomi Coperahewa/ Mr. Achinthya Bandara/Ms. Chamali Seneviratne
**Session Chairperson:** Prof. Gihan Dias

| | | |
|---|---|---|
| **SSS51** | ආරම්භක නව යොවුන්වියෙහි සිසුන් ඩිජිටල් මෙවලම් භාවිතය: කියවීමේ රුචිකත්වයට සිදු කරන බලපෑම | කලයාණි විජේසුන්දර<br>එනෝකා රත්දෙණිය |
| **SSS41** | සිංහල භාෂාවේ සමකාලීන ප්‍රවණතා (ත්‍රිවිල් භාෂාව පිළිබඳ ව සිදු කෙරෙන සමාජ සංස්කෘතික අධ්‍යයනයක්) | හර්ෂණී මිල්ලගහතැන්න |
| **SSS26** | ශු. බයිබලය ඔස්සේ ප්‍රකට වන සංඥාර්ථවේදය (ලූක් සුවිශේෂයට විශේෂිත ව) | මෙත්සිකා කාරියවසම් |
| **SSS35** | සිංහල භාෂාවෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හැදෑරීමේ දී ඇතිවන ගැටලු පිළිබඳ ප්‍රතෛයක අධ්‍යයනයක් (කොළඹ විශ්වවිද්‍යාලයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය හදාරන සිසුන් ඇසුරෙන්) | එන්.සී. සේනානායක |




# මුඛ්‍ය දේශනය

සම්මානිත මහාචාර්ය ජේ.බී. දිසානායක


# සමෝධාන සැසිය



ආචාර්ය සෞම්‍ය ලියනගේ
පීඨාධිපති
පශ්චාද් උපාධි පීඨය
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය



මහාචාර්ය ගිහාන් ඩයස්
භාෂා හා තාක්ෂණ ඉංජිනේරු අධ්‍යයනාංශ
මොරටුව විශ්වවිද්‍යාලය



ආචාර්ය රෝහණ සෙනෙවිරත්න
අංශාධිපති
සම්භාව්‍ය භාෂා අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය



ආචාර්ය හර්ෂණ රඹුක්වැල්ල
අධ්‍යක්ෂ
ඉංග්‍රීසි පශ්චාද් උපාධි ආයතනය
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

**A Video Screening of "*My Devil Dance*" followed by a Discussion**

Dance theatre piece by Dr. Sudesh Mantillake

880s, Sri Lankan dancers were transported to Europe and later to the US to display them for audiences as part of "colonial exhibition." While colonial exhibition brought modernity to Lankan dancers, they have suffered during their journey. Not only the dancers were displayed in an zoos, but also, they were not given proper facilities to protect from the cold weather. While dancers suffered from European winter weather, they re-rolled and sold cigarettes to find money.

*Devil Dance* embodies the experience of a Sri Lankan dancer that was brought to European nial exhibition in 1880s. It is a journey of a dancer through cultural histories, colonization, and -colonization. As a dancer, choreographer and a researcher born and raised in Sri Lanka, I ess an experience of colonized dancers through a postcolonial body. As a Sri Lankan dancer, I ore the experience of being displayed with animals as exotic creatures. After examining onal stories, cultural histories, and performance histories,I contend that ever since the British nization, Sri Lankans, other dancers, and I have become dependent on rich-white-nations, -nations, IMF, World Bank, and corporations.

Mantillake is a dancer, choreographer, researcher, and an educator. He is trained in Kandyan of Sri Lanka and Kathak dance of India, theatrical clowning, and contemporary dance. Sudesh ved his BA degree from the University of Peradeniya- Sri Lanka, and MSc degree from the ersity of Lugano - Switzerland. Currently, he is pursuing a PhD degree at the School of Theatre, and Performance Studies at the University of Maryland. Apart from Sri Lanka, he has presented his work in Athens, Sharjah, London, Helsinki, Lugano, New York, Virginia, Chicago, California, and yland. Sudesh has been an intern at the National Museum of Dance, New York, and at the Sri Lanka cational, Cultural and Welfare Foundation, London. He has also done summer institute at Dance hange (founded by Liz Lerman) Takoma Park, USA.Within past three years Sudesh has performed *arampara*, a reflection on transmission of traditional Kandyan dance, *Subvisible*, a collaborative ement theatre piece with musician David Chavannes, *Nothing*, a theatrical clown piece by Les(s) ns. directed by Leslie Felbain and Daniel Pinha, His recent choreography *My Devil Dance* explores an dancers' experience in the European "colonial exhibitions." Sudesh has been awarded, national Teaching Fellowship (University of Maryland, 2013-2014), Leonardo Fellowship versity of Lugano, 2006), University Prize for Academic Excellence (University of Peradeniya, ), All Island Sri Lanka-Best Solo Dancer – Kandyan (Ministry of Education, Sri Lanka, 1997). His *Ves dance of Sri Lanka, a Semiotic Analysis* has been published in Sinhala in 2010. Sudesh is a manent faculty member (currently on study leave) at the Department of Fine Arts in the University of adeniya, Sri Lanka.

# සාර සංක්ෂේප
# Abstracts

SSS02

# ජන කවියෙන් හෙළිවන භූගෝල විද්‍යාත්මක දෘෂ්ටිකෝණය පිළිබඳ ව අධ්‍යයනයක්

ඩබ්.සී. රණසිංහ
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
ප්‍රාදේශීය කාර්යාලය, මාතර
warunicranasinghe@gmail.com

**සාර සංක්ෂේපය**

සංස්කෘතික උරුමයන් ගෙනහැර පෑමේ දී ජනශ්‍රැතියට හිමිවන්නේ ප්‍රමුඛස්ථානයක් වන අතර එහි දී වැදගත් වන අපූර්ව කලා මාධ්‍යක් වශයෙන් ජන කවිය හඳුනාගත හැකි ය. මිනිසා සහ පරිසරය අතර සම්බන්ධතාවය අධ්‍යයනය කිරීම භූගෝල විද්‍යාවේ දී සිදුවන අතර මිනිසා, පරිසරය සහ ජන කවිය යන අංග ත්‍රිත්වය එකිනෙක සම්බන්ධ වන්නේ කෙසේ ද යන්න විමසා කිරීම මෙහි දී සිදු වේ. මෙයින් භූගෝල විද්‍යාත්මක කරුණු හෙළි කිරීමට ජන කවිය කෙතරම් දුරට සමත් වී ඇත්තේ ද යන්න පරීක්ෂා කර බලන අතර මෙහි ප්‍රධාන අරමුණ වන්නේ ජන කවියෙන් හෙළිවන භූගෝල විද්‍යාත්මක දෘෂ්ටිකෝණය කෙබඳු ද යන්න අධ්‍යයනය කිරීම යි. මිට අනතුරු ව වර්තමානයේ දී වියැකී යන ජන කවි නමැති කලා අංගය කෙරෙහි අවධානයක් යොමු කරවීම ද තවත් අරමුණක් වෙයි. මෙම අරමුණු මූලික කරගෙන සිදු කළ මෙම අධ්‍යයනයේ දී භූගෝල විද්‍යාත්මක වශයෙන් වැදගත් වන භූමිය, ජලය, භූමි අභ්‍යන්තරය, පරිසර සුන්දරත්වය, භූ [illegible]නාවය, ස්වභාවික උපද්‍රව යනාදී භූ විද්‍යාත්මක සංකල්ප පිළිබඳ ජන කවිවලින් අපූරුවට [illegible] කෙරෙන අන්දමක් හඳුනා ගත හැකි වූ අතර ජන කවියෙන් භූ විද්‍යාත්මක තොරතුරු [illegible] කරන බව මෙම අධ්‍යයනයෙන් පැහැදිලි විය.

**මුඛ්‍ය පද** : ජන කවිය, දෘෂ්ටිකෝණය, පරිසරය, භූගෝල විද්‍යාත්මක දෘෂ්ටිකෝණය.

SSS03

# වතු දෙමළ භාෂාව කෙරෙහි සිංහල භාෂාවේ බලපෑම: සමාජවාග්විද්‍යාත්මක අධ්‍යයනයක්

සුපිපි තනුජා හර්ෂණි
සහාකර කථිකාචාර්ය
සිංහල අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
supipiharshaniuoc@gmail.com

## සාර සංක්ෂේපය

කාලයෙන් කාලයට නොයෙක් අවශ්‍යතා සඳහා වරින් වර විවිධ ජන කොටස් සමූහ වශයෙන් ලංකාවට ගෙන්වා ගැනුණු අවස්ථා අතීතයේ සටහන් වෙයි. එසේ සංක්‍රමණය වූ ජන කොටස් අතරින් ඇතම්හු මෙහි ස්ථිර පදිංචිකරුවෝ බවට පත් වූහ. මොවුනතුරින් ඇතමුන් තම මුල් බස අතැර සිංහලය මවු බස කරගත් අතර සමහරෙක් සුපුරුදු මුල් බස ම ව්‍යවහාර කරන්නට වූහ. ක්‍රමයෙන් ඔවුන්ගේ මුල් බසට සිංහල වචන එකතු වීමක් ද දැකගත හැකි විය. මෙසේ බ්‍රිතාන්‍ය ආණ්ඩු සමයේ ලංකාවට සංක්‍රමණය වූ ඉන්දියානු දෙමළ ජනතාව ලංකාවේ වතුකර ප්‍රදේශයන්හි ජීවත් වෙමින් තේ වතු සඳහා තම ශ්‍රමය ලබා දෙමින් සිංහලයන් සමඟ සම්මිශ්‍ර ව ජීවත් වන්නට විය. මෙම ජනයා කාලයත් සමඟ තම මුල් බස වූ දෙමළ බස අමතක වන තරමට ම ඉතා දක්ෂ ලෙස සිංහල බස ව්‍යවහාර කර වර්තමානය වන විට ද්විභාෂික කොටසක් බවට පත් ව ඇත. මාතර දිස්ත්‍රික්කයේ දෙණියාය ප්‍රදේශයේ දියදාව වතුයාය කේන්ද්‍ර කරගත් මෙම පර්යේෂණය වතු දෙමළ භාෂාවට සිංහල භාෂාව කෙතරම් බලපෑමක් කර ඇති ද යන්න විද්‍යමාන කරයි. ඔවුන්ගේ සමාජීය සබඳතාවය කෙතරම් වේ ද එයට වඩා භාෂාත්මක වශයෙන් ඔවුන් සමීප ව ඇති ආකාරය පෙනී යයි.

**ප්‍රමුඛ පද :** උපභාෂා, ද්විභාෂකත්වය, දෙවන භාෂා උපාර්ජනය, වතු දෙමළ භාෂාව.

# මධ්‍යම පළාතේ සාමාන්‍ය පෙළ සිසුන්ගේ සිංහල අක්ෂර වින්‍යාස භාවිතය

ඩී.බී.එස්.පී. කුලතුංග
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
sandhyakulathunga@gmail.com

**සාර සංක්ෂේපය**

ලේඛන මාධ්‍ය යන්න ඕනෑම රටක සන්නිවේදනයේ ප්‍රධාන අංගයක් ලෙස හඳුනාගත හැකි ය. එනම් ලේඛනය අන් සියලු මාධ්‍යයන්ට වඩා ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් වන නිසා ය. යම් අදහසක් ප්‍රකාශ කිරීමේ එක් මාධ්‍යයක් ලෙස හඳුනාගත හැකි ලේඛනයේ රීති සමුදායක් පවතී. මේ අතරින් අර්ථවලට ගැළපෙන නිවැරදි අක්ෂර භාවිතයෙන් පද සෑදීම මෙහි ලා සුවිශේෂී වේ. සිංහල භාෂාවේ අක්ෂර වින්‍යාසය පිළිබඳ අනුගමනය කළ යුතු ව්‍යවහාර රීති අධ්‍යයනයේ පහසුව තකා කොටස් කිහිපයක් යටතේ වර්ග කළ හැකි ය. එනම් න ණ ලළ භේදය, ඌෂ්මාක්ෂර භේදය, අල්පප්‍රාණ හා මහප්‍රාණ භේදය ආදී වශයෙනි.

මේ පර්යේෂණයේ දී අ.පො.ස සා.පෙළ සිසුන්ගේ න ණ ල ළ භේදය පිළිබඳ ව ඇති අවබෝධයත්, ඌෂ්මාක්ෂර කවරේ ද? ඒවා නිවැරදි ස්ථානවල අර්ථ ගැන්වෙන ආකාරයෙන් භාවිත කරන්නේ කෙසේ ද? යන්නත්, අල්පප්‍රාණ, මහප්‍රාණ භේදයේ දී ඒවා වෙන්කර හඳුනාගෙන භාවිත කරන්නේ ද? යන්නත් පිළිබඳ ව අවධානය යොමු කරන ලදි. වර්තමානය වනවිට පාසල් ශිෂ්‍ය ප්‍රජාව ලේඛන ව්‍යවහාරයේ දී භාෂාව හැසිරවීම සඳහා නිවැරදි අක්ෂර වින්‍යාසයක් භාවිත කරන්නේ ද? යන්න ඇතැම් විටක ගැටලුවකි. ඊට හේතුව ඔවුන් තම තමන්ගේ රුචි අරුචිකම් මත අක්ෂර වින්‍යාස භාවිත කිරීම යි. මේ ගැටලුව හමුවේ මධ්‍යම පළාතේ අ.පො.ස සා.පෙළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අක්ෂර වින්‍යාස භාවිතය කෙසේ වේදැයි හඳුනා ගැනීම පර්යේෂණයේ අරමුණ විය.

මහාචාර්ය විමල් ජී බලගල්ලේ මහතා දක්වන්නේ ද ආධුනිකයන්ගේ සිංහල ලේඛනවල ...නෙවින් අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි දක්නට ඇති බව යි. ඒ අනුව තත්කාලීන පාසල් ප්‍රජාව තුළ නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳ අවබෝධය වඩාත් වැදගත් වෙයි. මෙම පර්යේෂණයේ දී ප්‍රාථමික මූලාශ්‍රය ලෙස තෝරාගත් නියැදියට අදාළ සිසුන් සඳහා ප්‍රශ්නාවලියක් ලබාදීමත්, සම්මුඛ සාකච්ඡාත්, ද්විතීයික මූලාශ්‍රය ලෙස අක්ෂර වින්‍යාසය පිළිබඳ පුස්තකාලය අධ්‍යයනයත් සිදුකරන ලදි.මධ්‍යම පළාතේ අ.පො.ස සා.පෙළ සිසුන්ගේ අක්ෂර වින්‍යාස ගැටලු මොනවාදැයි හඳුනාගැනීම සඳහා පාසල් 5ක් තෝරාගනිමින් පර්යේෂණයේ පහසුව සඳහා ප්‍රශ්නාවලියක් ලබාදීමත්, සම්මුඛ සාකච්ඡා මඟින් ඔවුන්ට ලේඛනයේ දී අක්ෂර වින්‍යාස නිවැරදි ව භාවිතය සම්බන්ධයෙන් ඇතිවන ගැටලු පිළිබඳ හඳුනාගැනීමත්, අල්පප්‍රාණ මහාප්‍රාණ භේදය උච්චාරණයට සාපේක්ෂ ව ලේඛනයේ දී වෙනස් වන ආකාරය හඳුනාගන්නේ ද යන්න පිළිබඳවත් ...නය කරන ලදි.

...නුව. මෙම ගැටලු සඳහා දරුවන්ට කුඩාකල සිට ම නිවැරදි අක්ෂර භාවිතය, අක්ෂරවල ඇති ...ස්කම්, ඌෂ්මාක්ෂර, අල්පප්‍රාණ මහාප්‍රාණ ආදී ව්‍යාකරණාංග පිළිබඳ විධිමත් අවබෝධයක් ...න්. පාසල් තුළ දී දරුවන්ගේ අක්ෂර වින්‍යාස ගැටලු හඳුනාගෙන ඒ සඳහා ගුරුභවතුන්ගේ ... විම තව්දුරටත් ප්‍රමාණවත් පරිදි සිදුකිරීමත්, දරුවන්ගේ අක්ෂර වින්‍යාසය නිවැරදි කිරීම සඳහා පන්ති කාමර මට්ටමින් ම යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීමත් යෝග්‍යයැයි සිතමි.

**මුඛ්‍ය පද** : අක්ෂර වින්‍යාසය, අල්පප්‍රාණ, ඌෂ්මාක්ෂර, ලේඛන ව්‍යවහාරය, ශිෂ්‍ය ප්‍රජාව.

SSS05

# සද්ධර්මරත්නාකරයේ දේශීය කතා ප්‍රවෘත්තීන්ගෙන් හෙළිවන සමාජීය ජීවිතය පිළිබඳ අධ්‍යයනයක්

ඕ.ජී.එස්.ජී. රුවන්තිකා
තාවකාලික සහකාර කථිකාචාර්ය
ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
supunisjp.ac@gmail.com

ජී.කේ. විදානපතිරණ
තාවකාලික සහකාර කථිකාචාර්ය
ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**සාර සංක්ෂේපය**

ඓතිහාසික සමාජය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී යොදා ගත හැකි මූලාශ්‍රය අතර, සාහිත්‍ය මූලාශ්‍රයන්ට සුවිශේෂි ස්ථානයක් හිමි වේ. අනුරාධපුර යුගයේ සිට වරින් වර ලියැවුණු ගද්‍ය, පද්‍ය, සාහිත්‍ය කෘති විමසීමේ දී ඒවායින් බොහොමයක් සමකාලීන සමාජය විවරණය කරනු ලබයි. අමාවතුර, බුත්සරණ, පූජාවලිය, රසවාහිනිය, සද්ධර්මරත්නාවලිය, සද්ධර්මාලංකාරය ආදී සාහිත්‍ය කෘති ඒවා ලියැවුණු ඓතිහාසික යුගයන්ට අයත් දේශපාලන, ආර්ථික, සමාජීය මෙන් ම ආගමික තොරතුරු අධ්‍යයනය කිරීම සඳහා ප්‍රබල පිටුවහලක් සපයයි. මෙ රට සාහිත්‍යයේ සුවිශේෂී යුගයක් වශයෙන් හඳුනාගත හැකි කෝට්ටේ යුගයේ ධම්මදින්නාචාර්ය විමලකිත්ති නම් හිමියන් විසින් රචනා කරන ලද සද්ධර්මරත්නාකරය කෝට්ටේ යුගයේ සමාජය පිළිබඳ අධ්‍යයනය කරන්නෙකුට මූලාශ්‍රයක් වශයෙන් කෙතරම් දුරට උපකාරී වේ ද යන්න අධ්‍යයනය කිරීම මෙකී අධ්‍යයනයේ අරමුණ වේ. සද්ධර්මරත්නාකරයේ දොළොස්වන පරිච්ඡේදයේ සිට තිස් හය වන පරිච්ඡේදය දක්වා දේශීය කථා ප්‍රවෘත්තීන් අන්තර්ගත වන අතර, එම කථාවල එන සාමාන්‍ය ජන ජීවිතයට අයත් අධ්‍යාපනය, රැකී රක්ෂා, ආහාර පාන, සෞන්දර්ය කලාව වැනි අංශයන් පිළිබඳ ව කෙබඳු තොරතුරු අන්තර්ගත වේ ද යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ දී සිදු කරන ලදී.

**ප්‍රමුඛ පද :** අධ්‍යාපනය, ආහාර, කෝට්ටේ, සද්ධර්මරත්නාකරය, සෞන්දර්ය.

SSS07

# ජනතා විමුක්ති පෙරමුණේ (ජ.වි.පෙ.) 1971 අප්‍රියෙල් අරගලය කැරැල්ලක් ද? නැතිනම් මාක්ස් - ලෙනින්වාදී විප්ලවීය අරගලයක් වී ද යන්න පිළිබඳ ව ඓතිහාසික විමසුමකි.

දේව මයිකල් ද සිල්වා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
රුහුණු විශ්වවිද්‍යාලය
devamichael@live.com

**සාර සංක්ෂේපය.**

ජාත්‍යන්තර දේශපාලනය දෙස බලනවිට 1960 දශකයේ මැද භාගය වනවිට මාක්ස්වාදී දර්ශනය ඔස්සේ සෝවියට් දේශය, මහජන චීනය, කියුබාව හා වියට්නාමය සමාජවාදී විප්ලවය ජයග්‍රහණය කර තිබුණේ ය. මේ විප්ලවීය රළ වේගයේ ආහ්ලාදය ශ්‍රී ලංකාවේ තරුණ මනස් තුළ විප්ලවවාදී මනෝ රාජ්‍යයක් බිහි කිරීමට හේතු වූයේ ය. මාක්ස්වාදය පිළිබඳ මතිමතාන්තර ශ්‍රී ලංකාවට පැමිණියේ 1930 දශකයේ දී පමණ ය. ඒ ඇමරිකාව හා බ්‍රිතාන්‍ය විශ්වවිද්‍යාලයවල උසස් අධ්‍යාපනය ලැබීමට ගිය ඉහළ පංතියේ ඉංග්‍රීසි දත් බුද්ධිමතුන් මඟිනි. එහි දී ඔවුන් විද්‍යාත්මක සමාජවාදය හා මාක්ස්වාදය හදාරා අධිරාජ්‍ය විරෝධී වාමාංශික සංවිධානයන්ට බැඳී කටයුතු කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස පිලිප් ගුණවර්ධන, කොල්වින් ආර්. ද සිල්වා, එස්.ඒ. වික්‍රමසිංහ. ඇන්.ඇම්. පෙරේරා ඇතුළු පිරිස් මෙරටට පැමිණ දේශපාලනය ක්‍රියාත්මක කිරීමත් සමඟ ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරය ආරම්භ වන්නට විය.

**ප්‍රමුඛ පද** : අරගලය, කැරැල්ල, නිර්ධන පංතිය, විප්ලවය, සන්නද්ධ

SSS08

# Internal restrictions in language education towards persons with visual impairments: A study on aspirated and non-aspirated letters in written Sinhala.

Ridmi Handapangoda
Department of Sinhala
University of Colombo
Ridmih95@gmail.com

## Abstract

It is observed, limitations towards persons with physical impairments by social conventions are contributed crucially to disable them socially. As a conventional creation by its speech community, language has not been allowed to flee from this reality. Though, previous studies have paid considerable attention on language disorders, based on a biological view point. However, studies focused on restrictions towards persons with physical impairments by language are still inadequate. Hence, a study carried out with the objective of identifying the internal restrictions (restrictions, directly linked with language) in language education towards Visually Impaired Persons (VIPs), paying special attention to aspirated and nonaspirated letters in written Sinhala. The study revealed two causes for the identified problem through analyzing the collected data. a) Differences between spoken and written language: Incompatible nature of sounds and letters. b) Methods used in transcribing. This paper would make recommendations on the basis of results revealed through the study in order to mitigate regrettable issues, facing VIPs due to linguistic limitations in the context of aspirates and non-aspirates in written Sinhala.

**Keywords:** Visually impaired, Language education, Restrictions

SSS09

# පළිඟු මැණිකේ ටෙලි වෘත්තාන්තය පිළිබඳ (පශ්චාත්) නූතනවාදී අධ්‍යයනයක්

එම්.ඒ. දිශාන් මදුශංඛ
තාවකාලික පර්යේෂණ සහකාර
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
කොළඹ විශ්වවිද්‍යාලය
dishan.madushanka92@gmail.com

**සාර සංක්ෂේපය**

ලාංකේය ටෙලිනාට්‍ය කලාවේ සමාරම්භක අවධිය එනම් 80 දශකය නියෝජනය කළ ටෙලි වෘත්තාන්තයක් ලෙස ''පළිඟු මැණිකේ'' ටෙලි වෘතාන්තය හඳුන්වා දිය හැකි ය. 70 දශකයේ අ… භාගයේ මෙ රටට හඳුන්වා දෙනු ලැබූ ආර්ථික නිදහස්කරණය හරහා සාම්ප්‍රදායික ගැමි සමාජය… විපර්යාසයන්ට ලක් වූ ආකාරය ''පළිඟු මැණිකේ'' ටෙලිවෘත්තාන්තය අත්දැකීම වී ඇති අත… නූතනවාදී සහ පශ්චාත් නූතනවාදීන් එළඹුම් ඔස්සේ උක්ත අත්දැකීම් විමංසනය කිරීම ස… නූතනත්වය හා ග්‍රාමීය සිංහල බෞද්ධ ජාතිකවාදී හරය අතර ගැටීම විශ්ලේෂණාත්මක … විවරණය කිරීම මෙහි මුඛ්‍ය අභිලාෂය බවට පත් කර ගන්නා ලදී. මෙම පර්යේෂණය පුස්තකාල… පර්යේෂණයක් වශයෙන් සිදු කරන ලදී. ඒ තාක් පැවති සරල සම්බන්ධතා ජාලය වෙනුවට නිදහ… ආර්ථිකය හරහා සංකීර්ණ සම්බන්ධතා ජාලයක් නිර්මාණය කෙරෙන අතර වාණිජමය අවශ්‍යතා ග්‍රාමීය සන්දර්භය තුළ උත්පාදනය කිරීමක් දැකිය හැකි වේ.

ගමට නූතනත්වය රැගෙන යන ප්‍රධාන ප්‍රවාහකයා වන්නේ තරුණයන් වන අතර ඒ තාක් පැව… සිංහල බෞද්ධ ජාතිකවාදී පුරුෂාර්ථයන් සහ ඊට නායකත්වය සැපයූ බලවේග අභියෝගය… ලක්වීම හා නූතනත්වයේ ආනුෂංගයන් ශීඝ්‍රයෙන් ගැමි සමාජය වෙත අවශෝෂණය වී ''පළි… මැණිකේ'' ටෙලි වෘත්තාන්තයෙන් විවරණය කර ඇත.

**ප්‍රමුඛ පද** : අධිපරිභෝජනවාදය, ආර්ථික නිදහස්කරණය, ජාතකවාදය, නූතනත්වය, පළි… මැණිකේ.

SSS11

# හින්දි-සිංහල,සිංහල හින්දි භාෂා පරිවර්තනයේ දී ඇති වන සංස්කෘතික ගැටලු පිළිබඳ විමසුමක්

ලපලු හිරණ්‍ය විජේසූරිය
ශාස්ත්‍රවේදී හින්දි (විශේෂ)
තුන්වන වසර, භාෂා අධ්‍යනාංශය
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
hiranshon@gmail.com

## සාර සංක්ෂේපය

වර්තමානය වන විට භාෂා පරිවර්තනය ක්‍රියාවලිය මුළුමහත් ලෝකයේ ම විශේෂිත අංගයක් බවට පත් වී ඇත. පරිවර්තනය නිසාවෙන් අද වන විට ලෝකය ම එක් නිවසක් බවට පත් වී ඇත. භාෂාව යනු එම රටේ කැඩපත යි. එම කැඩපතින් එරට සංස්කෘතිය, ආගමිකත්වය, දේශපාලන, සමාජීය හා ආර්ථිකය ආදී සියලු අංශ හා ක්ෂේත්‍රය පිළිබඳ ව විස්තෘත විවරණයක් ලබාදෙයි. ඒ අතරින් හින්දි හා සිංහල භාෂා දෙක අතර පවතින්නේ දැඩි සබඳතාවයකි. මන්දයත් මෙම භාෂා දෙකෙහි ම මාතෘ භාෂාවන් සමාන යැයි සැලකෙන නිසා ය. ශබ්ද, පද, වාක්‍ය, විශේෂණ, වාක්‍ය ආදියෙන් සමාන කමක් දක්වන නිසාවෙන් හින්දි සිංහලයට හා සිංහල හින්දියට පරිවර්තනය කිරීමේ දී පරිවර්තකයාට පරිවර්තන ක්‍රියාවලියේ දී යම්කිසි සහනයක් ලැබේ. නමුත් භූදෙක් භාෂාව ව්‍යාකරණය පිළිබඳ ව පෘථුල දැනුමක් තිබූ පමණින් ම භාෂා පරිවර්තනය සිදු කළ නො හැකි ය. එසේ පරිවර්තනය සිදු කළත් එම පරිවර්තිත කෘතිය හෝ අංශය සාර්ථක නො වනු ඇත. [illegible] භාෂාවකට ම ආවේණික මෙන් ම විශේෂිත වූ සංස්කෘතිය හෝ අංශය සාර්ථක නො වනු [illegible]. සෑම භාෂාවකට ම ආවේණික මෙන් ම විශේෂිත වූ සංස්කෘතියක් දක්නට ලැබේ. එම නිසා [illegible] භාෂා පරිවර්තයක් කෙරෙහි භාෂා පරිවර්තකයා තුළ එම භාෂාවන්ට ආවේණික වූ [illegible]ස්කෘතිය හා එහි ඓතිහාසිකත්වය පිළිබඳ මනා අවබෝධයක් හා දැනුමක් තිබිය යුතු ය. එසේ [illegible] නිසා මුල් භාෂාවට අයත් සංස්කෘතිය ලක්ෂ්‍ය භාෂාවට පරිවර්තනය වීමේ දී එහි සැබෑ [illegible] බොහෝ සෙයින් හානි සිදුවිය හැකි ය. සිංහල භාෂාව හා හින්දි භාෂාවට අයත් [illegible] සමාන බවක් දක්නට ලැබෙන මුදු විශාල වශයෙන් අසමානතා ද දක්නට ලැබේ. [illegible]නිසාවෙන් හින්දි සිංහල, සිංහල හින්දි පරිවර්තනයේ දී පරිවර්තකයාට සංස්කෘතික වශයෙන් [illegible] රාශියකට මුහුණපෑමකට සිදු වේ.

[illegible] සාර්ථක පරිවර්තයෙකුගේ කාර්ය වන්නේ මුල්භාෂාවේ හා ලක්ෂ්‍ය භාෂාවේ [illegible] සමානත්වය අසමානත්වය පිළිබඳ නිවැරදි ව තීරණය කර එයට අදාළ වන [illegible] මුල් භාෂාවේ සිට ලක්ෂ්‍ය භාෂාව දක්වා රැගෙන ඒම යි. එසේ නො කිරීමෙන් [illegible] මුල් කෘතියේ ඇති අදහස හෝ නිවැරදිභාවයන් ලක්ෂ්‍ය භාෂා කෘතියෙන් ලබාදීමට [illegible]නො හැකි වේ. මාගේ මෙම පර්යේෂණ මඟින් පරිවර්තකයාට පරිවර්තනයේ දී [illegible]යන් ඇතිවන ගැටලු පිළිබඳ විමර්ශනයක් සිදුකරනු ලැබේ.

[illegible] පරිවර්තනය, භාෂා, සංස්කෘතිය, සිංහල, හින්දි.

SSS12

# ඉගෙනුම ආශ්‍රිත ගැටලු සඳහා උපදේශන මැදිහත්වීම

කේ. චාමරි කුමාරි ද තාබ්‍රෙව්
ස්වාධීන පර්යේෂිකා
chamarithabrewnisd@gmail.com

**සාර සංක්ෂේපය**

තිරසාර සංවර්ධන ඉලක්කයන්හි සිවුවන ඉලක්කය වනුයේ පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම යන්න ය. නූතන ආධ්‍යාපනික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ උක්ත අරමුණ කොතෙක් දුරට සාක්ෂාත් වී ඇත් ද යන්න ගැටලුකාරි වේ. පාසල් ළමුන් මනෝ සමාජ ගැටලුවලින් පීඩාවට පත්වන අතර ඒවා විසඳීම සඳහා වෘත්තීය මැදිහත්වීමක් අවශ්‍ය වේ. වර්තමාන ශිෂ්‍ය ප්‍රජාවගේ මනෝ සමාජ ගැටලු අතරින් ඍජු ව ඉගෙනුම් ක්‍රියාවලියට බලපානු ලබන්නේ ඉගෙනුම ආශ්‍රිත ගැටලු ය. සාමාන්‍ය පෙළ සිසුන්ට ඇති ඉගෙනුම් ආශ්‍රිත ගැටලු හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන අතර සිසුන්ගේ ඉගෙනුම ආශ්‍රිත ගැටලු පාලනය හා නිරාකරණය කර ගැනීම සඳහා පාසලෙන් හා පවුලෙන් ලැබෙන දායකත්වය කෙසේ ද යන්නත්, සිසුන්ගේ ඉගෙනුම ආශ්‍රිත ගැටලු අවම කිරීම සඳහා උපදේශන මැදිහත්වීම කෙසේ සිදු විය යුතු ද යන්නත් සොයා බැලීම අධ්‍යයනයේ උප අරමුණු වේ. සහභාගි නො වන නියැදි ක්‍රමය යටතේ පරමාර්ථගත නියැදීම යටතේ සහභාගි නො වන නිරීක්ෂණ, ව්‍යුහගත නො වන සම්මුඛ සාකච්ඡා හා කේන්ද්‍රගත සමූහ සම්මුඛ සාකච්ඡා යොදා ගනිමින් ගුණාත්මක දත්ත රැස් කළ අතර ප්‍රමාණාත්මක දත්ත ප්‍රශ්නමාලාවක් ආශ්‍රයෙන් දත්ත රැස් කරන ලදි.

විභාගය සමත් වීමට හැකි ද, දෙමාපියන්ගේ බලාපොරොත්තු ඉෂ්ට කර දීමට හැකි ද, විභාගය ඉහළින් සමත්වීමට හැකි ද යන ඉගෙනුම් ගැටලු නිසාවෙන් සිසුන් භීතිකාමය තත්වයකින් පසුවන බව අනාවරණය විය. පාඩම් කිරීමේ දී ඇති වන ගැටලු විසඳා ගැනීමට නො හැකි වීම, විෂය කරුණු අමතක වීම, කාලය කළමනාකරණය කිරීමට නො හැකි වීම සිසුන් මුහුණ දෙන ඉගෙනුම ආශ්‍රිත සෙසු ගැටලු වශයෙන් හඳුනා ගත හැකි විය. උක්ත ඉගෙනුම් ගැටලු පාලනය කිරීමට හා නිරාකරණය කිරීම සඳහා වෘත්තීය මැදිහත්වීමක් අවශ්‍ය බව අධ්‍යයන නියැදි ගහණයේ බහුතරයකගේ අදහස වේ. උක්ත ඉගෙනුම් ආශ්‍රිත ගැටලු විසඳා ගැනීම සඳහා පාසලෙන් හා පවුලෙන් සාධනීය මැදිහත්වීමක් සිදු නො වන බව අධ්‍යයන දත්ත මඟින් අනාවරණය වේ. සිසුන්ගේ ඉගෙනුම ආශ්‍රිත ගැටලු අවම කිරීම සඳහා මනෝ උපදේශන මැදිහත්වීමක් සිදු වන්නේ නම් එය සිසුන්ගේ ආධ්‍යාපනික ක්‍රියාවලිය සාර්ථකවීමට හේතු වන බව අධ්‍යයන නියැදියේ 91%ක් පවසා ඇත. සරල සංයම අභ්‍යාස, අනුක්‍රමික විසංවේදනය, SQ5R ක්‍රමවේදය, අහේතුවාදී සිතුවිලි ඉවත් කිරීම සඳහා හේතුවාදී සිතුවිලි ගොඩනැඟීම, තර්ක කිරීම ආදී උපදේශන ක්‍රම ශිල්ප හරහා සිසුන්ගේ ඉගෙනුම් ගැටලු පාලනය හා නිරාකරණය කිරීමට හැකියාව පවතින බව අධ්‍යයන දත්ත මඟින් අනාවරණය වේ.

**ප්‍රමුඛ පද:** අධ්‍යාපනය, ඉගෙනුම, උපදේශනය, මැදිහත්වීම, ශිෂ්‍යයන්.

SSS13

# The use of directives by children and adults in a Sinhala-speaking household

Lawanya Abesooriya
BA (Hons)
University of Kelaniya
lawanya.abesooriya@gmail.com

Dr. Kaushalya Perera
Senior Lecturer
University of Kelaniya
kaushalya.@english.cmb.ac.lk

**Abstract**

Even though Sinhala is the major language in Sri Lanka, less research on the Sinhala language is evident in the areas of pragmatics and first language acquisition. Such research is, therefore, imperative at present given that the sociolinguistic context of Sri Lanka is fast changing. This study looks at the use of directives in Sinhala-speaking households. Specifically, directives are statements meant to produce action by another person. In Sinhala, the canonical directive form is the verb ending */nnə/* (e.g. *kəranna* ('do it') and *denna* ('give it')). We analysed directives in the speech of Sinhala-speaking children and adults in the context of family interactions, using recordings of five children of 2-4 years of age and their caretakers. The data shows that adults and children use varying degrees of directives; the two groups prefer different categories of directives as well. We note some overlaps with prior research on directives in general (Ervin-Tripp, 1976) and with Sinhala specifically (Fedricks, 2012), as we add two new categories to the prior classification. We also highlight the need for future research in both Sinhala and child-directed speech in Sri Lanka.

**Keywords**: Directives, Child directed speech, Sinhala, Politeness, First language acquisition, Sinhala pragmatics.

SSS14

# කාලිදාසගේ ඍතුසංහාරයේ සිංහල පද්‍යමය පරිවර්තන පිළිබඳ විමසුමක් (තෝරාගත් පරිවර්තන කෘති හයක් ඇසුරෙනි)


වැලිපිටියේ ඉන්ද්‍රානන්ද හිමි
කථිකාචාර්ය
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
windananda@busl.ac.lk

කේ.එම්.බී.එන්. කෝනාර
සහකාර පුස්තකාලයාධිපති
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
bnkonara@gmail.com



## සාර සංක්ෂේපය

කාලිදාසගේ කෘතියකැයි සැලකෙන ඍතුසංහාර ඛණ්ඩකාව්‍යය පිළිබඳ 19 වැනි සියවසේ අග භාගයේ සිට ම මෙ රට උගතුන්ගේ අවධානය යොමු වූ බව පෙනී යන්නේ ක්‍රි. ව 1887 දී වේරගම පුෂ්ඵබණ්ඩාර විසින් ඍතුසංහාරය සිංහලයට පරිවර්තනය කර තිබීමෙනි. මෙම ගද්‍ය පරිවර්තනයෙන් අනතුරුව සියවසක පමණ කාලසීමාවක් තුළ ඍතුසංහාරය මෙරට 'කවීන්ගේ' විශේෂ අවධානයට ලක් වූ බව පැහැදිලි වන්නේ ඒ වෙනුවෙන් විවිධ ශෛලීන්ට අයත් සිංහල පද්‍යමය පරිවර්තන කිහිපයක් ම පළ වී තිබෙන හෙයිනි. වේරගම පුෂ්ඵබණ්ඩාරගේ පරිවර්තනයෙන් පසු ඩී. එම්. සමරසිංහ විසින් 1931 දී ඍතුසංහාරයට පදානුපදික සිංහල පරිවර්තනයක් සිදු කර ඇත. ඍතුසංහාරයේ සිංහල පද්‍යමය පරිවර්තන හමුවන්නේ 1945 වර්ෂයෙන් පසු ව ය. 1945 1987 යන දශක පහකට ආසන්න කාලසීමාව තුළ ඍතුසංහාරයේ සිංහල පද්‍යමය පරිවර්තන හයක් පිළිබඳ තොරතුරු අනාවරණය කරගත හැකි අතර ඇතැම් විට තවත් අප්‍රකට පරිවර්තන කිහිපයක් ද පැවැතිය හැකි ය. සංස්කෘත කාව්‍ය ග්‍රන්ථයක් වෙනුවෙන් මෙ තරම් පද්‍යමය පරිවර්තන ප්‍රමාණයක් සිංහලලෙන් පළ කොට තිබීම මෑත කාලීන සිංහල පද්‍ය සාහිත්‍යයේත් පරිවර්තන සාහිත්‍යයේත් මෙ රට සංස්කෘත අධ්‍යයන ක්ෂේත්‍රයේත් සැලකිය යුතු ලක්ෂණයකි. ඊට හේතුව, සාමාන්‍යයෙන් පදානුපදික හෝ භාවාර්ථ පරිවර්තනයකට වඩා වෙනත් භාෂාවකින් රචිත කාව්‍ය සංග්‍රහයක් කාව්‍ය ස්වරූපයෙන් ම තවත් භාෂාවකට නැඟීම පරිවර්තන ක්‍රමවේදයේ දී අභියෝගාත්මක ක්‍රියාවක් වන හෙයිනි. අනෙක් අතට, වේරගම පුෂ්ඵබණ්ඩාරගේ හා ඩී. ඇම්. සමරසිංහගේ ඍතුසංහාර සිංහල ගද්‍ය පරිවර්තන කියවීමෙන් පසු ව එය මෙ රට ජනයා අතර ඉහළ ජනප්‍රියත්වයක් හිමි කර ගත් බව සිතිය හැක්කේ උක්ත පරිවර්තකයන් සයදෙනා අතරින් දෙදෙනෙකු ම එම කෘති දෙක පිළිබඳ සඳහන් කර තිබීමෙනි. එයින් පැහැදිලි වන්නේ ඍතුසංහාරයේ සාමාන්‍ය සිංහල ගද්‍ය පරිවර්තන කියවීමෙන් ප්‍රහර්ෂයට පත් සිංහල කවීන් සිය කාව්‍ය කෞශල්‍යය ද ප්‍රකට කරමින් ඍතුසංහාරයේ ජීවගුණයත් රසයත් තමන් අත්විඳි අයුරින් ම සංස්කෘත කාව්‍යයක් කියවා රසවිඳීමට අපහසු සිංහල පාඨකයා අතරට රැගෙන යාමට උත්සාහයක් ගත් බව යි. ඊට අමතර ව, සිංහල කවිය පිළිබඳ මෙ රට විශේෂ ප්‍රවණතා පෙන්නුම් කරන කාලසීමාවක බිහිව ඇති මෙමෙ පද්‍යමය පරිවර්තන ඒ අතර අප්‍රකට ව පැවැති තවත් සාම්ප්‍රදායක ලක්ෂණ පෙන්නුම් කරන බව පෙනේ. එසේ ම මෙ රට සිටි සංස්කෘත උගතුන් ජනප්‍රිය සංස්කෘත කාව්‍ය ග්‍රන්ථ සිංහල පාඨකයන් අතර තවදුරටත් ප්‍රකට කිරීමට ගත් උත්සාහයක ලක්ෂණ ද මෙයින් ප්‍රකට වේ.



**ප්‍රමුඛ පද** : ඍතුසංහාරය, පද්‍යමය සිංහල පරිවර්තන, පරිවර්තන ක්‍රමවේද හා අරමුණු, සිංහල කවිය.

SSS16

# මානව පුරුෂාර්ථ ගවේෂණය පිළිබඳ ව සාංදෘෂ්ටිකවාදයේ හා බෞද්ධ දර්ශනයේ එන සංකල්ප ඇසුරෙන් විමර්ශනයක්. (තෝරාගත් සාහිත්‍ය නිර්මාණවලට විශේෂ ව)

වගීෂානි ජයසූරිය
ශාස්ත්‍රවේදී (ගෞරව)
සිංහල අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
wageeshanilbj@gmail.com

**සාර සංක්ෂේපය**

දෙවන ලෝක යුද සමයෙන් පසු ව අපරදිග ලෝකයෙහි ප්‍රචලිත වූ සාංදෘෂ්ටිකවාදයේ සහ ක්‍රි. පූ. 6වන සියවසේ පමණ භාරතයේ පහළ වූ බෞද්ධ දර්ශනයේ එන ඇතැම් සංකල්පනා ඇසුරෙන් මානව ජීවිතයේ සිදුවීම් හා බැඳුණු ක්ෂණභංගුරතාව, අනිත්‍යතාව හා ස්වච්ඡන්දතාව යනාදි මානව පුරුෂාර්ථ පිළිබඳ ව තෝරාගත් සාහිත්‍ය නිර්මාණ ඇසුරෙන් විමසීම මෙම පර්යේෂණයේ අරමුණ වෙයි. මිනිසාට නිරන්තරයෙන් මුහුණ පෑමට සිදු වන අනේකවිධ අවස්ථා හා සිදුවීම්වල දී යථාවබෝධයෙන් යුතු ව ක්‍රියා කරන්නේ මෙම ක්ෂණභංගුරතාව හා අනිත්‍යතාව පිළිබඳ ව මනා වැටහීමක් ඇති කල්හි පමණි. එ බැවින් මෙ කරුණ අරභයා සාංදෘෂ්ටිකවාදයේ හා බෞද්ධ දර්ශනයේ ගැබ් වී ඇති අදහස් සාහිත්‍යයික නිර්මාණ ඔස්සේ අවලෝකනය කෙරී ඇති ආකාරය මෙහි දී ගවේෂණය කෙරෙයි. ඒ සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය උපයුක්ත අතර, පඨිත විශ්ලේෂණය ඔස්සේ පර්යේෂණ තොරතුරු අනාවරණය කර ගන්නා ලදි. විශ්ව සම්භාවනාවට පාත්‍ර වූ පිටස්තරයා කෙටි නවකතාව, වික්‍රමසිංහගේ විරාගය නවකතාව, ජාතක කතා, බෞද්ධ සූත්‍ර ධර්ම හා ශාස්ත්‍රීය ග්‍රන්ථ ද මෙහි දී මූලාශ්‍රය විය. මෙම අධ්‍යයනයේ දී පැහැදිලි වූයේ එකිනෙකට වෙනස් දාර්ශනික ප්‍රවේශයන් වූ සාංදෘෂ්ටිකවාදය හා බෞද්ධ දර්ශනය අනිත්‍යතාව, ක්ෂණභංගුරතාව, ස්වච්ඡන්දතාව හා පුද්ගලත්වය වැනි මානව ජීවිතයේ විවිධ ගුණාංගයන් පිළිබඳ ව, එකිනෙකට අනන්‍ය වූ මානයන්ගෙන් සාකච්ඡාවට බඳුන් කරන බව යි. එහි දී ඇතැම් සංකල්ප අතර සාම්‍යයක් ද දක්නට හැකි අතර, අවසාන පරමාර්ථය වශයෙන් මෙකී දාර්ශනික ප්‍රවේශයන් එකිනෙකට වෙනස් ආස්ථානයන් දරන බව ද පසක් වෙයි.

**ප්‍රමුඛ පද:** ජාතක කතා, පිටස්තරයා, බෞද්ධ දර්ශනය, විරාගය, සාංදෘෂ්ටිකවාදය.

SSS17

# Influence of gender on perception of landscape: a study of Colombo Viharamahadivi park

M.D.B. Perera
Faculty of Architecture
University of Moratuwa
deemathi.perera@gmail.com

**Abstract**

This study investigates the influence of gender on perception of landscape, with reference to Viharamahadevi Park in Colombo. The exiting literature suggests that there is a difference in perception of landscapes in reference to the user. In Asian countries such as Sri Lanka, a clear difference in perception of landscapes could be expected due to strong but varying socio cultural influences on different genders. Perception theories were identified through a literature survey. The emphasis were paid to the visual perception theories linked to experiencing landscapes.

The presence of different visual landscape characters at Viharamahadevi Park lead to the selection of it as the case study. A questioner was used to collect data from general public who patronized the park regularly, and the second year undergraduate students following the degree of Landscape Architecture at University of Moratuwa.

The analysis of data indicates that there is a no clear difference of preference in landscapes between the female and male gender with the public users. The male gender of public who patronize the park has intention to interact with it, such as spend their time with nature or for relaxation. However the majority of the females of public use the park unintentionally due to social requirements. There is a significant difference in order of perception according to the gender among the second year undergraduate students.

Landscape students have comparatively good sense on landscape than the general public. The knowledge supports them to have a clear visual perception, which coupled with gender orientations make a strong difference with male and female students. But due to the lack of information and the insufficient clear sense, general users do not emphasis a clear gender differences in regard to landscape perception in local context.

**Keywords** : Landscape, Visual perception, Gender.

SSS18

# ශ්‍රී ලංකාවේ කවට පුවත්පත්හි භාෂා භාවිතය සහ දේශපාලන සන්නිවේදනය

එච්. ඒ. ගයාන් මධුශංඛ
ජන සන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
gayan123gayan@gmail.com

**සාර සංක්ෂේපය**

පුවත්පත් මාධ්‍යයේ දී කවට පුවත්පත්වලට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. හාස්‍ය උත්පාදනය හරහා සිදු කරන සන්නිවේදනය මෙම පුවත්පත්හි ඇති විශේෂත්වය වන අතර, ජනතාවගේ ජනමතය හැසිරවීම කෙරෙහි බලපෑම්කාරී සාධකයක් වශයෙන් ද කවට පුවත්පත් හඳුන්වාදිය හැකි ය. දේශපාලන විවේචන සඳහා උපහාසය මාධ්‍යයේ දී භාවිත වේ. දේශපාලන විවේචන සඳහා කවට පුවත්පත්හි භාෂා භාවිතය කවරේ ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ. වාර්තාකරණයේ දී කවට පුවත්පත් ජනතාව කෙරෙහි දේශපාලනික පෙළඹවීමක් ඇති කිරීම සඳහා ලේඛන ආකෘති, භාෂා ශෛලීන්, සහ රූප භාෂාව භාවිත කර ඇති ආකාරය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය.

කවට කතිකයා (1872), කවට රජා (1901), දැනුමැති කවටයා (1895), කවට මුත්තා (1942) සහ ගජ මෑන් යන කවට පුවත්පත්වලට විශේෂිත ව මෙම පර්යේෂණය සිදුකර ඇත. පර්යේෂණ ක්‍රමවේදය ලෙස අන්තර්ගත විශ්ලේෂණය භාවිත කරන ලදී. මෙහි දී සවිස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය යටතේ දත්ත විශ්ලේෂණය කර ඇත.

අතීතයේ කවට පුවත්පත්හි භාවිත ලේඛන ආකෘති ලෙස කවි, දෙබස්, කතාන්දර, විරිදු, කෙටි විස්තර සහ පාඨක අදහස් දැක්වීම් භාවිත කර ඇත. සන්දේශය නිර්මාණශීලී ව සකස්වීම කෙරෙහි විවිධ ලේඛන ආකෘති හේතු වී ඇත. කාලීන සිදුවීම් විවේචනය කිරීම සඳහා හාස්‍යෝත්පාදක ව සන්දේශ නිර්මාණය කිරීම හේතුවෙන් අපේක්ෂිත පණිවුඩය බලපෑම් සහගත ව සමාජගත කිරීමට හේතු වී ඇත. එ මෙන් ම දේශපාලන චරිත සහ සිද්ධි උපහාසයට ලක්කර ඇත. වර්තමාන කවට පුවත්පත්හි අන්තර්ගතය අතීත කවට පුවතපත්හි අන්තර්ගතය හා සැසඳීමේ දී රූප භාෂාව ලේඛනය අතික්‍රමණය කර ඇත. ලේඛනයට රූපය එකතුවීම නිර්මාණාත්මක බව වර්ධනය වීමට හේතු වී ඇත. දේශපාලන විවේචනය සඳහා හාස්‍ය උත්පාදක ලේඛන ශෛලිය උචිත මාධ්‍යයක් වේ. මෙම භාෂා රටාවන් වර්තමාන පුවත්පත් තුළ යෝග්‍ය පරිදි භාවිත කිරීමෙන් පාඨකයා ව පුවත්පතට ආකර්ෂණය කර ගැනීමට හැකියාවක් ලැබේ.

**මුඛ පද:** කවට පුවත්පත, ජනමතය, දේශපාලන සන්නිවේදනය, ලේඛන ආකෘති.

SSS19

# Translating selected chapters of the "Language" of Leonard Bloomfield into Sinhalese with a critical essay on challenges occurred when translating.

K. M. Nayomi Madhupani
Assistant Lecturer
Department of Sinhalese
University of Peradeniya
nayomimadhupani317@gmail.com

**Abstract**

The study of language and linguistics is one of the most important fields of study today and many linguists in the world have written various books on it. Among them, the "Language" of Leonard Bloomfield is a standard and classical work which covers many areas of language and linguistics field. There seems a less tendency of using sources which are published in English and other languages among the students who study the subject in Sinhala medium. Yet studying these books is very effective for them due to the shortage of sources published in Sinhala language on this field of study. This study therefore attempts to impart the knowledge to Sinhala medium students by translating selected important chapters of the "Language" of Bloomfield into Sinhalese, and to reveal problems and challenges occurred when translating and the ways to solve them, by a critical essay. This essay would be useful for the beginners of the Study of Translating, under the sub category of non-fictional translating. To achieve these objectives, an introduction is provided about the book and author, the study of language and linguistics, translating and non-fictional translations under the first chapter. The second chapter is the critical essay and the third chapter is translation work including the preface and selected chapters of the book. In the fourth chapter, a list of technical terms and the index are provided. Qualitative method, data analysis and theories of scholars in translation field are used as method and methodology. The study reveals that the problems and challenges occur when translating a classical non-fictional book can be solved by using and creating applicable technical terms, translating theoretical conceptions clearly and using comprehensible examples in target language in place of examples in source language.

**Keywords:** Bloomfield, Classical and non-fictional, Theoretical Conceptions, Critical Essay.

SSS20

# ශාන්තිකර්ම සාහිත්‍යයෙහි නිරූපිත හස්මාසුර පුවත

ආචාර්ය හිමාලිකා රණවීර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
භාෂා සංස්කෘතික හා ප්‍රාසාංගික අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
himalika@sjp.ac.lk

## සාර සංක්ෂේපය

දෙවියන් හෝ යක්ෂයින්ගේ උපත සම්බන්ධ ව ගුඪත්වයක් ආරෝපණය කරමින් මිනිසුන් තුළ ගෞරව සම්ප්‍රයුක්ත බියක් ඇති කරනු වස් ප්‍රබන්ධ කරන ලද පුරාවෘත්ත හා මිතකතා බොහොමයක් ශාන්තිකර්ම හා සම්බන්ධව පවතී. හින්දු පුරාණ සාහිත්‍යයට අයත් හස්මාසුර පුවත ද එ ලෙස දේශීය ශාන්තිකර්මයන්හි දේව හා යක්ෂ උපත් කථාවලට ප්‍රස්තුත වූ හින්දු මිත කථාවකි. හින්දු ත්‍රිමූර්තිගත දෙවි කෙනකු සේ සැලකෙන ඊශ්වර හෙවත් ශිව දෙවියන් වෙතින් අන්‍යයන් දවා අළු බවට පත් කළ හැකි බලවත් මන්ත්‍රයක් ලබා, එකී මන්ත්‍රය නිසා ම විනාශයට පත් වූ අයකු සේ හස්මාසුරයා හින්දු පුරාණ ග්‍රන්ථවල දැක්වේ (Mani,1975). හස්මාසුර පුවත දේශීය ශාන්තිකර්ම හා සම්බන්ධ වීමේ දී ඇති වූ වෙනස්කම් හා ඊට පසුබිම් වූ සංස්කෘතික ලක්ෂණ හඳුනා ගැනීම මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ විය. හින්දු ආගමික මිත කථාවක් ශාන්ති කර්ම හා බද්ධ කිරීමේ දී ඊට දේශීයත්වයක් ආරෝපණය කර ඇත් ද ? යන්න පර්යේෂණ ගැටලුව විය. මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමයක් ලෙස ඉදිරිපත් කැරෙන අතර, උද්ගාමී තර්කනය යොදා ගනිමින් නිගමනයන්ට එළඹිණි. මූලික වශයෙන් ම ශාන්තිකර්ම සාහිත්‍යය පදනම් ව ගොඩනැගෙන සංකල්පයක් බැවින්, දත්ත රැස් කිරීමේ දී පුස්තකාලය අධ්‍යයනය යොදා ගැනිණි. එහි දී හින්දු පුරාණ සාහිත්‍යය හා දේශීය ශාන්තිකර්ම යන විෂය ක්ෂේත්‍රයනට අයත් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය තුලනාත්මක ව අධ්‍යයනය කරන ලදී. චූල සම්ප්‍රදාය නියෝජනය කැරෙන ශාන්තිකර්ම හින්දු ආගමික සාහිත්‍යයෙන් පෝෂණය වී ඇති ආකාරය හස්මාසුර පුවතින් හෙළි වේ. සිංහල ගැමි ආගමෙහි පුද ලබන යකුන් හා දෙවිවරුන් කිහිපදෙනෙකුගේ ම උපත් කථා මේ හා බැඳී පවතී. හින්දු පුරාණ සාහිත්‍යයෙහි අයියනායක හා ස්කන්ධකුමාර දෙවි උපත් කථා හස්මාසුර පුවත හා සම්බන්ධ වේ. එහෙත් ගැමි කලාකරුවා මහසෝනා, කළු යකා, අයියනායක, කඩවර හා දෙවොල් ගිනි කුරුම්බරයන් යන ප්‍රාදේශීය දෙවිවරුන් හා යක්ෂයින්ගේ ප්‍රභවය හස්මාසුර පුවත හා සම්බන්ධ කළේ ය. එසේ ම වෛෂ්ණව හා ශෛව යන හින්දු නිකාය ද්වයෙන් වෛෂ්ණවවාදය සිංහල ගැමි බෞද්ධයා විසින් පිළිගනිමින් ඊශ්වර භක්තිය හීන කිරීමට උත්සාහ දරන ලද බව ද හස්මාසුර පුවතින් හෙළි වේ. ශාන්තිකර්ම ඇදුරා ස්වකීය පුද පූජා නිර්මාණය කිරීමේ දී ඊට හින්දු ආගමික සාහිත්‍යය එක් කළේ වුව ද, සැමවිට ම දේශීයත්වයක් ආරෝපණය කිරීමට උත්සාහ කළ බව අධ්‍යයනයෙන් අනාවරණය විය.

**ප්‍රමුඛ පද :** ඊශ්වර, උපත් කථා, චූල සම්ප්‍රදාය, මිතකතා, විෂ්ණු.

SSS22

# ලෙස්ටර් ජේම්ස් පීරිස් සහ සත්‍යජිත් රේගේ සිනමා කෘති අතර තුලනාත්මක අධ්‍යයනයක්

බී. ජේ. එන්. එච්. බස්නායක
කනිෂ්ඨ අධිශිෂ්‍යත්වලාභී
සිංහල අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
nipunaheminda90@gmail.com

**සාර සංක්ෂේපය**

ලංකාවේ පළමු සිනමා කෘතිය වශයෙන් වියත් සම්භාවනාවට පාත්‍ර වන්නේ දොන් එඩ්වඩ් විසින් අධ්‍යක්ෂණය කළ'පලිගැනීම' නමැති සිනමා කෘතිය යි. එයින් පසු ව නවසිය හතළිස් හතේ තිරගත වුණු 'කඩවුණු පොරොන්දුව' මෙ රට සිනමාවේ දිශානතිය වෙනස් මගකට ප්‍රවිෂ්ට කරවීමට සමත් වූයේ එහි හඬ අන්තර්ගත වීම හේතුවෙනි. එයින් අනතුරුව ලාංකේය සිනමාවේ මෙබඳු විප්ලවීය තත්වයක් ඇති වූයේ 1956 ලෙස්ටර් පීරිස් විසින් 'රේඛාව' තිරගත කිරීම හේතුවෙනි. එය මුළුමනින් ම තිරගත ගතකොට තිබුණේ එළිමහනේ ය. ඉන්දීය සිනමාවේ සාම්ප්‍රදායික ක්‍රමවේද වෙනස් මාවතකට ප්‍රවිෂ්ට කරවීමට වෙර දැරූවේ සත්‍යජිත් රේ විසිනි. ඔහුගේ සිනමාවේ ගැබ් ව තිබුණේ වාණිජමය පරමාර්ථයකට වඩා වෙනස් අර්ථයකි. 1955 ඔහු විසින් පළමු වරට අධ්‍යක්ෂණය කළ'පතේර් පංචලී' එය සනාථ කරන්නකි. මොවුන් දෙදෙනාගේ සිනමා කෘති පිළිබඳ ව විමසා බැලීමේ දී අපට ඇති වූ ගැටලුව නම් අධ්‍යක්ෂණයේ දී අන්‍යෝන්‍ය වශයෙන් සහසම්බන්ධයක් පවතින්නේ ද යන්න යි. එනම් ලෙස්ටර් සහ සත්‍යජිත් රේගේ සිනමාව අතුරෙහි යම් සම්බන්ධයක් පවතින්නේ ද යන්න යි. මෙහි අරමුණ වූයේ තත් කාරණය පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක නිරත වීම යි. මෙම පර්යේෂණයෙහි උපයුක්ත ප්‍රාථමික මූලාශ්‍රය වූයේ සිනමා කෘති පරිශීලනය යි. එ මෙන් ම ලෙස්ටර්ගේ සහ සත්‍යජිත්ගේ සිනමා කෘති පිළිබඳ ව ලියැවුණු පොත්පත් ද මෙහි ලා පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් යොදා ගැනිණ. එ මෙන් ම අන්තර්ජාලය ද බෙහෙවින් ඉහවල් විය. තත් ක්‍රමවේද උපයෝගී කොටගෙන සිදු කළ පර්යේෂණයෙහි ප්‍රතිඵල වශයෙන් මොවුන් දෙදෙනාගේ ම සමාජයීය, ආධ්‍යාපනික, වෘත්තීයම ය වශයෙන් සාධක කිහිපයක් ම රටවලට අනුකූල ව යම්බඳු සාම්‍යත්වයක් උසුලන බව අනාවරණය විය. එම සාධක සිනමා කෘති අධ්‍යක්ෂණයේ දී කිසියම් බලපෑමක් සිදු කොට ඇති බව කිව හැකි ය. එමෙන් ම මොවුන් දෙදෙනා සිනමාව පිළිබඳ ව යම් යම් අධ්‍යයන සිදු කිරීමේ දී පවත්වාගෙන ඇති අන්තර් සබඳතාව ද මේ සඳහා හේතු වී තිබේ. එ මෙන් ම වෙනත් කලා මාධ්‍ය සිනමාවට පරිවර්තනය කිරීමේ උනන්දුවක් දක්නා ලැබෙන බව ද මෙහි ලා සඳහන් කළ හැකි ය.

**ප්‍රමුඛ පද :** චිත්‍රපටය, නවකතාව, ලෙස්ටර්, සත්‍යජිත්, සිනමාව.

SSS25

# a study of the act of truth (*Saccakiriya*) utilized in Sinhala *Jātaka* stories as a specific writing technique

Ven. Ekala Dhammanisanthi
Lecturer (Temporary)
Department of Pali and Buddhist Studies
Faculty of Arts, University of Peradeniya
dhammansianthithero@gmail.com

**Abstract**

The present study literary and ethically examines the act of truth utilized in Jātaka stories as a special writing technique. There are many stories, which incorporate the concept of the act of truth included in the Sinhala *Jātaka* text. Among these, many stories, *Suruci, Kaṭṭahāri, Suppāraka, Andhabhūta, Mahāmora, Khaṇḍahāla, Mahānārada Kassapa, Jayaḍḍiya, Candakumāra, Sambūlā, Sutasoma* and *Sāma Jātaka*-s are very popular. The act of truth has been emphasize the importance human qualities, no external force can do harm and the favorable results of good behavior. The act of truth has been literally represented in *Jātaka* stories based on incidents such as raining, fire fighting and prevention from poison, recover from illness and changing natural phenomena. Sinhala *Jātaka* story writers have included relate to the act of truth as a technique in writing to improve the belief system and human qualities of readers the act of truth has been depicted not only by the character of *Bodhisatta* but also by actual and animal characters.

**Keywords**: Act of truth (*Sattyakriyā*), *Jātaka,* Literature, Writing technique

SSS26

# ශු. බයිබලය ඔස්සේ ප්‍රකට වන සංඥාර්ථවේදය
## (ලූක් සුවිශේෂයට විශේෂිත වූ)

මෙත්ෂිකා කාරියවසම්
ජන සන්නිවේදන අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය
kmethzika93@gmail.com

**සාර සංක්ෂේපය**

වාග්විද්‍යාව, භාෂාව සහ සන්නිවේදනය හා සෘජු ව බැඳෙන විෂය ක්ෂේත්‍රයක් ලෙස සංඥාර්ථවේදය හඳුනාගත හැකි ය. ශුද්ධ වූ බයිබලය පාදක කොටගෙන සිදු කරනු ලබන මෙම අධ්‍යයනයේ දී පර්යේෂණයට බඳුන් කිරීමට නියමිත වනුයේ ශුද්ධ වූ බයිබලයේ උපයුක්ත සංඥාර්ථවේදය පිළිබඳ ව ය.

බයිබලය තුළ අන්තර්ගත සංඥාර්ථවේදය පිළිබඳ ව මෙම අධ්‍යයනයේ දී ගැඹුරින් විශ්ලේෂණයට බඳුන් කරයි. සෑම සන්නිවේදන කෘත්‍යයක දී ම සංඥාර්ථවේදය ආයාසයෙන් හෝ නිරායාසයෙන් සම්බන්ධ වෙයි. සංඥාර්ථවේදය සමඟ පවතින මානව සම්බන්ධතා මෙන් ම අනන්‍ය සංස්කෘතියේ ගතිකතාවන් ද මෙම අධ්‍යයනයෙන් විවරණය කිරීමට අපේක්ෂිත ය. සංඥාර්ථවේදය ඉතිහාසය පිළිබඳ නිශ්චිත අර්ථකථනයක් ලබාදිය නො හැකි වන්නේ සන්නිවේදනයේ මූලාරම්භක සිට ම සංඥාර්ථවේදය පිළිබඳ අදහස් මතු වන හෙයිනි. සංඥාර්ථවේදය ඉතිහාසය සම්බන්ධ බොහෝ මතවාද පවතී. ඒ අතර මොරිස්ගේ අදහස වැදගත් වෙයි. ''සංඥාර්ථවේදයේ ඉතිහාසය තව දුරටත් ලිවීමට ඉඩ ඇත.

emiotics යන්න ග්‍රීක වදනක් වන "Semein" යන්නෙන් බිඳී එන්නකි. එහි අර්ථය සංඥා (sign) යන්න යි සංඥාර්ථ විද්‍යාව (semiology යන්නෙහි අර්ථය සංඥාර්ථ පිළිබඳ වන විද්‍යාව යන්න යි. එනම් සංඥා පද්ධතීන් ද අර්ථ නිර්මාණයේ දී හා ප්‍රතිනිර්මාණයේ දී ඒවායෙහි කාර්යභාරය විග්‍රහ කරනු ලබන විද්‍යාව යන්න යි. සංඥාර්ථ විද්‍යාවේ දී සියලු ම සමාජ ජීවිතයට සමාජ පිළිවෙත්හි සෑම අංශයක් ම භාෂාවේ මැදිහත්වීම මත සිදුවන බව සංඥාර්ථවේදීන්ගේ අදහස යි.

සංඥාර්ථ විද්‍යාව ඉතා ගැඹුරු විෂය පරාසයකට උරුමකම් කියයි. එනම් සංඥාර්ථ විද්‍යාඥයින් ප්‍රකාශ කරන්නේ සංඥාවකට නියත අර්ථයක් නොමැති බව යි. එම සංඥාව ලබාගන්නා නිශ්චිත පාඨක කණ්ඩායමේ සංජානනය හා සමාජ සන්දර්භය අනුව බලපැවැත්වෙන බව යි. එනම් විවිධ සමාජ කණ්ඩායම් විවිධ චින්තන රටාවන් සේ ම විවිධ පාරිසරික තත්වයන් යටතේ ජීවත් වෙයි.

ශු. බයිබලය ඔස්සේ විද්‍යමාන වන සංඥාර්ථවේ දී ලක්ෂණ මොනවා ද ? යන පර්යේෂණ ගැටලුව පදනම් කොට ගෙන මෙම පර්යේෂණය මෙහෙයවිණි. ශු. බයිබලයේ නව ගිවිසුම තුළ අන්තර්ගත සංඥාර්ථවේ දී ලක්ෂණ ජුදා සංස්කෘතික ලක්ෂණ විද්‍යමාන කරයි යන උපන්‍යාසය මත පිහිටා මෙම පර්යේෂණ සිදු කරන ලදී. ශු. බයිබලය ඔස්සේ විද්‍යමාන වන සංඥාර්ථවේදී ලක්ෂණ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ යි.

**ප්‍රමුඛ පද :** භාෂාව, ශු. බයිබලය, සංස්කෘතික, සන්නිවේදනය, සංඥාර්ථවේදය.

SSS27

# සූස්ති සමාජීය වාක්කෝෂය: (මංජුල වෙඩිවර්ධනගේ 'දූස්ටකමේ සවුන්දර්ය සහ රත්මලානේ තවත් කතා' කෙටිකතා සංග්‍රහය ආශ්‍රයෙන් කෙරෙන අධ්‍යයනයක්)

කිරිමැටියාවේ සුගුණධම්ම හිමි
සහකාර කථිකාචාර්ය
සිංහල අධ්‍යයනාංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
sinhalasuguna@gmail.com

## සාර සංක්ෂේපය

මනුෂ්‍යාන්තර අදහස්, සිතුම් පැතුම් ප්‍රකාශනය ඇතුළු අන්තර් මානව සන්නිවේදන ක්‍රියාවලිය උදෙසා මනුෂ්‍යයා විසින් ම නිර්මාණය කර ගන්නා ලද සංකීර්ණ සංස්කෘතික උපකරණය භාෂාව වශයෙන් සරල ව ම හඳුනාගත හැකි ය. භාෂාව පිළිබඳ අධ්‍යයන ක්‍රි.පූ. යුගයේ සිට සිදූ වූ බවත් එහි දී භාෂාවේ භාවිතය පිළිබඳ රීත්‍යනුසාරී විග්‍රහයන් පමණක් ඉදිරිපත් ව ඇති ආකාරය ද දූකගත හැකි ය. එහෙත් 19වන සියවසේ පමණ සිට භාෂාව විද්‍යාත්මක න්‍යාය ඔස්සේ අධ්‍යයනය කිරීමත් සමඟ වාග්විද්‍යාව නම් විෂය ක්ෂේත්‍රයක් භාෂාධ්‍යයන තුළ පහළ විය. භාෂාවක් සමාජයක සාමාජිකයන්ට අදාළ වන සේ විග්‍රහ කර බැලීම නූතන වාග්විද්‍යාව යටතේ එන සමාජ වාග්විද්‍යාවෙන් සිදු කෙරේ. සමාජ වාග්විද්‍යාවේ දී උපභාෂාවේදයට ලැබෙන්නේ වැදගත් ස්ථානයකි. භාෂා සමාජයක පවත්නා භාෂාමය විවිධතා උපභාෂාවේදයේ දී සාකච්ඡාවට ලක් කෙරේ. කිසියම් භාෂාවක ප්‍රාදේශීය, සමාජීය, පරිමිත සහ ප්‍රාස්තාවික වශයෙන් ව්‍යවහාරීය විවිධතා හඳුනාගත හැකි ය. උපභාෂාවක් සම්මත ප්‍රධාන භාෂාවෙන් වෙනස් වන්නේ උච්චාරණය, ව්‍යාකරණය හා වාක්කෝෂය යන අංශත්‍රයෙනි. සමාජයක පවත්නා විවිධ භේද්‍යතා හේතු කොටගෙන උක්ත අංශයන්හි විවිධතා උත්පාදානය වීම අධ්‍යයනය කිරීම සමාජීය උපභාෂා යටතේ සිදු කෙරේ. සමාජීය උපභාෂාහි වැඩියෙන් ම විවිධතා ඇති වන්නේ වාක්කෝෂමය අංශයෙහි ය. ඒ ඒ ප්‍රස්තාවලට පමණක් සීමා වන සාංස්ථිතික ලක්ෂණ පද්ධතිය ප්‍රාස්තාවික උපභාෂා යනුවෙන් හඳුනාගත හැකි ය. සූස්ති සමාජය හෙවත් කංසා සමාජය ව්‍යවහාර කරන භාෂාව ද ප්‍රාස්තාවික උපභාෂා ගණයට ගැනේ. මත්වීම වීම සඳහා භාවිත කරන විවිධ මත් ද්‍රව්‍යයන් සේ ම කණ්ඩායම් ද ඇතිමුත් සූස්ති හෙවත් කංසා සමාජයේ තරම් තදීය වාක්කෝෂයක් අන්‍ය මත් කණ්ඩායම් තුළ දූකිය නොහේ. සූස්ති යන ව්‍යවහාරය ගංජා හෙවත් කංසා හැඳින්වීමට අලුතින් භාෂාවට පැමිණි වචනයකි. මංජුල වෙඩිවර්ධනගේ බොහෝ නිර්මාණවල සූස්ති යන්න ව්‍යවහාර වේ. ඔහු රචනා කරන ලද 'දූස්ටකමේ සවුන්දර්ය සහ රත්මලානේ තවත් කතා' කෙටිකතා සංග්‍රහයෙහි සූස්ති සමාජීය ඇතැම් වචන භාවිත කර ඇති ආකාරය හඳුනාගත හැකි ය. වෙඩිවර්ධන වාක්කෝෂය පමණක් නොව ඇතැම් රූඪී පවා සූස්ති සමාජය ඇසුරින් ගොඩ නඟා ඇත. ඇළක් ළඟ ඇලවෙනවට වඩා විලක් අසබඩ සැතපෙන එක කොයි තරම් භාග්‍යයක් ද, කංසා මූකළානකට ගිනි ඇවිලුණු කලෙක මෙන් සන්සුන්ය වැනි සූස්ති සමාජීය රූඪී ද, සූස්ති මත, ජොයින්ට් එක, මලක් අදිනවා, මිටි ජීවිතේ, කංසා මතේ, රන්පතක්, උෟ නස් වෙන්න ගහන බවක් ආදි සූස්ති සමාජීය වචන ද බොහෝ ලෙස භාවිත කොට ඇත. වෙඩිවර්ධනගේ මේ කතාවල බොහෝ විට ඇත්තේ සූස්ති සමාජයකි. ඔවුන් ව්‍යවහාර කරන්නේ පොදු ව්‍යවහාරයෙන් විතැන් වූ ප්‍රාස්තවික ව්‍යවහාරයකි.

**ප්‍රමුඛ පද:** උපභාෂාවේදය, සූස්ති සමාජය, වාක්කෝෂය.

# A corpus-based morphological analysis of Sinhala non-finite verbs

W.S. Nimasha Dilshani
Dep artment of Computer science and Engineering
Universtiy of Moratuwa
nimashadilshani@ðe.mrt.ac.lk.com

W.S. Nimasha Dilshani
Dep artment of Computer science and Engineering
Universtiy of Moratuwa
gihan@uom.lk

**Abstract**

Sinhala is a morphologically rich, highly inflected language. It is also considered low-resourced. This research is a major step in the development of a morphological analyzer and synthesizer for the Sinhala language which has been a long-felt need. A set of rules to construct all conjugational forms of Sinhala non-finite verbs was developed based on a corpus which includes text from Sinhala official letters and newspapers. A lexicon of 18,000,000 tokens extracted from the corpus was used in the analysis. The research identified 11 categories specific to non-finite verbs (in addition to the general verb categories). 31 conjugated forms of non-finite verbs and the category of each such form were identified. 23 Sinhala non-finite verbal phrases and their constituent verb forms and coordinating conjunctions were also identified.

Four main verb classes and 19 subclasses were identified and set of rules, based on phonological principles, for constructing and analyzing Sinhala non-finite verbs were identified and expressed in a form suitable to be used in a computer-based system.

**Keywords:** Morphology, Sinhala language, Corpus linguistics, Non-finite verbs, Morphological rules

SSS30

# සිවිල් සමාජයේ දෘෂ්ටිවාදී අවකාශය තුළ වාර්ගික ආතතිය (Ethnic tension) කෙරෙහි ශ්‍රී ලංකාවේ සිංහල සිනමාවේ රූප වියමනෙහි (Image Texting) බලපෑම

ඌෂා අරුණි ප්‍රියංගා වෙල්හේනගේ
බාහිර කථිකාචාර්ය
ශ්‍රී ලංකා ජනමාධ්‍ය අධ්‍යාපන ආයතනය
ushaaruni2@gmail.com

**සාර සංක්ෂේපය**

ප්‍රජාතන්ත්‍රවාදී රටක, සමාජයක මහජන පරිමණ්ඩලය (Public sphere) සක්‍රීය වීම කෙරෙහි තොරතුරු ප්‍රවාහය දියුණු මට්ටමක පැවතිය යුතු ය. පුරවැසියන් සක්‍රීය ව මහජන පරිමණ්ඩලය තුළ තම දෘෂ්ටිවාදය සකස් කර ගැනීමෙහි ලා තොරතුරු ප්‍රමාණවත් ව තිබීම හා සාකච්ඡා කිරීම අවශ්‍ය වේ. ජනමාධ්‍ය, සාහිත්‍ය හා කලාව, තොරතුරු ප්‍රවාහය සඳහා පහසුකම් සපයන්නන් ලෙස නිරතුරුව ම ක්‍රියාකරනු ලැබේ. එහි දී සිනමා මාධ්‍යය අනෙකුත් කලාවන්ට වඩා සුවිශේෂී වේ. එනම් අනෙකුත් කලාවන්ට සුවිශේෂී ව දෘෂ්ටිවාදී වාහකයකුගේ භූමිකාව නිරූපණය කිරීමට සිනමාව සතු ව ඇති ශක්‍යතාව යි. කෙටිකතාව, කවිය, නවකතාව යන සාහිත්‍යාංගයන් වචන, ඡේද, පරිච්ඡේද වශයෙන් වියමන් වන අතර කියවීම හෝ සවන්දීම මඟින් කෙනෙකු එහි වියමන් පාඨනය කරනු ලැබේ. සිනමාව වියනු ලබන්නේ රූප, රූප මාලා, සංසිද්ධීන් සංස්කරණය කරනු ලබන සෙලියුලොයිඩ් පටයක වේ. පුළුල් තිරය ඉදිරියේ "තනිවී" අදාළ පඨනය සිදු කළ යුතු ය. මෙහි "තනිවී" යන්නෙන් දක්වන ලද්දේ අඳුරු සිනමාශාලාවක සිනමාපටය අමතන්නේ අඳුරේ තනි වන සියල්ලන්ට ම තනි තනි ව ම නිසාවෙනි. සිනමාවේ විශේෂත්වය වන්නේ එම තනි වීම තුළ සිදු කරනු ලබන දෘෂ්ටිවාදීමය බලපෑම යි.

පර්යේෂණයේ අරමුණු දෙකක් කෙරෙහි පර්යේෂකයාගේ අවධානය යොමු විය. මූලික ව, ශ්‍රී ලංකාවේ සිංහල චිත්‍රපට සිවිල් සමාජයේ දෘෂ්ටිවාදයන් හැඩගැස්වීම කෙරෙහි බලපාන ආකාරය හඳුනාගැනීම හා දෙවනු ව ශ්‍රී ලංකාවේ සිංහල සිනමා ආඛ්‍යානයන්හි ස්වභාවය හඳුනාගැනීම යන්න යි.

2009 වසරෙන් පසු නිෂ්පාදනය වූ සිංහල චිත්‍රපට 18ක් තෝරාගනිමින්, සිවිල් සමාජ සාමාජිකයින් සමඟ සම්මුඛ සාකච්ඡා හා ඔවුන්ගේ විචාර විමසමින් අන්තර්ගත විමර්ශනයක් ගුණාත්මක ව සිදුකරන ලදි. මෙහි දී සිවිල් සමාජ සමාජිකයින් තෝරාගන්නා ලද්දේ සමාජයේ දෘෂ්ටිවාදී ප්‍රවාහයට ඔවුන් ලබාදෙන ඍජු දායකත්වය හේතුවෙනි. එහි දී, පර්යේෂණ ප්‍රශ්න තුනක් කෙරෙහි අවධානය යොමු කරන ලදි. ශ්‍රී ලංකාවේ සිංහල සිනමාවෙහි විවිධ ජාතීන් හා ආගම් නියෝජනය වන්නේ කෙසේ ද? එය නියෝජනය වන ආකාරය ජාතීන් අතර ගැටුම් තීව්‍ර කරන්නේ ද නැතහොත් ගැටුම් සමනය කරන්නේ ද ? හා විවිධ ජන වර්ග හා ආගමික අනන්‍යතාවන්ට අයත් සිවිල් සමාජ සාමාජිකයින් ඒවාට ප්‍රතිචාර දක්වන්නේ කෙසේ ද? යන්න යි.

පර්යේෂණ ප්‍රශ්න විමසීමේ දී උපන්‍යාසය තහවුරු විය. එනම් ශ්‍රී ලංකාවේ ජන වාර්ගික, ආගමික දෘෂ්ටිවාදී බෙදීම් නැවත තහවුරු කිරීමට හා වාර්ගික ආතතිය ඇති කිරීම කෙරෙහි සිංහල සිනමාවේ රූප වියමන ඉවහල් වී තිබේ යන්න යි.

**ප්‍රමුඛ පද** : දෘෂ්ටිවාදය, පශ්චාත් යුද සිනමාව, වාර්ගික ආතතිය , සිවිල් සමාජය.

SSS31

# ශ්‍රී ලාංකික දෙමළ වතු කම්කරු ජනයාගේ ද්වාරකර්ම පිළිබඳ සමාජ මානව විද්‍යාත්මක විමසුමක්
## (පුස්සැල්ලවත්ත දෙමළ වතු කම්කරු පවුල් 30ක් ඇසුරින්)

කේ. හේෂාන් නිර්මල
දර්ශනය හා මනෝවිද්‍යා විශේෂවේදී
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

එම්.එම්. අමිල බණ්ඩා
දර්ශනය හා මනෝවිද්‍යා විශේෂවේදී
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
amithbandara087@gmail.com

එම්. ඩී. භාග්‍යා විහාරා සෙව්වන්දි
දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**සාර සංක්ෂේපය**

සමාජ, ආර්ථික,දේශපාලනික හා සංස්කෘතික වශයෙන් වඩාත් වැදගත් වන සාධකයක් ලෙස ශ්‍රී ලංකාවේ වැවිලි ක්ෂේත්‍රය හඳුනා ගත හැකි ය. වැවිලි ක්ෂේත්‍රයේ ශ්‍රමිකයන් ලෙස වතු කම්කරුවන් ජාතික නිෂ්පාදනයට හා ආර්ථික ක්‍රියාවලිය සක්‍රීය කිරීම සඳහා දක්වන දායකත්වය ද ඉතා ඉහළ අගයක් ගනී. එහෙත් ඔවුන්ගේ සමාජ ආර්ථික ජීවිතය ඉහළට ඔසවා තැබීම සඳහා වන මැදිහත් වීම සතුටුදායක නො වේ.

වැවිලි ක්ෂේත්‍රය ආරම්භ කළ බ්‍රිතාන්‍යයෝ ඉන්දීය ශ්‍රමිකයන් මෙ රටට ගෙනවිත්, ලැයින් කාමර තුළ ඔවුන් ව කොටු කර තැබූහ. කාලීන ව සිදුවන පුළුල් සමාජ පරිවර්තන ක්‍රියාවලිය හේතු කොටගෙන වතු කම්කරුවන්ගේ ජීවන ගමන් මඟ ද විවිධ දිසාවන් ඔස්සේ වෙනස් විය. එය පැරණි වතු කම්කරු ජීවිතයේ සීමා බන්ධන ඉක්මවා යාමකි.

ජීවිතයේ මිනිසා පසු කරන තීරණාත්මක අවධි හා කාලපරිච්ඡේදවල දී තත්වයන්ගේ වෙනස්වීම පිළිබඳ ජනසමාජවල සිදුකරනු ලබන චාරිත්‍ර යාතුකර්මයන් ද්වාරකර්ම යනුවෙන් හඳුන්වයි. ජීවිතයේ මිනිසා පසුකරන ළමා, තරුණ, වැඩිහිටි අවධිවල දී ජීවිතයේ ප්‍රධාන ද්වාකර්ම අවස්ථාවන්ට ලක්වෙයි. වැඩිවිය පැමිණීම, විවාහය, මරණය යන අවස්ථා ඒ අතරින් ප්‍රධාන වේ.

ශ්‍රී ලංකාව බහුවාර්ගික රටක් වන අතර එහි විවිධ ජනවර්ග ජීවත් වෙයි. ඔවුන් අතර පවතින ද්වාරකර්ම අවස්ථා හා ද්වාරකර්ම චාරිත්‍ර සමාජ සංස්කෘතික තත්වයන්ගේ එක් අංශයක් ලෙස හඳුනා ගත හැකි ය.

රටකින් රටක් වෙනස් වන්නේ ප්‍රධාන වශයෙන් ඒවායේ ඇති භූගෝලීය හා පාරිසරික තත්වයන් මත ය. නමුත් සමාජයකින් සමාජයක් වෙනස් වන්නේ එම තත්වයන් මත ම නො වේ. සෑම සමාජයක ම ජීවත් වන ජනයා ඔවුන්ට ම ආවේණික සංස්කෘතියක් ගොඩනගා ගනිමින් ජීවන අරගලයක නියැලෙයි.

**ප්‍රමුඛ පද :** ද්වාර කර්ම, දමිළ ජනතාව, වතු කම්කරු, චාරිත්‍ර, සංස්කෘතිය.

SSS32

# Gendered Taboo Words: A sociolinguistic study of the use of taboo words among young bilingual men and women in Sri Lanka

D N H Dewasiri
Undergraduate – 3rd year
Department of English, Faculty of Arts
University of Colombo
hiranyada.dewasiri@gmail.com

**Abstract**

This research explores the different use of taboo words by young bilingual males and females. Through studying the linguistic behaviour of a group of young men and women from the western province of Sri Lanka through their attitudes towards and their pattern of usage of the words 'fuck' and 'හුකනවා', which are semantically similar taboo words in English and Sinhala. This study observes that although women are reluctant to use taboo words in their L1, they may utilize their L2 repertoire to use non-standard speech.

**Keywords:** Taboo words, Gender, Bilinguals

SSS33

# The use of questions in mediated political debates in Sinhala

Dr. Kaushalya Perera
Senior Lecturer
University of Colombo
kaushalya@english.cmb.ac.lk

**Abstract**

Questioning is a significant feature of political speech as shown by prior research on stancetaking. Stancetaking is the study of linguistic features expressing attitudes, emotions, alignment and assessments in propositional content (Englebretson, 2007). Little attention is given to pragmatics of Sinhala despite its long history; neither has much work been done on the use of Sinhala in the media. This paper aims to study televised political debates to investigate stancetaking in the Sinhala language, with specific attention to questioning. The study uses six hours of transcribed political debates in a qualitative analysis. Over 500 instances of questions were coded for types of questions and stance functions. The findings reveal that the main pragmatic functions of questioning in political debates include topic presentation, legitimization and face threatening actions. Given the syntactic variation related to questioning and the lack of research on the pragmatics of questions in Sinhala, a secondary goal is the categorization of questions as they are used in political speech. The paper concludes with a discussion of possible future studies on pragmatics of Sinhala.

**Keywords:** Sinhala, Stancetaking, Questioning, Alignment, Epistemic stance, political speech

SSS34

# පශ්චාත්යටත් විජිත ශ්‍රී ලංකා සමාජය තුළ සමාජ ස්තරායන ප්‍රවර්ගයක් වශයෙන් කුලය ප්‍රතිනිර්මාණය වීම : සමාජ විද්‍යාත්මක කියවීමක්

දිනූෂිකා යාපා අබේවර්ධන
සහකාර කථිකාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
dinuyap a93@gmail.com

**සාර සංක්ෂේපය**

අප ජීවත් වන සමාජය විවිධ මට්ටම්වලින් සැදුම්ලද්දකි. නො එසේ නම් ධනය, බලය, ගරුත්වය ආදී සාධක සමාජයේ සාමාජිකයින්ට විවිධ මට්ටම්වලින් හිමිවන පරිදි ස්ථරගත වීම සමාජ ස්තරායනය ලෙස අර්ථගැන්වීම කළ හැක්කකි.මෙකී සමාජ ස්තරායන විෂයෙහි උචිත ම නිදසුනක් වන්නේ දකුණු ආසියාතික සමාජය හා බැඳුණු ආවේණික ආචීර්ණ කල්පික සමාජ ප්‍රවාහයක් වන කුලය යන්න යි. ඒ අනුව මිනිසාගේ ජන්මය හා බද්ධ කරමින් හඳුනාගන්නක් වූ කුලය සමාජ විද්‍යාව තුළ ආරෝපිත තත්වයක් වශයෙන් අර්ථ ගන්වනුයේ එය වෙනස් කිරීමට සමාජය හරහා අවකාශයක් හිමි නො වන හෙයිනි. එහෙයින් සිංහල සමාජයේ "පොදු සාධකය" වන්නේ කුලය යි (සේනාරත්න, 2002: 33). ආවෘත සමාජ ස්තරායන ක්‍රමයක් වශයෙන් මෙන් ම සමාජය තුළ සමාජ චලනතාවයට ඉඩ නො සලසන මතවාදයක් වශයෙන් ද එය හැඳින්විය හැකි ය. කෙසේ නමුත් සුවිශේෂී වශයෙන් ඉන්දියාව සහ ලංකාව කරණකොටගෙන සාකච්ඡාවට බඳුන් කළ හැක්කක් වන කුලය මිනිසුන්ගේ පුද්ගලබද්ධ ජීවිතයට සියුම් වශයෙන් බලපෑම් කරන්නාවූ අනන්‍යතා කාරකයක් ද වේ.

පශ්චාත් යටත් විජිත ශ්‍රී ලංකා සමාජයේ කුලය පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී අවධානයෙන් බැහැර කළ නො හැකි ප්‍රවර්ගයක් වශයෙන් සමාජ පන්තිය හඳුනාගත හැකි ය. යටත්විජිත යුගයට පෙර කුලය සහ පංති ක්‍රමය බොහෝ දුරට සමපාත ව තිබුණු බව ඉන්දීය සමාජ විද්‍යාඥයෙකු වන ආන්ද්‍ර බතේ ප්‍රකාශ කර තිබේ (බතේ උපුටාගත්තේ, ද සිල්වා, 2005: 16).ඒ අනුව මෙකී කුලය යන සමාජ ස්තරායන ප්‍රවර්ගය වත්මන් ලාංකේය සමාජය තුළ විද්‍යමාන වන ආකාරය පිළිබඳ ව සමාජ විද්‍යාත්මක කියැවීමක් මෙම ලිපිය හරහා සිදු කෙරේ. විශේෂයෙන් ම කුමාරි ජයවර්ධන විසින් සිය "සොක්කන් ලොක්කන් වූ වගයි" කෘතිය තුළ ඉදිරිපත් කරනු ලබන න්‍යායාත්මක සාකච්ඡාවෙහි අන්තර්ගත වන කුලයෙහි ප්‍රතිනිර්මාණය වීම පිළිබඳ තර්කය අනුව යමින් වත්මන් සමාජය තුළ සමාජ ආර්ථික සංස්කෘතික වශයෙන් මෙය ප්‍රායෝගීකරණය වී ඇති ආකාරය මෙහි ලා අවධානයට නතු කෙරේ. එහි ලා සමාජය කෙතරම් නූතනත්වයට පත් වී ඇති නමුත් මෙකී පැරණි නිර්මිතය තවමත් නො නැසී සමාජය තුළ පවතින ආකාරය ආගම, පවුල, දේශපාලනය සහ ආර්ථිකය යන සමාජ සංස්ථා ඔස්සේ විශද කෙරේ. අප්‍රකාශිත තත්වයේ පවතිමින් මිනිස් ජීවිත මත සියුම් වශයෙන් බලපෑම් කරන්නාවූ කුලය ප්‍රායෝගික ක්ෂේත්‍රය තුළ දත්ත එක්රැස් කිරීමේ දී මහජන තලයේ සාකච්ඡාව සඳහා සංවේදී මාතෘකාවක් වන හෙයින් ද්විතීයික දත්ත මත පදනම් ව මෙම පර්යේෂණය ක්‍රියාත්මක කෙරුණු අතර, එහි ලා උක්ත මාතෘකාව හා සමපාත වන්නාවූ සාහිත්‍ය විෂයෙහි අවධානය යොමු කරමින් විග්‍රහය සිදු කරන ලදී.

**ප්‍රමුඛ පද:** අනන්‍යතාවය, කුලය, කුල විඥානය, සමාජ චලනතාවය, සමාජ පන්තිය.

SSS35

# සිංහල භාෂාවෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හැදෑරීමේ දී ඇති වන ගැටලු පිළිබඳ ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයක්

(කොළඹ විශ්වවිද්‍යාලයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය හදාරන සිසුන් ඇසුරෙන්)

එස්.ජී.එන්.සී. සේනානායක
පරිගණක ඉගෙනුම් ඒකකය
කොළඹ විශ්වවිද්‍යාලය
nalinchinthaka701@gmail.com

## සාර සංක්ෂේපය

වර්තමානයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය අතිශය දියුණු යුගයකි. මෙම තත්වය නිසා තවදුරටත් තාක්ෂණයෙන් සැඟවී සිටීමට අපට නො හැකි ය. අධ්‍යාපනය ලබා ගැනීමේ දී අත්‍යවශ්‍ය අංගයක් බවට නූතනය වන විට තාක්ෂණය පත් වී ඇත. මෙහි දී භාෂාව යන්න එක් පසෙකින් ද අනෙක් පසෙන් තාක්ෂණය යන්න ද එකවිට බලපෑම නිසා තාක්ෂණය බෙදීම යන්නට භාෂාව ප්‍රබල බලපෑමක් සිදු කිරීමට සමත් වී ඇත. විශේෂයෙන් ම තාක්ෂණය පැවතිය ද ඉන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට භාෂාව අනිවාර්ය අංගයක් බවට පත්වීම යි. ඒ අනුව භාෂාව නො දැනීම මත තාක්ෂණය, නො දැනීමක් බවට පත් වී ඇත. මෙහි දී සිංහල භාෂකයන්ට ඉංග්‍රීසි භාෂාව සමඟ කටයුතු කිරීමට සිදුවීම තුළ මෙම ගැටලුව ප්‍රමුඛව හඳුනා ගැනීමට හැකි ය. තාක්ෂණය සමඟ ගනුදෙනු කිරීමේදී ඉංග්‍රීසි භාෂා දැනුම බොහෝ ප්‍රයෝජනවත් වේ. එහි දී ඉංග්‍රීසි භාෂා භාවිතය අඩු අයෙකුට සාපේක්ෂ ව එහි වැඩි දැනුමක් ඇති අයෙකු වැඩි ප්‍රයෝජනයක් ලබයි. වර්තමානයේ බොහෝ අය අන්තර්ජාලය භාවිතා කරති. එහි බහුතරය ඇත්තේ ඉංග්‍රීසි භාෂාවෙනි. මේ මත භාෂාව යන්න නො දැනීම තාක්ෂණය නො ගැනීමටත් ඉන් උපරිම ප්‍රයෝජන ලබා නො ගැනීමටත් සෘජු ව බලපාන කරුණක් බවට පත් වී ඇත. ඒ අනුව කොළඹ විශ්වවිද්‍යාලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හදාරන සිසුන් මඟින් මෙම ගැටලුවේ ස්වභාවය හඳුනාගැනීමත් එම ගැටලුව ඔවුන්ට බලපාන ආකාරය හඳුනාගැනීම හා එයට ගත හැකි විසඳුම් සාකච්ඡා කිරීම මෙම අධ්‍යයනයෙන් සිදු කරන ලදි. විශේෂයෙන් ම සමාජයේ අධ්‍යාපන මට්ටම අනුව ඉහළ ස්ථානයක සිටින සරසවි සිසුන් යොදා ගැනීම මඟින් තාක්ෂණය කෙරෙහි භාෂාවේ බලපෑම ඔවුන්ට බලපාන ආකාරය හඳුනා ගන්නා ලදි. ප්‍රධාන වශයෙන් ම සිසුන් බහුතරයක් මෙම ගැටලුවට මුහුණ දී සිටි අතර මෙයට ගත හැකි ප්‍රධාන ම විසඳුම ලෙස ඔවුන් තුළ භාෂාවට පවතින බිය දුරුකිරීම හා භාෂා නැඹුරුතාව වැඩි කිරීම පෙන්වාදිය හැකි ය.

**ප්‍රමුඛ පද:** අධ්‍යාපනය, ඉංග්‍රීසි භාෂාව, තාක්ෂණය බෙදීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය.

SSS36

# ආගමික ස්ථානයක් මඟින් සමාජයට සිදු කෙරෙන කෘත්‍යයන් පිළිබඳ ව සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයක්

පී.කේ.ජී.අයි.එල්. රණසිංහ
සහය කථිකාචාර්ය
සමාජ විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
iru.ranasinghe@yahoo.com

**සාර සංක්ෂේපය**

ආගම යනු අනාදිමත් කාලයක සිට පැවත එන සහ සමාජ විද්‍යාව තුළ සාකච්ඡාවට ලක්වන ප්‍රධාන සමාජ සංස්ථාවකි. ආගම පිළිබඳ ව විශ්වීය නිර්වචනයක් ලබාදීම අපහසු ය. බෞද්ධ ආගමික විහාරස්ථානයක් ආශ්‍රයෙන් මෙම පර්යේෂණය සිදුකොට ඇත. ආගම පුද්ගලයන්ගේ ලෞකික සහ ලෝකෝත්තර යන දෙ අංශය සඳහා ම කෘත්‍යාත්මක වේ. වර්තමාන සමාජයේ පවතින අර්බුද සහ ඒවාට විසඳුම් ද ආගම හරහා ප්‍රකාශ වේ. යාතුකර්ම සහ අභිචාර ආගමක ප්‍රධාන අංග වේ.

**ප්‍රමුඛ පද :** අභිචාර, ගෝලීයකරණය, යාතුකර්ම, සාමූහික විඥානය.

SSS37

# පූර්ව නිමිති ස්වප්නයන්හි සප්‍රමාණිකත්වය පිළිබඳ බෞද්ධ සාහිත්‍යාගත අධ්‍යයනයක්

යෝධකණ්ඩියේ අරියවංස හිමි
කථිකාචාර්ය
බෞද්ධ දර්ශනය අධ්‍යයන අංශය
බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
arwansa@gmail.com

**සාර සංක්ෂේපය**

'ස්වප්න' යන සංස්කෘත පදය 'සුපින' යනුවෙන් පාලියට ද 'සිහින' හෝ 'හීන' යනුවෙන් සිංහලට ද පැමිණ ඇත. 'Dream' යනුවෙන් ඉංග්‍රීසියේ භාවිත වන එයට ශ්‍රී සුමංගල ශබ්දකෝෂයෙහි අරුත් සපයා ඇත්තේ 'නින්දෙහි දී හිතට අරමුණු වන පෙර කළ කී දේ ආදිය' යනුවෙනි. ඉංග්‍රීසි ශබ්දකොෂවල 'a series of image, events and feelings that happen in your mind while you are asleep' යනුවෙන් 'සිහින' යන්න නිර්වචනය කොට ඇත. මේ අනුව තමන්ගේ අතීත සහ අනාගත සිදුවීම්හි නිමිති ලෙස 'නිදන්නහුට පෙනෙන මනෝමය දර්ශනයක්' ලෙස සිහින යන්න සරල ව හඳුනාගත කරගත හැකි ය.

**ප්‍රමුඛ පද :** බෞද්ධ සාහිත්‍යය, සප්‍රමාණිකත්වය, සිහින.

SSS38

# පොළොන්නරු යුගයේ සංගීතය සහ භාරතීය සබඳතා

නිශ්ශංබ අබේරත්න
කර්ණාටක සංගීත අධ්‍යයනාංශය
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
arwansa@gmail.com

## සාර සංක්ෂේපය

පොළොන්නරු යුගයේ සිට ම ශ්‍රී ලංකාවට කර්ණාටක සංගීතයේ බලපෑම ලැබුණු බවත්, මහ පැරකුම්බා රජුගේ රූපවතී බිසව සංගීත හා නැටුම් කලාවන් ප්‍රගුණ කළ බවත්, සාහිත්‍ය මූලාශ්‍රයන්හි සඳහන් වේ. භාරතයෙහි සංස්කෘත සම්ප්‍රදාය යටතේ ඉහළ කුලවතුන්ට පමණක් සීමා ව පැවැති සංගීත ආදී ශිල්ප ශාස්ත්‍රයන්හි ආභාසය උත්තර භාරතයෙන් දක්ෂිණ භාරතයේ ප්‍රභූවරුන්ට සහ ශ්‍රී ලංකාවේ ප්‍රභූවරුන්ට ලැබුණු බව ඓතිහාසික තොරතුරු මඟින් පැහැදිලි වේ.පොළොන්නරු යුගයට සමගාමී ව පැවැති භාරතීය සංස්කෘත සම්ප්‍රදායයේ සහ පැරණිතම සංගීත සම්ප්‍රදායේ ආභාසය පොළොන්නරු යුගයේ දී දකුණු ඉන්දියාවට සේ ම ශ්‍රී ලංකාවට ද ලැබුණු බවත්, පොළොන්නරු යුගයේ රජ ඇමති ආදි ප්‍රභූන්ගේ පුත්‍රයන් කාව්‍ය සංගීත ආදී ශිල්ප ශාස්ත්‍ර හැදෑරූ බව සහ පොළොන්නරු යුගයේ පළමුවන විජයබාහු රජතුමා රජ ඇමති ආදීන්ගේ පුත්‍රයන් විසින් කරන ලද ශ්ලෝකයන් හෝ කවි සිලෝ ආදිය ඇසූ බව මෙම පර්යේෂණයේ තහවුරු විය. පොළොන්නරු යුගයේ විජයබාහු හෙවත් මහලු විජයබාහු (ක්‍රි. ව. 1055-1110) රජතුමා ප්‍රභූ පුත්‍රයන් විසින් කරන ලද ශ්ලෝකයන් අසමින් සුදුසු පරිදි ඔවුන්ට ධනය දුන් බවත් කාව්‍යක්කාරයින්ට විශේෂ අනුග්‍රහය දැක්වූ බවත් මහාවංසයෙහි සඳහන් වේ. එහෙත්, දක්ෂිණ භාරතීය අනන්‍යතාවයක් සහිත කර්ණාටක ශාස්ත්‍රීය සංගීතයේ උපත සිදු වූ කාලය සහ පොළොන්නරු යුගයට අයත් කාල සීමාව පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් ද මෙම පර්යේෂණයේ දී සිදු කැරිණි. ඒ අනුව, පොළොන්නරු යුගයේ මහ පැරකුම්බා රජුගේ රූපවතී බිසව සංගීත හා නැටුම් කලාවන්හි දක්ෂතම තැනැත්තියක විය හැකි වුව ද පොළොන්නරු යුගයේ දී ශ්‍රී ලංකාවට කර්ණාටක සංගීතයේ බලපෑමක් සිදු විය නො හැකි බව තහවුරු වූ බවත් කිව යුතු ය. ඒ අනුව, පොළොන්නරු යුගයේ දී ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වූයේ දක්ෂිණ භාරතීය ශාස්ත්‍රීය සංගීත සම්ප්‍රදාය හෙවත් කර්ණාටක සංගීත සම්ප්‍රදාය නො වන බව මෙහි ලා අවධාරණය කළ යුතු ය. එසේ වෙතත්, දකුණු ඉන්දියාවේ දී කර්ණාටක ශාස්ත්‍රීය සංගීතය බිහිවීමෙන් පසු ව ශ්‍රී ලංකාවට කර්ණාටක සංගීතයේ බලපෑම සිදු වූ බව කිව හැකි ය. එ හෙයින්, මෙම පර්යේෂණයේ දී අනාවරණය වූ තොරතුරු අනුව පොළොන්නරු යුගයේ දී ශ්‍රී ලංකාවට දක්ෂිණ භාරතීය ශාස්ත්‍රීය සංගීත සම්ප්‍රදාය හෙවත් කර්ණාටක සංගීතයේ ආභාසය ලැබී නොමැති බවත්, එම යුගයේ දී ශ්‍රී ලංකාවට භාරතයේ පැරණිතම සංගීත සම්ප්‍රදායේ සහ සංස්කෘත සම්ප්‍රදායේ අභාසය ලැබී ඇති බවත් කිව යුතු ය.

**ප්‍රමුඛ පද :** කර්ණාටක සංගීත සම්ප්‍රදාය, කාව්‍යක්කාරයෝ, පොළොන්නරු යුගය, භාරතයේ පැරණිතම සංගීත සම්ප්‍රදාය, සංස්කෘත සම්ප්‍රදාය.

SSS39

# වාත්ස්‍යායනගේ කාමභෝගී සාහිත්‍ය අර්ථ රසාත්මකය : කාම සූත්‍රය සත්‍ය යථාර්ථය කොළඹ කේන්ද්‍රීය ආයුර්වේද සම්භාහන මධ්‍යස්ථාන ඇසුරින්

පැතුම් ආර්.එන්
දේශපාලන විද්‍යාව සහ රාජ්‍යය ප්‍රතිපත්ති අධ්‍යනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
acd25psc@gmail.com

**සාර සංක්ෂේපය**

මෙම පර්යේෂණයෙහි විෂය ක්ෂේත්‍රය වනුයේ වෙළෙඳපොළකරණය පිළිබඳ නව ලිබරල් මතවාදය යි. එහෙත් සත්‍යය ලෙස ම එහි පවතින නෛතික සහ සමාජීය ව්‍යුහය අධ්‍යයනය කර තිබෙන්නේ නාරි දේහය පුරුෂ බද්ධදෘෂ්ටිය (Male gaze) මත ය. ස්ත්‍රී ශරීරය පාරිභෝගික භාණ්ඩයක්(commoditized female body)බවට පත් වීමේ වාණිජකරණ යථාර්ථය සම්භාහන මධ්‍යස්ථාන වෙතින් ප්‍රායෝගිකත්වයට පත් වීම ක්‍රි.ව 320-550 ගුප්ත යුගයේ සුශ්රුත සම්හිතා ග්‍රන්ථයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ සිද්ධාන්ත මඟින් ද සනාථ කරයි. එම කරුණු උපුටා ගනිමින් ආචාර්ය බී. එන් බාසු (B.N Basu) විසින් වාත්ස්‍යායනගේ කාමසූත්‍ර ධර්මයන් ප්‍රායෝගික ව ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ රෝගයන් සුවපත් කිරීමට ශාස්ත්‍රීය ව උපකාරයක් වන බවට ප්‍රකාශ කරයි. මෙම කරුණු කොළඹ සහ තදාසන්න ප්‍රදේශයන් කේන්ද්‍ර ගත ආයුර්වේද සහ තායි සම්භාහන ආයතනවල වෙන් වෙන් වශයන් වාත්ස්‍යායන සම්භාහන මූලධර්යන් බවට පත්වීම නව ලිබරල්වාදය තුළ"විකිණීමට සහ අලවි කළ හැකි සාහිත්‍යය භාණ්ඩ" බවට පත් කිරීමක් වේ. ඒ අනුව පරිධිගත සමාජයේ සාහිත්‍යය වුව ද, අලවිකරණ වෙළඳපොළකරණයෙහි සත්‍යය යථාර්ථය දේශපාලන සමාජ විද්‍යාත්මක (social political) දෘෂ්ඨිකෝණයකින් විවරණය කිරීම මෙම පර්යේෂණය මඟින් ඉටුවේ.

**ප්‍රමුඛ පද :** කාම සූත්‍රය, පරිධියේ ධනවාදය, පුරුෂ බද්ධදෘෂ්ඨිය, ලිංගික ශ්‍රමික සේවය, වාණිජකරණය.

SSS40

# ලක්දිව ස්තූප ප්‍රචලිත වීම සඳහා බලපෑ ආගමික පසුබිම

ඉනෝජ් කෞශල්‍ය අබේනායක
කථිකාචාර්ය
ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
inojabey@gmail.com

**සාර සංක්ෂේපය**

ක්‍රි.පූ. 3 වන සියවසේ බුදු දහම මෙ රටට හඳුන්වාදීමෙන් පසු ස්ථාපිත කළ ප්‍රබලතම ආගමික සංකල්පය වූයේ ස්තූපය යි. ස්තූපයේ භෞතික ස්වරූපය අනුව එය ගඩොලින් කළ නිර්මිතයක් වුවත් ඒ තුළ තැන්පත් කරන ලද ධාතූන් වහන්සේලාට අනුව ගඩොල් නිර්මිතයට කිසියම් ආධ්‍යාත්මික වටිනාකමක් ලැබුණි. එය ආගමික අරුතින් ශුද්ධ වස්තුවක් යන අදහස ස්වදේශීය ජනතාවගේ මනස තුළ ස්ථාපිත වීම වඩා වැදගත් සාධකය විය. ප්‍රාරම්භයේ දී බුදුන් වහන්සේට සමාන ගරු සැලකිලි ස්තූපයට සිදු කිරීමට ජනතාව උනන්දු වූ අතර අනතුරුව ආගමික විශ්වාසයන් හා බද්ධ වූ ඒකාබද්ධ පද්ධතියක් ලෙස ස්තූපය සමාජගත වන්නට විය. ස්තූප ඉදිකිරීම බෞද්ධ සංස්කෘතිය තුළ සුවිශේෂ නිර්මාණයක් ලෙස සමාජයේ මුල්බැසගෙන තිබීමත්, ප්‍රබල ආගමික සංකේතාර්ථ මෙන් ම මරණින් මතු ජීවිතය සුගතිගාමී වීමට අවශ්‍ය ආගමික පරිසරය මෙයින් නිර්මාණය වීමත් යන සාධක හේතුවෙන් ලක්දිව ස්තූප සමාජයේ ප්‍රචලිත විය.

**ප්‍රමුඛ පද :** ආගම, බෞද්ධ සංස්කෘතිය, ශුද්ධ වස්තුව, ස්තූපය.

SSS41

# සිංහල භාෂාවේ සමකාලීන ප්‍රවණතා
## (ත්‍රීවිල් භාෂාව පිළිබඳ ව සිදු කෙරෙන සමාජ සංස්කෘතික අධ්‍යයනයක්)

හර්ෂණී මිල්ලගහතැන්න
කථිකාචාර්ය
භාෂා අධ්‍යයන අංශය
සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
harshimtc2010@yahoo.com

**සාර සංක්ෂේපය**

සංක්‍රමණ, විසරණය හා සංස්පර්ශ හේතුවෙන් දිනෙන් දින සමාජයත් සංස්කෘතියත් පරිණාමයට පත්වේ. උක්ත පරිණාමණ සාධක හමුවේ සමකාලීන සමාජය හා සංස්කෘතියේ සිදු වන විවිධතා විෂමතා ඍජුවත් වක්‍රාකාරවත් විමර්ශනය කිරීමට භාෂාව මහෝපකාරී වේ. භාෂාව වූකලී සංස්කෘතියේ ප්‍රධාන වාහකය යැයි හඳුන්වන්නේ එ බැවිනි (බලගල්ලේ,1995:33). එ මෙන් ම කිසියම් භාෂාවක සමකාලීන ප්‍රවණතා හඳුනා ගැනීමට ද මෙ මඟින් හැකි වීම විශේෂත්වයකි.

මිනිස් සිත සමාජ පරිසරයේ නිෂ්පාදනයක් බැවින් එහි අඩංගු ජනතාවගේ සිතුම් පැතුම් ද කාලය හා සමාජය අනුව වෙනස් වෙයි (පල්ලියගුරු, 2002:23). සමකාලීන සිංහල සමාජ සංස්කෘතික විපර්යාස හමුවේ සිංහල භාෂාවේ නව ප්‍රවණතා රැසක් අනාවරණය කරගත හැකි වන්නේ එ බැවිනි. ඒ අතර ත්‍රීවිල් රියදුරන් භාවිත පරිමිත භාෂා ව්‍යවහාරය හා ත්‍රීවිල් රථයේ පිටුපස සටහන්කර ඇති ගද්‍ය පද්‍ය පාඨ විමර්ශනය කල හැකි ය. කුලී ත්‍රීවිල් රථ ඔස්සේ මෙ රට සමාජ සංස්කෘතියේ සාධනීය හා නිශේධනීය ප්‍රවණතා රැසක් බිහිවෙමින් පවතී. තරාතිරම් නො බලා කෙටි ගමනාගමන පහසුකම් සැලසීමට මෙ මඟින් හැකිවීමත් විරැකියාවට පිළියමක් වීමත් මෙකී සංස්කෘතිය රටපුරා ව්‍යාප්ත වීමට හේතුව යි. එහෙත් සමාජ විරෝධී හා නීති විරෝධී ක්‍රියා රැසක් ද මෙ මඟින් සිදුවන ආකාරය දෛනික විද්‍යුත් හා පුවත්පත් මාධ්‍ය ඔස්සේ දැකගත හැකි ය. උක්ත තත්වයන් ත්‍රීවිල් රථ රියදුරන්ගේ පරිමිත භාෂාව අධ්‍යයනයෙන් මනාව නිරූපණය වේ. ත්‍රීවිල් රථ පිටුපස සටහන් කර ඇති ගද්‍ය පද්‍ය පාඨ ඔස්සේ මෙකී සමාජ පන්තියේ සමාජ ආකල්ප හා ප්‍රතිමාන අනාවරණය වේ. ඒ මඟින් සමකාලීන සිංහල සමාජයේ දේශපාලනික, ආගමික, ආධ්‍යාපනික හා සමාජ සංස්කෘකිත ප්‍රවණතා මනාව අධ්‍යයනය කළ හැකි ය.

අතීතයේ දී ආප්තෝපදේශ හා ප්‍රස්ථාව පිරුළු ඔස්සේ කිසියම් උපදේශනාත්මක පණිවිඩ සමාජගත කිරීමට ජනවිඥානය සමත් වී ඇත. වර්තමානයේ දී ද වෙනස් ආකෘති ඔස්සේ මෙය ම සිදු වේ. එහි දී උපදේශනාත්මක පණිවිඩයක් වශයෙන් පමණක් නො ව කර්කශ උපහාසය හා අපහාසය ද ඒ තුළ කැටි ව පැවතීම විශේෂත්වයකි. ත්‍රීවිල් රථයේ පිටුපස සටහන් කර ඇති ගද්‍ය පද්‍ය පාඨ සිංහල භාෂා භාවිතයේ සමකාලීන ප්‍රවණතාවක් වශයෙන් ඒ අනුව හඳුනාගත හැකි ය. ත්‍රීවිල් රියදුරන් භාවිත පරිමිත භාෂාව හා ත්‍රීවිල් රථයේ භාවිත ගද්‍ය පද්‍ය පාඨ අධ්‍යයනය මඟින් සිංහල භාෂාවේ නව ප්‍රවණතා හඳුනාගැනීමත් සමකාලීන සිංහල සමාජ සංස්කෘතියේ විවිධතා විෂමතා විමර්ශනය කිරීමත් මෙම පර්යේෂණයෙන් අපේක්ෂා කෙරේ.

**ප්‍රමුඛ පද :** ත්‍රීවිල් රථ, නව භාෂා ප්‍රවණතා, පරිමිත භාෂාව, සංස්කෘතික විපර්යාස, සිංහල භාෂාව.

SSS42

# විශ්වවිද්‍යාලය විද්‍යාර්ථීන් සිංහල ලේඛන ව්‍යවහාරයේ දී අක්ෂර වින්‍යාසය කෙරෙහි දක්වන අවධානය පිළිබඳ අධ්‍යයනයක්

එම්. ඒ. ජී. ජයනි සමීරා
සිංහල අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
jayani.sameera7@gmail.com

**සාර සංක්ෂේපය**

මිනිසාගේ සංස්කෘතික උරුමයන් පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යන වාහකයා වන්නේ භාෂාව යි. භාෂාවක මුඛ්‍ය ස්වරූපය වන්නේ භාෂණය යි. මිනිසා විසින් තම අත්දැකීම්, දැනුම හා පණිවිඩ පරම්පරාවෙන් පරම්පරාවට පවත්වා ගැනීම උදෙසා ලේඛන භාෂාව නිර්මාණය කර ගන්නා ලදි. භාෂණයේ දී ශබ්ද ප්‍රමුඛ වන අතර ලේඛනයේ දී ප්‍රමුඛ වන්නේ අක්ෂර යි. ශබ්ද රූප, දෘශ්‍ය රූප බවට පත්වීමෙන් අක්ෂර නිර්මාණය වී ඇත. භාෂාවක මුඛ්‍ය පරමාර්ථය අර්ථ නිෂ්පත්තිය යි. ලේඛනයේ දී අර්ථ ජනනය වන්නේ ශබ්ද, පද, වචන, වාක්‍ය ඛණ්ඩ හා වාක්‍ය ඔස්සේ ය. මේ කාර්යයේ දී අක්ෂර ප්‍රමුඛ වෙයි. ලේඛන ව්‍යවහාරයේ දී නිවැරදි ලෙස අක්ෂර භාවිතය අක්ෂර වින්‍යාසය ලෙස හඳුන්වයි. රටක විශ්වවිද්‍යාලය පද්ධතිය තුළ දී ශාස්ත්‍රීය පර්යේෂණ හා ගවේෂණ නිරන්තරයෙන් සිදු වෙයි. ලාංකේය සමාජයේ මේ කාර්යය බහුල ව සිදු වන්නේ සිංහල මාධ්‍යයෙනි. සිංහල ලේඛන ව්‍යවහාරයේ දී විශ්වවිද්‍යාලය විද්‍යාර්ථීන් අක්ෂර වින්‍යාසය කෙරෙහි දක්වන සැලකිල්ල කෙබඳු ද? යන්න විමසා බැලීම මෙම පර්යේෂණයේ අරමුණ යි.

**ප්‍රමුඛ පද :** අක්ෂර වින්‍යාසය, අර්ථ නිෂ්පත්තිය, ලේඛන ව්‍යවහාරය, සිංහල භාෂාව.

SSS43

# විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වාදීමෙන් පසු ශ්‍රී ලාංකේය ජනවිඥානය සකස් කිරීමෙහි ලා සඟරා මාධ්‍යයේ උපයෝගිතාව (ආර්ථික විමසුම සඟරාවට විශේෂිතව)

කුමේෂ් ප්‍රභාෂිනි ගමගේ
ආචාර්ය උපාධි අපේක්ෂිකා
ප්‍රචාරක විද්‍යා අධ්‍යයන දෙපාර්තමේන්තුව
තොරතුරු කළමනාකරණ පීඨය
වූහාන් විශ්වවිද්‍යාලය, චීනය
k.prabhashini@gmail.com

**සාර සංක්ෂේපය**

විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වාදීමෙන් පසු ආනයන අපනයන වෙළෙඳ ප්‍රතිපත්ති ලිහිල්කරණය, නිදහස් වෙළෙඳ කලාප ඇති කිරීම, කාර්මීකරණයේ ආර්ථික වර්ධනය වේගවත් කිරීම, පෞද්ගලික අංශය ශක්තිමත් කිරීම, විදේශ ආයෝජනයන් සඳහා දිරිදීම ආදී ආර්ථිකමය වෙනස්වීම් සිදු විය. පොදු ජන තොරතුරු සන්නිවේදනය මෙන් ම කලා මාධ්‍යයක ගුණාංගයන් ද එක් වූ මුද්‍රිත ව්‍යවහාරයක් බැවින් ජන විඥානය සකස් කිරීමෙහි ලා ප්‍රබල භූමිකාවක් සඟරා මාධ්‍යය සතු වේ. ඒ අනුව මෙම අධ්‍යයනය මහජන බැංකු පර්යේෂණ ඒකක විසින් ප්‍රකාශයට පත් කරන ලද ආර්ථික විමසුම සඟරාවට විශේෂිත ව සිදු කරන ලදී. විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වාදීමට පූර්ව යුගයක් වූ 1975 සිට විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දුන් පසු යුගයක් වූ 1985 කාල පරිච්ඡේදය අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබිණි. අන්තර්ගත විශ්ලේෂණය, මඟින් ප්‍රමාණාත්මක දත්ත මෙන් ම නිදහස් ලේඛකයන්, කර්තෘ මණ්ඩල සාමාජිකයන්, පාඨකයන් සමඟ සම්මුඛ සාකච්ඡා ඇසුරෙන් ලබාගත් ගුණාත්මක දත්ත ආශ්‍රිත මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යොදා ගැණුණි. ආර්ථික විමසුම සඟරාව 1977 මහ මැතිවරණය,1978 විධායක ජනාධිපති ක්‍රමය සහ දෙවන ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව, 1979 රූපවාහිනිය හඳුන්වා දීම, 1981 අයවැය, 1982 ජාතික රූපවාහිනිය ආරම්භය සහ ජනාධිපතිවරණය, 1983 ජනවාර්ගික අර්බුදය, 1984 අයවැය ආදී සිදුවීම් ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි ඍජු ව හා වක්‍ර ව දක්වන සම්බන්ධතාව මෙන් ම ජනතාවට අදාළ සිදුවීම් බලපාන ආකාරය පිළිබඳ ව මතවාදීමය, විශ්ලේෂණාත්මක විග්‍රහයක යෙදී ඇති ආකාරය පැහැදිලි ය. ඒ අනුව ආර්ථික විමසුම සඟරාව සමකාලීන දේශපාලන ආර්ථිකය කෙරෙහි ශ්‍රී ලාංකේය ජන විඥානය දෘෂ්ටිවාදීමය සකස් කරන ආකාරය නිගමනය කරනු ලැබිණි.

**ප්‍රමුඛ පද :** ආර්ථිකය, ජන විඥානය, දෘෂ්ටිවාදය, විවෘත ආර්ථික ප්‍රතිපත්තිය, සඟරා මාධ්‍යය.

SSS44

# සාහිත්‍ය ශානරවල උපයුක්ත චරිත වටහා ගැනීමට මනෝ විශ්ලේෂණවාදයේ දායකත්වය:ස්වයංජාත නවකතාව ඇසුරින් සිදු කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්

පූජ්‍ය ඉඳුනිල්පුර ඉන්දානන්ද හිමි
සිංහල අධ්‍යයනාංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
indanandaindunilpura@gmail.com

## සාර සංක්ෂේපය

සිග්මන් ෆ්‍රොයිඩ් (1856-1939) මනෝවිශ්ලේෂණවාදය හඳුන්වාදී මනස භෞතික ව නිර්මාණය වන්නක් යැයි පැවසූ අතර ඒ සඳහා ප්‍රාමාණික න්‍යායන් ද ඉදිරිපත් කළේ ය. ඒ අතර විඥානය හා අවිඥානය වැදගත් වේ. ෆ්‍රොයිඩ් විසින් හඳුන්වා දුන් න්‍යායන් පසුව විවිධ උගතුන් අභිවර්ධනයට ලක්කර ඇත. ෆ්‍රොයිඩ් හඳුන්වාදුන් මෙම න්‍යාය විවිධ විෂයන් හැදෑරීමට ලොව භාවිත කෙරේ. ඒ අතර සාහිත්‍ය කෘති විචාරය කිරීමට ද යොදාගත් අතර එහි දී මනෝවිශ්ලේෂණීය සාහිත්‍ය විචාරයේ දී අංශ හතරක් පිළිබඳ ව අවධානය යොමු වේ. එනම් කතෘ, කෘතියේ අන්තර්ගතය, කෘතියේ ආකෘතික ව්‍යුහය හා පාඨකයා යන අංශ හතර යි. මෙහි චරිතය ගොඩනැගීමට හා වටහා ගැනීමට මනෝවිශ්ලේෂණ න්‍යාය මනා පිටුවහලක් වේ. ස්වයංජාත මෙහි දී වැදගත් නවකතාවක් වන අතර පබිලිනා හාමිනේගේ චරිතය ගොඩනැගීමට එය මනාව උපයෝගී කර ගෙන ඇත. මෙම චරිතයේ සංකීර්ණ ස්වභාව අවබෝධ කරගැනීමට හා ඇයගේ හැසිරීම, සිතීම් හා ක්‍රියා පිළිබඳ සැබෑ විවරණයක් මෙයින් ලබා ගත හැකි ය. චරිත නිරූපණය කතුවරයා මනාව සිදුකර ඇත්තේ ඉන් ගැඹුරු අරුතක් ඇතිවන ආකාරයෙනි. නවකතාකරුවා චරිතයේ ම තදාත්මීය ව කෙරෙන අභ්‍යන්තර භාෂණයක් උපයෝගී කොට ගෙන ඇති අතර එය අත්දැකීමක් ඉතා සංකීර්ණ ව ආදිකල්පික මිනිසාගේ අසම්පූර්ණ වූ මතක තදාත්මයෙන් දැක්වූ අවස්ථාවකි. මනෝවිද්‍යාත්මක ව තදාත්මීය වීම යනු තමා ප්‍රියකරන පුද්ගලයෙකුගේ ගතිගුණ සිතින් මවා ගැනීම ය. තමා සතුකර ගැනීම යි. මෙය සිතාමතා ම ඇතැම්විට සිදුවන එකකි. ස්වයංජාත නවකතාවේ පබිලිනා හාමිනේගේ චරිතයෙන් එය නිරූපණය වෙයි. කතුවරයා නවකතාවෙන් මනෝවිද්‍යාත්මක සංදර්භයක සිට චරිත මෙහෙයවා පුද්ගල මනසෙහි ඇති ගූඪ යථාර්ථයන් එළි දක්වා ඇත. සාහිත්‍යයේ අනුභූතීන් මිනිස් යථාර්ථයන් ද එළි දක්වා ඇත. සමාජයේ ජීවත්වන මිනිසුන් ඒ ඒ අවස්ථාවල මානසික ව ක්‍රියාකිරීම මෙන් ම විඥානය, අවිඥානය යොමුව මෙහෙයවන ආකාරය ස්වයංජාත නවකතාවෙන් පෙනේ. පබිලිනා, පබාවතී, විභූතිරත්න වැනි චරිත මූලික කරගෙන පවතින සත්‍යතාව කතුවරයා ගෙන එයි. පුද්ගල මනසෙහි ක්‍රියාකාරීත්වය මනාව විශ්ලේෂණය කරමින් යථාර්ථය පසක් කළ බැව් පෙනේ. මෙය වනාහි මනෝවිද්‍යාත්මක නවකතාවේ එකිනෙක චරිත අතර නිරන්තර සංවේදිතාව ශක්තිමත් කරන අවස්ථාවක් ලෙස දැක්විය හැකි ය. මිනිසා කුමන වර්ගීකරණ ඇතිකර ගත්ත ද මනස යනු අප ලොවට පූර්වයෙන් දායාද කරගෙන පැමිණෙන්නක් නො ව සමාජයේ ම නිමවුමක් බව මෙම කෘතියෙන් පැහැදිලි කර ගත හැකි ය. එසේ නිර්මාණය වන මනස මඟින් මිනිසාට සුඛය හෝ දුක්ඛය උරුම කරදෙයි.

**ප්‍රමුඛ පද:** අවිඥානය, චරිත නිරූපණය, මනෝවිශ්ලේෂණවාදය, විඥානය, සාහිත්‍ය විචාරය.

SSS45

# සුනිල් සාන්ත - සරච්චන්ද්‍ර ගැටුම: ලාංකේය ස්වදේශීකරණ ව්‍යාපාරයේ ප්‍රතිවිරෝධතා පිළිබඳ සංස්කෘතික කියවීමක්

හිනිදුම සුනිල් සෙනෙවි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සබරගමුව විශ්වවිද්‍යාලය

සමන් එන් කාරියකරවන
ස්වාධීන පර්යේෂකයෙකි
kariyakarawana@gmail.com

**සාර සංක්ෂේපය**

එදිරිවීර සරච්චන්ද්‍ර (1914-1996) හා සුනිල් සාන්ත (1915-1981) යන දෙදෙනා ම ලංකාව තුළ ස්වදේශික සංස්කෘතියක් නිර්මාණය කිරීම විෂයෙහි වෙහෙස වූ දෙ දෙනෙකි. සුනිලුන් දේශීය සංගීතයක් තැනීම සඳහා ද සරච්චන්ද්‍රයෝ දේශීය නාට්‍යයක් තැනීම සඳහා ද වෙහෙස වූහ. සුනිල්ශාන්ත 1946 දී 'ඕලු පිපීලා' ගීතය නිර්මාණය කරමින් සංස්කෘතියට මැදිහත් වූ අතර සරච්චන්ද්‍ර විසින් 'මුදලාලිගේ පෙරළිය'නාට්‍ය නිර්මාණය කරමින් 1943 දී සිය මැදිහත්වීම අරඹන ලදි. මේ දෙදෙනා ම කතෝලිකයන් වූ අතර කරාව කුලයට අයත් වූවෝ ය. දෙදෙනා ම මුලින් ඉංගිරිසි නම් දරා සිට පසුව ඒවා වෙනස් කරත්තෝ වූහ. දෙදෙනා ම ශාන්ති නිකේතනයේ ආදි ශිෂ්‍යයෝ ද වෙත්. සංගීතය ස්වදේශීකරණය කිරීමේ දී ලොව ඇති සියලු ම පොහොසත් සංගීත සම්ප්‍රදායන්ගෙන් ආභාසය ලබාගෙන ජාතික සංගීතයක් නිර්මාණය කළ යුතු ය යන ආස්ථානයෙහි සුනිලුන් පිහිටා සිටියේ ය. ඒ නිපදවන සංගීත ක්‍රමය විදග්ධ, ශාස්ත්‍රීය එකක් නොව සරල පොදු ජන සංගීතයක් විය යුතු ය යන මතයේ හේ තර ව පිහිටා සිට ඇත. දේශීය සංගීතය භාරතීය රාගධාරී සංගීතය අනුව යන ශාස්ත්‍රීය වූවක් විය යුතු ය යන්න සරච්චන්ද්‍ර දැරූ මතය යි. එහෙත් ඔහු දේශීය නාට්‍ය සම්බන්ධයෙන් දැරූ මතය මීට වෙනස් වූවකි. ඔහු ඒ පිළිබඳ දැරූ ආකල්පය වූයේ කලාපීය සංස්කෘතියේ ආභාසයෙන් පොදුජන සංස්කෘතිකාංග ඇසුරුකොටගෙන විදග්ධ සංස්කෘතියක් නිර්මාණය කළ යුතු ය යන්න යි. ඒ සංස්කෘතිය වින්දනය කිරීමේ හැකියාව පොදු ජනයාට නැති අතර පොදු ජන වින්දන මට්ටම හා ඔවුන්ගේ සංස්කෘතිය පහත් එකකි යන්න ඔහුගේ ආකල්පය විය. අධ්‍යාපන හා සංස්කෘතික බලධාරීන් හා පෞද්ගලික ව සම්බන්ධකම් පැවැත්වූ සරච්චන්ද්‍ර ඉතා සූක්ෂ්ම ලෙස සුනිල් සාන්ත අකර්මන්‍ය කර දැමීම කරයි. 1952 දී රතන්ජංකර් පරීක්ෂණය මඟින් ඒ කාර්ය සමාප්ත කොට සුනිල් සාන්තගේ ස්වදේශීකරණ භාවිතය නතරකර දමනු ලබයි. ඒ වෙනුවට අමරදේව මූලික කොටගත් විදග්ධ ගායන ක්‍රමයක් නිර්මාණය කරයි. එ මඟින් සරල ගී සංස්කෘතියක් ස්ථාපනය විය. 1967 දී නැවත සුනිලුන් ගුවන්විදුලියට පැමිණිය ද ඒ වන විට ඔහුගේ ගමන යා නො හැකි වන පරිදි මඟ අහුරා හමාර කොට තිබුණි. ඒ වන විටත් අමරදේව විසින් සරච්චන්ද්‍ර ඇඟයූ සංගීත භාවිතය ස්ථාපිත කොට තිබිණ. ස්වදේශීකරණය පිළිබඳ මේ ප්‍රවේශ දෙක හෙළ හවුල හා විශ්වවිද්‍යාලය අතර ගැටුමක් ලෙස ද එවක අර්ථ ගැන්වී ඇත. මේ සම්බන්ධයෙන් පුවත්පත් ලිපි හා පොත් රාශියක් ද සම්පාදනය වී තිබේ. එමෙන් ම මොවුන් ඇසුරු කළ බොහෝ පිරිසක් තවමත් සිටිති. ලේඛනගත මූලාශ්‍රය හා පුද්ගල සාකච්ඡා මඟින් ලබාගත් තොරතුරු අධ්‍යයනයට මූලාශ්‍රය වේ.

**ප්‍රමුඛ පද :** ඉන්දියානුකරණය, දේශීය සංගීතය, ස්වදේශීකරණය, සරච්චන්ද්‍ර, සුනිල් සාන්ත.

SSS46

# සිංහල සංස්කෘතියේ යාතුකර්මවල ජලය හා බැඳුණු පාරිශුද්ධ සංකල්පය පිළිබඳ අධ්‍යයනයක් (දකුණු පළාත ඇසුරින්)

සී.එම්.ඒ. අබේරත්න (බී.ඒ. කොළඹ)
සහකාර කථිකාචාර්ය
සිංහල අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
chathurika.abeyrathna@yahoo.com

**සාර සංක්ෂේපය**

මානව සමාජයේ සාමාජිකයෙකු වශයෙන් මිනිසා අත්පත් කරගත් දැනුම, විශ්ව කලා, සාරධර්ම, නීතිය, සිරිත් විරිත්, ආගම හා වෙනත් හැකියා යනාදියේ සමස්තය සංස්කෘතිය යි. මිනිසාට තමන්ගේ පාලනයට නතු කර ගත නො හැකි බලවේග දමනය කිරීමට දැරූ ප්‍රයත්නයක් වශයෙන් ඇදහිලි හා විශ්වාස බිහි විය. ස්වභාවික උපද්‍රව ජය ගත නො හැකි වූ ජනයා ඒවා තමන්ට අවශ්‍ය පරිදි ක්‍රියාකරවීමට දැරූ ප්‍රයත්නයක් ලෙස යාතුකර්ම බිහිකර ගත් බව සඳහන් කළ හැකි ය. ස්වභාව ධර්මයේ බලවේග වර්ණනා කිරීමෙන්, ඒවාට පුද පූජා පැවැත්වීමෙන් හා නැටුම්, වැයුම්, ගැයුම් ආදිය කිරීමෙන් එම බලවේග ජයගැනීමට උත්සාහ කිරීම යාතුකර්මවල මූලික ලක්ෂණය යි. ග්‍රාමීය සමාජයේ පැවැත්වෙන යාතුකර්ම බෙහෙවින් ලෙඩරෝග නිවාරණය සඳහා සම්බන්ධ වන්නේ ය. එම රෝග යක්ෂයන් හා භූතයන් මුල් කර ගෙන හටගන්නා බව විශ්වාස කෙරෙන අතර රෝගියා කෙරෙහි මානසික වශයෙන් ද බලපෑමක් ඇති කරයි. බුදු සමය පමණක් නොව පොදු ජනයාගේ වන්දනාමානයට පාත්‍ර වූ දේව ධූරාවලිය කේන්ද්‍ර කර ගනිමින් ද යාතුකර්ම පැවැත්වීම ජන සමාජයේ පවත්නා තවත් එක් විශේෂත්වයකි. දකුණු පළාතට ආවේණික යාතුකර්ම අතර යක් තොවිල්, දියකැපීම ආදී මහා පරිමාණ යාතුකර්මත්, දෙහි කැපීම, යන්ත්‍ර මන්ත්‍ර පැළඳවීම, ප්‍රේත පිදේනි පිදීම ආදී චූල පරිමාණ යාතුකර්මත් පැවැත්වේ. මෙම යාතුකර්මවල විශේෂත්වය වන්නේ ජලය පාරිශුද්ධ වස්තුවක් ලෙස භාවිත කිරීම යි. මෙහි දී කිල්ල මැඩපැවැත්වීමේ මාධ්‍යයක් හා විෂබීජ නාශකයක් වශයෙන් ජලය භාවිත කිරීමේ සම්ප්‍රදායක් පවතී. මේ අයුරින් මානවයාගේ මූලික අවශ්‍යතාවක් හා ස්වභාවික සම්පතක් සේ සලකන ජලය යාතුකර්මවල දී භාවිතයට ගැනීමෙන් එහි සමාජයීය හා සංස්කෘතික වැදගත්කම සනාථ වෙයි.

**ප්‍රමුඛ පද :** ජලය, පාරිශුද්ධ සංකල්පය, යාතුකර්ම, සිංහල සංස්කෘතිය.

SSS48

# Knowledge transferring landscape: study of nature responding quality in vernacular landscape architecture with spatial reference to ritigala

T.M.N. Gunathilaka
**Faculty of Architecture**
k.prabhashini@gmail.com

**Abstract**

Development and change in historical landscapes cannot be avoided. Nonetheless, conservation cannot be neglected either, since it holds the responsibility for preserving the proud history, image, spirit of place and ancient, traditional knowledge base these historic locations embody. However there can be conflicting situations with such developments adversely affecting its ability to transfer authentic knowledge to the present. Understanding the parameters which need to be preserved in order to support knowledge transferring ability of a historical landscape will be a plus point during these inevitable processes of development and conservation for the future generations to have a real image about the past.

The existing literature suggests that landscapes have the ability of transferring knowledge to the contemporary users. The study hypothesized that the quality of responding and designing in harmony with nature in ancient designing is a means of transferring knowledge of its history to present generations. Ritigala, which was built according to natural factors and components having less modifications and disturbances due to development has been investigated as a case study.

Theoretical framework was builtby using the philosophy of empiricism, theories of landscape and knowledge transformation,Kaplan's information processing theory and Kevin Lynch's imageability concept. As identified by the pilot survey, most of the Sri Lankan visitors demonstrated to have a pre-conceived knowledge about Ritigala, before visiting the site. Thus, foreign visitors having a lesser knowledge about Ritigalawere selected as respondents of the final questionnaire survey for valid results.

The study revealed that the nature responding quality which was adopted during the design and construction of Ritigala has clearly affected its ability to communicate with the visitors as a medium of knowledge transfer. It is recommended to conduct further studies considering other vernacular landscape parameters such as influence of Buddhism and influence of India.

**Keywords**: Landscape, Knowledge transformation, Vernacular landscape, Empiricism

SSS48

# ජාතක පොතෙන් නිරූපිත සමාජ සාරධර්ම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

(දස පාරමිතාවන්ට අදාළ ජාතක කතා දහයක් ඇසුරෙන්)

පූජ්‍ය දෙල්තර ඥානානන්ද හිමි
gdelthara1@gmail.com

ඕ.වී.පී. යසෝදරා කුලරත්න
yashodavidhanapathirana@gmail.com

**සාර සංක්ෂේපය**

"පන්සිය පනස් ජාතක පොත්වහන්සේ" යන අභිධානයෙන් හඳුන්වන ජාතක පොත ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි සභ්‍යත්වය කෙරෙහි ලැබී ඇති පිටුබලය ඉමහත් ය. සිංහල සාහිත්‍යයේ ලෝක සාහිත්‍යයට එක් විය යුතු එක ම ග්‍රන්ථය වන්නේ මෙම 'ජාතක පොත' ය යන්න මහා ගත්කරු මාර්ටින් වික්‍රමසිංහයන්ගේ අදහස යි.

"....ලෝක සාහිත්‍යයෙහි ඇතුළු විය යුතු සිංහල පොතක් වෙතොත් එය ජාතක පොත හැර අනිකක් නොවේ......"

එසේ පැවසීමට හේතු වී ඇත්තේ විවේක බුද්ධියෙන් යුක්ත ව ජාතක කතා කියවන්නෙකුට දුර්ලභ ජීවිත පරිඥානයක් ලද හැකි වීම යි. රීස් ඩේවිස්, වින්ටර්නීට්ස් වැනි බටහිර විද්වතුන් පවා ජාතක පොත උසස් සාහිත්‍යාංගයක් සේ සලකා ඇත. මෙසේ සිංහල ජාතක පොත දෙස්-විදෙස් සම්භාවනාවට පාත්‍ර ව ඇත්තේ එහි පවත්නා සාහිත්‍යමය අගය පමණක් ම සැලකීමෙන් නොවේ. එයින් සමාජ සදාචාර වර්ධනයට ලැබෙන ඉමහත් දායකත්වය ද සැලකීමෙනි.

ජාතක පොතෙහි එන පන්සිය පනහකට ආසන්න වූ ජාතක කතා අතරින් සමහරක් දස පාරමිතා විස්තර කිරීමට භාවිත කොට තිබේ. දස පාරමිතා ප්‍රකට කිරීමේ අරමුණ ම මුල් කොට ගෙන රචිත ජාතක කතා පනස් අටක් පමණ වේ. දස පාරමිතා එනම් දානය, සීලය, නෙක්ඛම්මය, ප්‍රඥාව, වීර්යය, ඉවසීම, සත්‍යවාදීත්වය, අධිෂ්ඨානශීලීත්වය, මෛත්‍රී සහගත බව සහ උපේක්ෂාව යන යහපත් සදාචාර ධර්ම ඔප්නංවා ඒවා සමාජ සාරධර්මයන් හා මුසු කිරීමට ජාතක කතාකරුවා උත්සාහ ගෙන තිබේ. එසේ ම කළ ගුණ සැලකීම, ප්‍රිය වචන කතා කිරීම, ගුරු ගෞරවය, දෙමාපියන්ට සැලකීම, පතිව්‍රතාව, පංචශීල ප්‍රතිපදාව ආදී අන්‍යතර සාරධර්මීය ගුණ දහම් ද ජාතක කතාවන්ගෙන් විශද කොට ඇත්තේ ය.

**මුඛ්‍ය පද :** ජාතක කතා, දස පාරමිතා, සමාජ සාරධර්ම.

SSS50

# නීතිය ඉගැන්වීමට භාවිත කෙරෙන පාරිභාෂික වචන (සිංහල) පිළිබඳ නීතිය හදාරන විද්‍යාර්ථීන් තුළ පවතින අවබෝධය පිළිබඳ පරීක්ෂාවක්

වයි.ඩී. ප්‍රියංකර
සහකාර කථිකාචාර්ය
සිංහල අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
priyankarayd@gmail.com

**සාර සංක්ෂේපය**

භාෂාවක උපයෝගීතාව කාලීන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි ඉහළ නැංවීමේ අරමුණින් පාරිභාෂික පද සම්පාදනය කෙරෙයි. පාරිභාෂික පද සම්පාදනය වීම ද සමකාලීන සමාජ, ආර්ථික, දේශපාලන පසුබිමෙහි බලපෑම්හි ප්‍රතිඵල බව පෙනෙයි. සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් වීමේ අවධියෙහි සිංහල භාෂාවට මේ අයුරින් එකතු වූ පාරිභාෂික පද රැසක් අද වන විට උසස් අධ්‍යාපන කටයුතු සඳහා භාවිතයට ගැනීමේ ප්‍රවණතාව අඩු වී ඇත. එම පාරිභාෂික පද සම්පාදනය වූ අවධියෙහි පැවති සමාජ අවශ්‍යතා අද වන විට වෙනස් වී තිබීම මෙම ප්‍රවණතාවට හේතුවක් බව සඳහන් කළ හැකි ය. සිංහල මාධ්‍යයෙන් නීතිය හදාරන විද්‍යාර්ථීහු ගැඹුරු නීතිමය කරුණු පවා ඉංග්‍රීසි මාධ්‍යයෙන් අවබෝධ කර ගැනීමට වැඩි නැඹුරුවක් දක්වති. සිංහල මාධ්‍යයෙන් යෙදෙන නීතියට අනුබද්ධ පාරිභාෂික පද පිළිබඳ ඔවුන් තුළ පවතින්නේ අඩු අවබෝධයකි. අනාගත වෘත්තීය කටයුතු සඳහා සිංහල පාරිභාෂික පද පිළිබඳ පෘථුල අවබෝධයක් අවශ්‍ය නො වීමත්, ඉංග්‍රීසි භාෂාවට සමාජයේ පවතින දැඩි ඉල්ලුමත් නිසා නීති විෂයට අනුබද්ධ පාරිභාෂික පද සිංහල මාධ්‍යයෙන් භාවිතය සීමා වී ඇති බව මෙම පර්යේෂණය මඟින් හෙළිදරව් විය.

**ප්‍රමුඛ පද :** ඉංග්‍රීසි භාෂාව, නීති අධ්‍යාපනය, පාරිභාෂික පද, භාෂාවේ උපයෝගීතාව.

SSS51

# ආරම්භක නව යොවුන්වියෙහි සිසුන් ඩිජිටල් මෙවලම් භාවිතය: කියවීමේ රුචිකත්වයට සිදු කරන බලපෑම

එනෝකා රන්දෙනිය
අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

කල්‍යාණි විජේසුන්දර
ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
wijesuwmk@yahoo.com

**සාර සංක්ෂේපය**

ළමා සංවර්ධන අවධි අතර ආරම්භක නව යොවුන්වියට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. මෙම අවධියෙහි පසුවන සිසුන් වියුක්ත චින්තනය ඇසුරින් තම බුද්ධිමය හැකියා වර්ධනයට කියවීම කෙරෙහි දක්වන රුචිකත්වය ඉතා වැදගත් මෙහෙවරක් ඉටු කරයි. නමුත් වර්තමානය වන විට නොයෙක් හේතු නිසා ආරම්භක නව යොවුන් විය සිසුන්ගේ කියවීමේ රුචිය අඩු වීමක් දක්නට ලැබීම බලවත් ඛේදවාචකයකි. මේ සඳහා ඩිජිටල් මෙවලම් භාවිතයට පැමිණීමත් සමඟ යම් ආකාරයක බලපෑමක් සිදුව පවත්නා බව දැකිය හැකි වේ. නමුත් ලෝකයේ මේ විවිධ දෘෂ්ටිකෝණ ප්‍රකාර ව ඩිජිටල් මෙවලම් භාවිතය ළමුන්ට සිදු කරන බලපෑම පිළිබඳ විවිධ මට්ටමින් පර්යේෂණ සිදු කර ඇති නමුත් ශ්‍රී ලංකාවේ මේ සම්බන්ධිත පර්යේෂණ සිදු කිරීම අවම මට්ටමක පවතී. මේ නිසා මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වනුයේ ආරම්භක නව යොවුන් වියෙහි පසුවන සිසුන් ඩිජිටල් භාවිතයට යොමුවීම ඔවුන්ගේ කියවීමේ රුචිකත්වයට බලපෑමක් සිදු කෙරේ ද යන්න අධ්‍යයනය කිරීම යි. මිශ්‍රිත පර්යේෂණ එළඹුමට යටත් ව ක්‍රියාත්මක මෙම අධ්‍යයනයේ දී සහේතුක නියැදිකරණය යටතේ ඩිජිටල් මෙවලම් භාවිත කරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් දෙසියයක් නියැදියක් හා උප නියැදි වශයෙන් දෙමව්පියන් විස්සක් ද ගුරුවරුන් විස්සක් ද යොදා ගැනේ. මෙහි දී දත්ත රැස්කිරීමේ විධික්‍රම වශයෙන් ප්‍රශ්නාවලී හා සම්මුඛ සාකච්ඡා භාවිත කෙරේ. දත්ත විග්‍රහකිරීම සහ අර්ථකථනය ප්‍රමාණාත්මක සහ ගුණාත්මක විධික්‍රමවලට අනුව සිදු කෙරේ. මෙම අධ්‍යයනයේ දී කියවීමේ රුචිකත්වය අඩුවීම කෙරෙහි ඩිජිටල් මෙවලම් භාවිතය බලපෑමක් පවත්නා අතර ඉහළ බලපෑමක් පෙන්නුම් කෙරෙනුයේ ශිෂ්‍ය පාර්ශ්වයට වීම විශේෂත්වයකි. තව ද මතු වූ තේමා වශයෙන් දෙමව්පියන් ළමයින් වෙනුවෙන් කියවීම, සිසුන් පාඩම් කිරීමට ඩිජිටල් මෙවලම් යොදා ගැනීම, ශබ්ද නගා කියවීම සතුටුදායක නො වීම ආදිය පෙන්වා දිය හැකි වේ. මෙම නිසා ආරම්භක නව යොවුන්වියෙහි සිසුන්ට ඩිජිටල් මෙවලම් භාවිතයට පවත්නා ඉඩ ප්‍රස්තා අවම කිරීමට කටයුතු සම්පාදනය කළ යුතු අතර කියවීමේ රුචිකත්වය වර්ධනය සඳහා සුදුසු ක්‍රමෝපායන් දෙමාපියන් සහ ගුරුවරුන් සිදු කළ යුතු ය.

**ප්‍රමුඛ පද:** ආරම්භක නව යොවුන්විය, ඩිජිටල් මෙවලම්, මිශ්‍රිත පර්යේෂණ එළඹුම, සිසුන්.

SSS54

# කුමාරතුංග මුනිදාසගේ භාෂා සැලසුම්කරණ ප්‍රයත්නය පිළිබඳ සිංහල හදාරනු ලබන විද්‍යාර්ථීන්ගේ අවබෝධය පිළිබඳ ප්‍රත්‍යෙක අධ්‍යයනයක්

පූජ්‍ය තිඹිරිවැව සිරිසුමන හිමි
සිංහල අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
tsthero@gmail.com

නාලක ජයසේන
සිංහල අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
nalakadnamma@gmail.com

**සාර සංක්ෂේපය**

සිංහල භාෂාවේ ව්‍යුහය අධ්‍යයනය කොට ඊට හුදු හෙළ ස්වරූපය අනුබද්ධකරණයට මතවාද සම්පාදනය කළ චින්තනකයකු වන කුමාරතුංග මුනිදාසයන්ගේ (1887-1944) මෙහෙවර බහුමානයකින් හඳුනාගත හැකි අතර භාෂා ප්‍රතිසංස්කරණයෙහි ලා ඔහුගේ නායකත්වය වාග්විද්‍යාත්මක ව හඳුනාගත හැක්කේ භාෂා සැලසුම්කරණ ප්‍රයත්නයක් (Language Planning) වශයෙනි. එ මඟින් සැලසුම් කළ භාෂාවක් (Planned Language) බවට සිංහලය පත්කරන්නට ඔහු උත්සාහ කෙළේ ය. මානව භාෂාවේ සජීවීත්වය එම භාෂකයන්ගේ භාෂා භාවිතයට සාපේක්ෂ වන අතර සිංහල භාෂාවට ද එය පොදු වෙයි. කුමාරතුංග මුනිදාස හෙළි කළ භාෂා සම්ප්‍රදාය කොතෙක් දුරට සිංහල විශේෂ උපාධිය හදාරනු ලබන විද්‍යාර්ථීන් විසින් අවබෝධ කරගෙන තිබේ ද යන්න සම්මර්ශනය මෙම පර්යේෂණයෙහි මුඛ්‍ය අරමුණ යි. මෙම පර්යේෂණයේ දී වාග්විද්‍යාඥයකු වන මෝෂේ නහීර් විසින් ඉදිරිපත් කරනු ලැබූ භාෂා සැලසුම්කරණයේ ප්‍රාථමික අංශ පහ වන භාෂා පාරිශුද්ධත්වය (Purification) පුනර්වනය (Revival)ප්‍රතිසංස්කරණය (Reform)සම්මතකරණය (Standardization)වාක්කෝෂය නව්‍යකරණය (Lexical Modernization) කුමාරතුංග කෙරෙන් ද විද්‍යමාන බැවින් ඔහු ද භාෂා සැලසුම්කරුවකු වශයෙන් හඳුනාගනු ලැබෙයි. මෙම අධ්‍යයනයේ දී සාහිත්‍ය විමර්ශනය සඳහා සඳගෝමී කෝපරහේවා, ධර්මා රාජපක්ෂ, බෙම්තොට එනුලාසිරි ධර්මවර්ධන යන අයගේ කෘතිවල නිරූපිත භාෂා සැලසුම්කරණයට අදාළ කරුණු භාවිත කෙරේ. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් අගනුවර කේන්ද්‍ර කරගත් විශ්වවිද්‍යාලයක එක් වසරක සිංහල විශේෂ උපාධි අපේක්ෂක විද්‍යාර්ථීන්ට ලබා දුන් ප්‍රශ්නාවලියක දත්ත ප්‍රමාණාත්මක ව විග්‍රහ කරනු ලැබේ. ප්‍රශ්නාවලිය විවෘත හා ආවෘත යන ස්වරූපද්වයෙන් යුතු ප්‍රශ්න දහයකින් යුක්ත ය. එක් පන්ති කාමරයක සිටින ශිෂ්‍ය සමූහය පමණක් පර්යේෂණයට නතු වූ නිසා මෙය නියමු පර්යේෂණයකි (pilot study). පර්යේෂණ ගැටලුව වශයෙන් කුමාරතුංගයන්ගේ භාෂා සැලසුම්කරණය වත්මන් විද්‍යාර්ථීන්ගේ නිසි අවධානයට ලක්ව තිබේ ද ? යන්න යි.

**ප්‍රමුඛ පද :** කුමාරතුංග මුනිදාස, නවෝක්ති, භාෂා සැලසුම්කරණය.

SSS56

# **වීරයා, සමාජය සහ රාජ්‍ය දෘෂ්ටිවාදය:** කුඹියෝ ටෙලිනාට්‍ය සහ සමාජ මාධ්‍ය ඇසුරෙන් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්

නලින් ගල්කන්දආරච්චි
පශ්චාත් උපාධි අපේක්ෂක
දෘශ්‍ය කලා පීඨය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
nalingalkandaarachchi@gmail.com

**සාර සංක්ෂේපය**

සමකාලීන සිංහල සමාජයේ තිරයේ වීරයාගේ භූමිකාව මීට පෙර ශතවර්ෂයේ සිංහල සමාජයේ රිදී තිරයේ වීරයාගේ භූමිකාවට සාපේක්ෂ ව වෙනස් බැව් දැකිය හැකි ය. එමෙන් ම අද වන විට රිදී තිරය සහ පුංචි තිරය හෙවත් ටෙලි තිරය ද අතික්‍රමණය කරමින් ඩිජිටල් තිරය පැමිණ තිබේ. එකිනෙකා සජීවී ව හමු වන සමූහ පොදු ප්‍රේක්ෂක අවකාශ වෙනුවට ඩිජිටල් ප්‍රේක්ෂකයා, අතථ්‍ය (Virtual) අවකාශයක මුණගැසෙනු ඇත. එසේ ම රාජ්‍ය යාන්ත්‍රණයේ දෘෂ්ටිවාදය මේ සෑම අවකාශයක් තුළ ම ක්‍රියාත්මක වෙමින් පවතී.

මේ සියල්ලේ අන්තර් ක්‍රියාකාරීත්වය සහ එහි ප්‍රතිඵල, සමකාලීන සමාජය මත ක්‍රියා කරන ආකාරය ද, තිරයේ ආඛ්‍යානගත වීරයාගේ භූමිකාව මගින් ගොඩනඟන නළුවාගේ සමාජ ප්‍රතිරූපය කෙරෙහි බලපාන ආකාරය ද විමර්ශනය කිරීම මේ පර්යේෂණයේ ලා සිදු කිරීමට නියමිත ය.

**මුඛ්‍ය පද :** අතථ්‍ය අවකාශය, ආඛ්‍යානය, ප්‍රතිරූප, ඩිජිටල් ප්‍රේක්ෂකයා, රාජ්‍ය දෘෂ්ටිවාදය, වීරයා, සමාජ මාධ්‍ය.

SSS57

# A critical analysis on Buddhist theory of Momentariness which was challenged by *Bādarāyaṇa*(with reference to Brahma sutra).

Rev. Pepiliyawala Narada
Assistant Lecturer
Department of Pāli and Buddhist studies
University of Kelaniya
pepiliyawalanarada@gmail.com

Dr. W.A Gamini Wijayasinghe
Senior Lecturer
Department of Pāli and Buddhist studies
University of Kelaniya
gwgamini@gmail.com

**Abstract**

The universal reality was revealed by Lord Buddha with the purpose of guiding the society to liberation. Since at the beginning of Buddhism Buddha he himself gave the permission for his own disciples to examine the teachings of Blessed one's. The Buddha's advice was, even at the assembly of monks they should engage in doctrinal discussion or be silence. Later after the demise of Buddha this trend gave emerge for various stands points for Buddhist teachings as we recognize as Buddhist sects. Mainly the basic doctrinal teaching were interprited more logically and academically in these Buddhist sects. The universal theories were defined by Buddha on this purpose was misunderstood by some scholars and their interpretations of these theories lead to great confusion. Bādaryāna was such a scholar whose opinion regarding Buddhist Theory of momentariness is a misinterpretation and unjustifiable. The concept of impermanence which was elaborated by birth, decay and death of mind and matter found in early Buddhism based the theory of momentariness later was well expanded by Abhidhamma traditions. All formations in the universe emerge in a moment, exist in a moment, and perish in a moment and it is a continuous process. Nevertheless, Bādarāyana by misunderstanding the theory of momentariness criticized it as a non-logical and non-scholastic Buddhist teaching. Therefore, this research will reach a reliable and logical conclusion by challenging the critical comments of Bādarāyaṇa against the Buddhist theory of momentariness.

This is a qualitative research based on primary and secondary sources. The pali canon. commentaries, Theravada Abhidhamma text, SarvāstivādaAbhidhamma text and Brahma sutra of Bādarāyana are referred under Primary sources. Similarly, academic journals, Buddhist encyclopedia, reliable internet sources are referred under secondary source.

**Keywords:** Buddhism, Formation, Subject to change, Momentariness, Bādarāyaṇa

SSS58

# අතීත උඩරටවෙස් ඇඳුමේ බහුවිධ ස්වරූප:උඩරට නැට්ටුවන්ගේ පැරණිම ඡායාරූප ඇසුරෙන් කෙරෙන අධ්‍යයනයක්

සුදේශ මන්තිලක
ලලිතා කලා අධ්‍යයනාංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**සාර සංක්ෂේපය**

උඩරට වෙස් ඇඳුම යන පදය ඇසූ සැනින් කෙනෙකුට මැවෙන්නේ සුදු වර්ණයෙන් යුත් ඇඳුමකි. එය සුදු රැළි බහුල ඇඳුමක් වන අතර අදවන විට එහි ස්වේත වර්ණය වෙස් ඇඳුමේ අනන්‍යතා ලක්ෂණයක් බවට ද පත් වී ඇත. ඇතැමුන් සිංහල ජාතික අනන්‍යතාව විදහා දැක්වීමට මෙම වෙස් ඇඳුම භාවිත කරන අතර, ඇතැම් සිංහලයන් බලාපොරොත්තු වන තැන එයට ලබා නො දීම ලේ සොලවන ගැටුම් පවා ඇති කිරීමට හේතුවක් වී ඇත. මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වන්නේ, වර්තමානයේ වෙස් ඇඳුමේ සුදු වර්ණය අනන්‍ය ලක්ෂණයක් වී ඇතත්, අතීතයේ එය බහුවිධ ස්වරූපවලින් පැවත පරිණාමය වී ඇතිබව පෙන්වා දීම යි. බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ ගන්නා ලද උඩරට වෙස් නැට්ටුවන් විෂය කරගත් පැරණි ම ඡායාරූප සහ ඓතිහාසික මූලාශ්‍රය ආශ්‍රයෙන් මෙම අධ්‍යයනය සිදු කෙරේ.

**ප්‍රමුඛ පද :** උඩරට වෙස් ඇඳුම, ඓතිහාසික මූලාශ්‍රය, ඡායාරූප, යටත් විජිත සමය, වෙස් නැට්ටුවන්.

SSS59

# සැලේ සැලේ මහද සැලේ
# ටෝනි : හැටේ දශකයේ මනස් පුතාගේ සිනමා රංග ප්‍රකාශකයා

අතුල සමරකෝන්

## සාර සංක්ෂේපය

සිංහල සිනමා රංගනය ඉතිහාසයේ ටෝනි රණසිංහ නම් රංගන වේදියාට සුවිශේෂ ස්ථානයක් හිමි වෙයි. මානසික සංකීර්ණතාවලින් පෙළෙන පුද්ගලයන්ගේ චරිත නිරූපණයේ දී ඔහු සුවිශේෂ කුසලතාවක් පෙන්වූ බව බොහෝ දෙනාගේ මතය යි. හැටේ දශකයේ දී ටෝනි රණසිංහ නිරූපණය කළ චරිත කිහිපයක්, එම යුගයේ ම සිංහල සාහිත්‍යයේ නිරූපණය වූ චරිත කිහිපයක් අතර සම්බන්ධතාවය හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අපේක්ෂාව යි. මෙයින් මතුකරන තර්කය වන්නේ හැටේ දශකයේ දී ටෝනි රණසිංහ සිය රංග කුසලතාවන් භාවිතා කොට නිරූපණය කළේ, එම යුගයේ ම සාහිත්‍යයක නිර්මාණවල මතු වූ, මනෝ සංකීර්ණතා පිළිඹිබු කළ චරිතයේ ම සමාන හැඩයක් සහිත චරිත බව යි. එනම් සිංහල සාහිත්‍යයේ නිරූපණය වූ මනෝ සංකීර්ණතා සහිත චරිතයේ සිනමා ප්‍රකාශකයා /නියෝජිතයා ටෝනි රණසිංහ බව යි. මෙහි දී ඔහු නිරූපණය කළ චරිතවල ස්වභාවය නිරීක්ෂණය කරනවා මිස ටෝනි රණසිංහගේ රංග ප්‍රකාශන විලාසය ගැන අදහස් දැක්වීමක් සිදු නො කෙරේ. සිනමා රංගනය, සිංහල සිනමාවේ රංගනය, ටෝනි රණසිංහ ගේ සිනමා පිවිසුම, සිංහල සාහිත්‍යයේ මනෝ විද්‍යාත්මක නවකතාව, මනෝ මූලවාදී සිංහල සිනමාව වැනි අංශ ගැන අවධානය යොමු කරමින් මෙම පර්යේෂණයේ දී එකී අදහස ඉදිරිපත් කෙරෙයි. මනෝ සංකීර්ණතා විෂය කරගත් හැටේ දශකයේ නවකතාව, චරිත, එම යුගයේම තිරගත වූ චිත්‍රපටිවල ටෝනි රණසිංහ නිරූපණය කළ චරිත සැසඳීම මෙම පර්යේෂණය සඳහා ක්‍රමවේදය ලෙස භාවිත කෙරිණ.

**ප්‍රමුඛ පද:** ටෝනි රණසිංහ, මනෝ විද්‍යාත්මක නවකතාව, සිංහල, සිනමා රංගනය.

# පෝස්ටර්*

# Posters

*සිවුවන වසර සිංහල විශේෂ උපාධි අපේක්ෂකයන්ගේ යෝජිත උපාධි නිබන්ධන ඇසුරිනි

SSSP01

# සිංහල අක්ෂර හා බැඳුණු සිරිත් විරිත් හා විශ්වාස පද්ධතිය පිළිබඳ අධ්‍යයනයක්

ඩබ්ලිව්.අයි. දේශානි

අක්ෂර යනු භාෂණ සමාජයක අවශ්‍යතාවය මත නිර්මාණය කරගත් මෙවලමකි. ඒ අනුව ලේඛනගත කිරීමේ කාර්යේ දී අක්ෂරය වැදගත් විය. මේ අයුරින් විවිධ භාෂක සමාජයන් අක්ෂර නිර්මාණය කරගෙන ඇති අතර සිංහල සමාජය ද සිංහල අක්ෂරය නිර්මාණය කරගෙන තිබේ. සිංහල භාෂාව නැමති විෂය ක්ෂේත්‍රය ඔස්සේ යමින් අක්ෂරය නම් වූ මෙවලම පිළිබඳ ව මෙ මඟින් අධ්‍යයනය කරයි.

සමාජ සංවිධානයේ දී මිනිසා සතු ව පවතින ආචාරධර්ම පද්ධතිය සිරිත්විරිත් හා විශ්වාස පද්ධතිය ලෙස හඳුන්වන අතර සමාජයේ සංස්කෘතිය සකස් වීම සඳහාත් ඉදිරි ප්‍රගමනය සඳහාත් මෙය ඉමහත් පිටුවහලක් වෙයි. මෙ මඟින් සංස්කෘතිය නම් වූ පර්යේෂණ ක්ෂේත්‍රය ඔස්සේ අධ්‍යයනය මෙහෙයවයි.

ඒ අනුව සිංහල අක්ෂර හා බැඳුණු සිරිත් විරිත් විශ්වාස පද්ධතිය යන පර්යේෂණය භාෂාව හා සංස්කෘතිය යන ක්ෂේත්‍ර ඔස්සේ දියත් වන අතර මෙම අධ්‍යයනයේ දී මෙකී කරුණු දෙක දෙස ම අවධානය යොමු කරනු ඇත.

SSSP02

# සයිමන් නවගත්තේගම පිළිබඳ සාහිත්‍ය මානවවංශවේදී අධ්‍යයනයක්

ඩී.එම්.ඩී.සී. දිසානායක

ලංකාවේ සාහිත්‍ය කලාවේ අල්ප වශයෙන් පර්යේෂණයට ලක්වුණු සයිමන් නවගත්තේගම ඒකාංශික නිර්මාණකරුවෙක් වශයෙන් පමණක් සාහිත්‍යය කලා ක්ෂේත්‍රය තුළ සාකච්ඡාවට ගතහැකි නො වේ. එයට හේතුව ඔහුගේ නිර්මාණ බහු අංශික පදීතයන් ඔස්සේ විහිදී තිබීම යි. නවගත්තේගම කෙටිකතාකරුවෙකු, නාට්‍ය රචකයෙකු, නාට්‍ය අධ්‍යක්ෂකවරයෙකු, ගුවන් විදුලි නාට්‍ය රචකයෙකු, විචාරකයෙකු , පරිවර්තකයෙකු, චිත්‍රපට නළුවෙකු, නාට්‍ය නළුවෙකු වශයෙන් නොයෙකුත් අංශයන්හි නිරත වූ නිර්මාණකරුවෙකු බව ඉතා පැහැදිලි කරුණකි.

නවගත්තේගම බොහෝ කලාකරුවන්ගෙන් වෙනස් ව කැපී පෙනෙන්නට හේතුවක් නම් කලාව හා සම්බන්ධ බොහෝ වපසරියන් පිළිබඳ ව ප්‍රත්‍යක්ෂ දැනුමෙන් ම කටයුතු කළ අයෙකු බැවිනි. සයිමන් නවගත්තේගමගේ සාහිත්‍යය සහ ඔහුගේ සමාජ, ජීවිත පසුබිම එකට එක් කරමින් ඒ පිළිබඳ ව අධ්‍යයනයක යෙදීමට"සයිමන් නවගත්තේගම පිළිබඳ සාහිත්‍ය මානවවංශවේදී අධ්‍යයනයක්" යන මෙම පර්යේෂණ මාතෘකාවෙන් අදහස් කෙරේ. එහි දී නවගත්තේමට නිර්මාණකරණය සඳහා පසුබිම් වූ දේශපාලනික, සමාජික හා සංස්කෘතික කාරණාවන් විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීමක් සිදු වේ.

SSSP03

# සිංහල පුවත්පත් කලාවේ බී.ඒ. සිරිවර්ධනගේ කතුවැකි පිළිබඳ භාෂාත්මක අධ්‍යයනයක්

ඩබ්ලිව්.එච්.එම්.අයි. ලක්මාලි

ප්‍රාචීන භාෂා අධ්‍යනයේ ඇති වූ දියුණුවත් සමඟ ගිහි පැවිදි උගතුන්ගේ මූලිකත්වයෙන් ලාංකේය පුවත්පතේ ආරම්භය සිදු විය. සිංහල පුවත්පත් කලාවේ විකල්ප පුවත්පත්හි ආරම්භය සනිටුහන් කරන "ඇත්ත" පුවත්පත ක්‍රි.ව. 1964 දී මෙ රට බිහි වූ කොමියුනිස්ට් දේශපාලන මතවාදය මුල් කර ගත්තකි. මෙකී පුවත්පතේ කතුවැකිය යෝජිත පර්යේෂණයෙන් අවධානයට ලක් කරනු ලබන්නේ බී.ඒ. සිරිවර්ධනගේ කර්තෘත්වය යටතේ ය. බී.ඒ. සිරිවර්ධනගේ මාධ්‍යය භාවිතය පිළිබඳ විමසීමේ දී ඔහුගේ ලේඛන රටාවේ සුවිශේෂත්වයක් දැකිය හැකි ය. භාෂාව හැසිරවීමට පැවති ශක්‍යතාවයත්, වචන කෝෂය ඉක්මවූ රචනා චාතුර්යත් මත ඔහුගේ කතුවැකි සුවිශේෂත්වයට පත් වේ.

බී. ඒ. සිරිවර්ධනගේ කතුවැකි අන්තර්ගතය සමාජ දේශපාලන දර්ශනය මත පිහිටා ඇත. "ඇත්ත" පුවත්පත බිහි වීමේ දේශපාලන ස්ථාවරත්වය කෙරෙහි සිරිවර්ධනගේ දේශපාලන ස්ථාවරත්වය ද කොතෙක් දුරට බලපෑම් කළේ ද යන්න යූ.ඇන්.පී. හා සමඟි පෙරමුණට එරෙහි විවේචන යනාදියෙන් අවබෝධ කරගත හැකි ය. මෙකී කරුණු මත පිහිටා යෝජිත පර්යේෂණය විමර්ශනට ලක් කෙරේ.

SSSP04

# හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අභිචාර හා ජන විශ්වාස පද්ධතිය පිළිබඳ ව අධ්‍යයනයක්

එම්.එම්.ආර්. එදිරිසිංහ

වලස්මුල්ල කොට්ඨාසයේ වැඩි වශයෙන් මිනිසුන් අතර ප්‍රචලිත අභිචාර වර්ග ප්‍රදේශයේ මිනිසුන්ගේ ජන ධර්මය හා සම්බන්ධ වන ආකාරය දැකිය හැකි ය. මෙය මෙහි අපේක්ෂිත අධ්‍යයන කේන්ද්‍රය බවට පත් වේ. පොහදෙ අභිචාර පිළිබඳ ව බොහෝ පර්යේෂණයන් සිදුකර ඇත. අභිචාර යනු කුමක් ද" එක් එක් ප්‍රදේශයන්ට ආවේණික අභිචාර වර්ග පිළිබඳ ව එම ශාන්තිකර්ම සිදු කරන ආකාරය යනාදී වශයෙන් අධ්‍යයන සිදුකර ඇත. මෙම පර්යේෂණයේ අරමුණ වනුයේ ජනතාවගේ ලෞකික අවශ්‍යතා පූරණය කිරීම පිණිස සංවිධානය වූ මෙම අභිචාර වර්ග වලස්මුල්ල කොට්ඨාසයේ පුද්ගලයන්ගේ සාමාන්‍ය ජනජීවිතය සමඟ සම්බන්ධ වන ආකාරය පිළිබඳ ව නිරීක්ෂණය කිරීම යි.

මෙම ප්‍රදේශයේ ප්‍රචලිත අභිචාර වර්ග සහ ජන විශ්වාසයන් හඳුනා ගැනීම, පොහදෙ මිනිසුන් අභිචාර සහ ජන විශ්වාස කෙරෙහි නැඹුරු වීමට බලපාන හේතු හඳුනා ගැනීම, එම අභිචාර ශාන්තිකර්ම සහ ජන විශ්වාස කෙරෙහි මිනිසුන් තුළ පවතින විශ්වාසය හඳුනා ගැනීම හා ඒ වැනි විශ්වාස මත සිහිකරන ශාන්තිකර්ම මිනිසුන්ගේ ජන ධර්මය සමඟ සම්බන්ධ වන ආකාරය හඳුනා ගැනීම මෙහි උප අරමුණු වේ.

SSSP05

# ගුණදාස අමරසේකරගේ නවකතාවලින් නිරූපණය වන සමාජ දේශපාලන වෙනස් වීම පිළිබඳ සමාජීය සාහිත්‍ය අධ්‍යයනයක්

(ගමනක මුල, ගම්දොරින් එළියට, ඉනිමගේ ඉහළට, වංකගිරියක, යළි මඟ වෙත නවකතා ඇසුරෙන්)

කේ.එච්.ඩී. ඉෂානි ජයවර්ධන

නවකතාව සමාජීය සාහිත්‍යයට වඩාත් සමීප වන්නේ සමාජය මෙන් ම සමාජගත මිනිසුන්ගේ හැසිරීම්, ක්‍රියාකාරකම්, ගැටලු, නවකතාව මඟින් ප්‍රතිනිර්මාණය වන බැවිනි.

ඒ සඳහා තේමාව වශයෙන් යොදා ගැනෙන්නේ ගුණදාස අමරසේකරගේ නවකතා කිහිපයක් ඇසුරින් සමාජ දේශපාලන වෙනස්වීම් පිළිබඳ සමාජීය සාහිත්‍ය අධ්‍යයනයක් සිදු කිරීම යි. උක්ත පර්යේෂණ තේමාව අනුව පර්යේෂණ සන්දර්භය සැකසෙන්නේ නූතන සිංහල සාහිත්‍ය විචාර ප්‍රවේශය තුළ ය.

උක්ත පර්යේෂණය සඳහා යොදා ගත් නවකතාවලින් ශ්‍රී ලාංකේය සමාජ දේශපාලන වෙනස්වීම් නිරූපණය කෙරෙන අයුරු අධ්‍යයනය කිරීම මූලික අරමුණ යි. ඒ සඳහා ගමනක මුල, ගම්දොරින් එළියට, ඉනිමගේ ඉහළට, වංකගිරියක හා යළි මඟ වෙත යන නවකතා ප්‍රධාන මූලාශ්‍රය ලෙස භාවිත කෙරේ.

SSSP06

# කිරම ධම්මානන්ද හිමි පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනයක්

ඒ.කේ.ජී.එස්. මධුෂාණි

සංඝරාජ හිමිගේ ශාස්ත්‍රීය පුනර්ජීවනය හමුවේ ගොඩනැගුණු මාතර සාහිත්‍යයේ තුළ කිවි කිවිදියෝ බොහෝ දෙනෙක් කාව්‍යකරණයේ නිරත වූහ. ඒ අතර සංඝරාජ හිමිගේ පරම්පරාව නියෝජනය කරමින් කාව්‍යකරණයට පිවිසි කිරම ධම්මානන්ද හිමි කැපී පෙනේ. ධම්මානන්ද හිමි සිදු කරන ලද ශාස්ත්‍රීය සේවාව මූලික අරමුණු කරගනිමින් තවත් අරමුණු කීපයක් ඔස්සේ මෙම පර්යේෂණ නිබන්ධනය සිදු කිරීමට නියමිත ය.

කිරම ධම්මානන්ද හිමි පිළිබඳ ව සිදු කෙරෙන මෙම නිබන්ධනයේ එක් අරමුණක් වන්නේ ධම්මානන්ද හිමි පිළිබඳ අප්‍රකට තොරතුරු පිළිබඳ ගවේෂණය කිරීම යි. එහි දී උන්වහන්සේගේ ජීව දත්ත, රචනා කරන ලද කාව්‍යය හා සම්බන්ධකම් පවත්වන ලද පුද්ගලයින් පිළිබඳ ව අවධානය යොමු කෙරේ.

මාතර යුගයේ කවීන් හා සසඳන විට ධම්මානන්ද හිමිගේ කවිවල ඇති සුවිශේෂී ලක්ෂණ පිළිබඳ විශේෂ අවධානය යොමු කෙරේ. උන්වහන්සේගේ කාව්‍ය නිර්මාණවලට පාදක වී ඇති වස්තු විෂය, ආකෘතිය, භාෂාව ආදී අංශයන් ගැඹුරින් විවරණය කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ.

ධම්මානන්ද හිමි පිළිබඳ ව යටපත් වී ඇති සාකච්ඡාව නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමට අපේක්ෂා කෙරේ. කිරම හිමියන්ගේ සාහිත්‍ය නිර්මාණ වර්තමානය වන විට පරිහානියට පත්වෙමින් පවතී. එයට ප්‍රධාන ම හේතුව වන්නේ මෙම සාහිත්‍ය නිර්මාණවල ඇති වටිනාකම පිළිබඳ වර්තමාන පරපුරෙහි ඇති නො දැනුවත් භාවය යි. ධම්මානන්ද හිමි පිළිබඳ යටපත් වී ඇති සාකච්ඡාව නැවත ඉස්මතු කර අභාවයට පත්වෙමින් පවතින සාහිත්‍ය නිර්මාණවල වටිනාකම කුළු ගැන්වීම මෙහි අරමුණ වේ.

SSSP07

# කීර්ති වැලිසරයන්ගේ නවකතා පිළිබඳ සමාජීය සාහිත්‍ය අධ්‍යයනයක්

(කාලසර්ප හා ගරුඬ මුහුර්තය ඇසුරින්)

එච්.ජී.ජී.එන්. ලක්මාලි

"කීර්ති වැලිසරයන්ගේ නවකතා පිළිබඳ සමාජීය සාහිත්‍ය අධ්‍යයනයක්" යන මාතෘකාව යටතේ කිසිඳු සමාජීය හා සාහිත්‍ය අධ්‍යයනයක් මෙතෙක් සිදු නො වී ඇති අතර ඒ පිළිබඳ ව සමාජීය සාහිත්‍යය අධ්‍යයනයක් කිරීම මෙහි ප්‍රධාන ම අරමුණ යි.

සාහිත්‍යයේ සමාජීය වැදගත්කම හඳුනා ගැනීම මෙහි දෙවන අරමුණ යි. සාහිත්‍ය හා සමාජ සංවිධානය අතර අන්‍යෝන්‍ය සබඳතාවක් පවතින අතර, මෙහි දී ලේඛකයාගේ සමාජ පසුබිම ඔහුගේ නිර්මාණයන් කෙරෙහි බලපාන අන්දමත් සාහිත්‍ය කෘතියෙහි අන්තර්ගත සමාජ අර්ථය පිරික්සීමත් සාහිත්‍ය රචනය සමාජය කෙරෙහි බලපාන අන්දමත් මෙයින් විමසා බැලීමට නියමිත ය.

මෙහි තෙවන අරමුණ සාහිත්‍ය නිර්මාණයක් එය ප්‍රකාශයට පත් සමාජ , ඓතිහාසික පසුබිම හා දක්වන ප්‍රතික්‍රියාව එයාව විමසා බැලීම යි. මෙ මඟින් නවකතාව මඟින් සමාජීය සාහිත්‍ය අධ්‍යයනයක් සිදුකරන ආකාරය විමසා බැලෙන අතර නවකතාකරුවා සමාජය නිරීක්ෂණය කරන ආකාරය අධ්‍යයනය කිරීමට නියමිත ය.

ලේඛකයා නිර්මාණය හා පාඨකයා යන අංශ තුනෙහි අන්‍යෝන්‍ය සබඳතාවය සාහිත්‍ය කෘතිවලින් නිරූපණය කරන ආකාරය විමසා බැලීම මෙම නිබන්ධයේ සිවුවන අරමුණ යි.

යථෝක්ත අරමුණු පදනම් කොටගෙන වැලිසරගේගේ නවකතා පිළිබඳ සමාජීය සාහිත්‍ය අධ්‍යයනයක නිරතවීමට අපේක්ෂා කෙරේ.

SSSP08

# චාමික හත්ලහවත්තගේ නාට්‍ය දෘෂ්ටිය පිළිබඳ ව අධ්‍යයනයක්

(ඔහුගේ තෝරාගත් නාට්‍ය කෘති ඇසුරින්)

වී.ජ්. ලක්මාලි

නව පරපුරෙහි නාට්‍යකරුවෙකු වන චාමික හත්ලහවත්ත නූතන වේදිකා නාට්‍ය කලාවේ පර්යේෂණකාමී නවීන අදහස් සහිත නිර්මාණකරුවෙකි. දැනට කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ ආචාර්යවරයෙකු ලෙස සේවයේ යෙදෙන ඔහු පර්යේෂණයන් සිදුකරමින් නාට්‍ය නිර්මාණය කරන්නෙකි. මෙයින් හත්ලහවත්තගේ නාට්‍ය කෘති ද්විත්වයක් ඇසුරු කරගෙන ඔහුගේ නාට්‍ය දෘෂ්ටිය පිළිබඳ ව අධ්‍යයනය කිරීමට නියමිත ය.

ප්‍රථමයෙන් සිංහල වේදිකා නාට්‍ය කලාව පිළිබඳ ව පූර්විකාවක් සපයන අතර ඔහුගේ නාට්‍ය කෘති ද්විත්වයක් ඇසුරු කරගෙන නාට්‍යයන්හි ලක්ෂණ අධ්‍යයනය කෙරේ.විශේෂයෙන් දේශීය විදේශීය නාට්‍ය රීති, රංග ශෛලීන් ඔහුට බලපෑ ආකාරය අධ්‍යයනය කරනු ලැබේ.අවසාන වශයෙන් නූතන වේදිකා නාට්‍ය කලාවේ ප්‍රගමනයට ඔහුගේ දායකත්වය හා එම නාට්‍ය කෘති බිහිවීමට පසුබිම් වූ සාධක පිළිබඳ ව ද අධ්‍යයනය කිරීමට නියමිත ය.

SSSP09

# නූතන සිංහල නාට්‍ය කලාවේ නාට්‍ය ශෛලි පිළිබඳ අධ්‍යයනයක්
(තෝරාගත් නාට්‍ය කෘති ඇසුරින්)

එල්.ආර්.සී. කුමුදුනී

මෙම අධ්‍යයනය තෝරාගත් නාට්‍යය කෘති පහක් ඇසුරින් මෙම අධ්‍යයනය සිදු කෙරේ. එහි දී ,සිංහබාහු ස්වතන්ත්‍ර නාට්‍යධර්මී, කැලණි පාලම වර්තමාන ස්වභාවික නාට්‍ය, හුණුවටයේ කතාව අනුවර්තන පරිවර්තන අර්ධ ශෛලීය සම්ප්‍රදාය, ජයලත් මනෝරත්නගේ ගුරුතරුව, සුගතපාල ද සිල්වාගේ බෝඩිංකාරයෝ යන නාට්‍ය නිර්මාණ ඇසුරු කරගනිමින් එම නිර්මාණවල විශේෂ අවධානයක් යොමුවන්නේ නාට්‍ය ශෛලි පිළිබද ව යි.

නාට්‍ය ශෛලි වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමටත් අදාළ ශෛලිවල ලක්ෂණ වේදිකාවෙන් ගිලිහී යන විට ප්‍රේක්ෂකයාට නරඹන නාට්‍ය කුමන ශෛලියට අයත්දැයි හඳුනාගැනීමටත් පහසු වන ලෙස නූතන නාට්‍ය ඇසුරින් අධ්‍යයනයක් සිදු කිරීම මෙහි අරමුණ යි.

SSSP10

# බණ්ඩාර ඇහැළියගොඩගේ ගේය පද රචනා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කේ.ජ්.කේ.එම්. කුරුප්පු

මෙම අධ්‍යයනය බණ්ඩාර ඇහැළියගොඩගේ ගේය පද රචනා පසුබිම කොට ගත්තකි. දශක හතරකට ආසන්න ව සුභාවිත සිංහල ගීත කලාවෙහි ලා නව්‍ය කතිකාවන්ට මං විවර කළ ගී පද රචකයෙකු ලෙස ඔහු වැදගත් වෙයි. ප්‍රේමය, විරහව, වේදනාව ආදී සමකාලීන ජනප්‍රිය ගීත තේමා හා ජීවන දෘෂ්ටීන්ගෙන් වෙනස් වූ ඔහුගේ ගීත මව, පියා, දියණිය බිරිඳ ලෙස සමාජයේ දිස්වෙන උත්තරීතර චරිත සඳහා වටිනාකම් ලබා දෙමින් සමාජ ප්‍රශ්න ගැටලු ප්‍රසංවාදී ව ඉදිරිපත් කරන්නා කරමින් ආකාරය විමසා බැලීම පිළිබඳ අවධානය යොමු වී ඇත.

බණ්ඩාර ඇහැළියගොඩගේ ගී පද රචනා නැමැති පර්යේෂණ සන්දර්ශය ඇසුරින් එම අවධිය තුළ ගීතයේ ස්වභාවයන් බණ්ඩාර ඇහැළියගොඩගේ භාෂා භාවිතය, වස්තු විෂය හා සමාජ විවිරණය අධ්‍යයනය කිරීමත් සුභාවිත ගීතයේ නව ගුණ විවරණය කිරීමත් ඒ මඟින් ගීතය විෂයෙහි බණ්ඩාර ඇහැළියගොඩගේ බලපෑම අනාවරණය කරමින් නව විචාර සංකල්ප ගොඩනැඟීමත් විෂයානුබද්ධ අඩුලුහුඩුතා හඳුනාගැනීමත් සිදු කෙරේ.

SSSP11

# 1950 දශකයේ පුවත්පත් දැන්වීම් භාෂාව පිළිබඳ අධ්‍යයනයක්

කේ.ඒ.එස්.එම්. සමරසිංහ

1950 දශකයේ ශ්‍රී ලංකාවේ පුවත්පත් වෙළඳ දැන්වීම් භාෂාව මෙහි පර්යේෂණ ක්ෂේත්‍රය යි. එය භාෂාත්මක අධ්‍යයන ක්ෂේත්‍රය යටතේ සිදු කරනු ලබයි. මෙම නිබන්ධනය තුළ ගැටලුව වන්නේ 1950 දශකය තුළ වෙළඳ දැන්වීම් භාෂාවේ දක්නට ලැබෙන සුවිශේෂිතාවන්ට හේතු සාධක සෙවීම යි.

ලංකාවේ පළමු පුවත්පත් , පුවත්පතේ ආරම්භය, ඒ සඳහා නිර්මාණය වුණු නීති රීති , ළණපනත් ආදිය පිළිබඳ කෘති සම්පාදනය වී ඇත. එහි දී බොහෝ අධ්‍යයනයන් සිදු වී ඇත්තේ "පුවත්පත් ශීර්ෂ පාඨ" මූලික කරගෙන ය. මෙම අධ්‍යයනය මඟින් බලාපොරොත්තු වන්නේ 1950 දශකයේ පුවත්පත්හි වෙළඳ දැන්වීම භාෂාව කෙබඳුදැයි අධයනයන කිරීම යි. 1950 දශකය ශ්‍රී ලංකාවේ ආර්ථික, දේශපාලිනක මෙන් ම සමාජීය වශයෙන් පෙරළියකට තුඩු දුන් වර්ෂයකි. ඒ අනුව එකල දේශපාලනය, ආර්ථික තත්වය, සමාජීය පදනම් ආදී කරුණු මෙම භාෂාව කෙරෙහි බලපෑවේ කිනම් අයුරින් ද යන්න විමසීම මූලික වේ.

SSSP12

# ධීවර කර්මාන්තය ආශ්‍රිත භාෂාව පිළිබඳ සමාජ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක්

කේ.එම්.ටී. පෙරේරා

හුදකලාව වැඩුණු මිනිසා ජනාවාස වීම ඇරඹීමත් සමඟ ඔවුන් විසින් සමාජ සංස්ථා නිර්මාණය කරගැනීමට උපයෝගී කරගත්තේ භාෂාව ය. මෙසේ ඒකරාශී වුණු පුද්ගල සමාජය තුළ පවුල් අනුව, වාසය කරන ප්‍රදේශය අනුව, සමාජයේ දරන තරාතිරම් අනුව, ජීවිකා වෘත්තිය අනුව කොටස් ගණනාවකට වර්ගීකරණය වී තිබීම දැකගත හැකි ය. ලාංකීක ජන සමාජය තුළ දක්නට ලැබෙන විවිධ වෘත්තීයබද්ධ ව්‍යවහාර භාෂා අතරින් ධීවර භාෂාව සුවිශේෂ වේ.

නමුත් ඒ පිළිබඳ සමාජ හා වාග්විද්‍යාත්මක පැතිකඩ ඔස්සේ සිදු වූ ශාස්ත්‍රීය පර්යේෂණ ප්‍රමාණය අල්ප ය. විශේෂයෙන් ධීවර කර්මාන්තය සම්බන්ධ හුදු වාක්කෝෂයක් සම්පාදනය කිරීම මිස ඉන් ඉදිරියට යමින් වාග්විද්‍යාත්මක කරුණු හා සංකල්ප මත පදනම් ධීවර වාක්කෝෂය පිළිබඳ පර්යේෂණ සිදු වී නොමැත. ධීවර කර්මාන්තය ආශ්‍රිත භාෂාව පිළිබඳ සමාජ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කිරීමට අපේක්ෂා කරන මෙම පර්යේෂණ නිබන්ධයේ දී ධීවර භාෂාවේ වාග්විද්‍යාත්මක පැතිකඩ ඔස්සේ මෙතෙක් අවධානය යොමු නො වුණු ධීවර භාෂාවේ පරිමිත භාෂා ස්වරූපය හා සාමාජීය භාෂා ස්වරූපය යන නව පැතිකඩක් ඔස්සේ පර්යේෂණය මෙහෙයවීම අරමුණ යි.

SSSP13

# මානව සහජීවනය ගොඩනැගීමේහි ලා නිශ්ශංක විජේමාන්නගේ නවකතාවල බලපෑම

(තාරා මගේ දෙව්දුව හා හඳ පළුව තනි තරුව නවකතා දෙක ඇසුරින් )

පූජ්‍ය ජඹුරවෙල චන්දරතන හිමි

සමාජ සහජීවනය ගොඩනැගීමෙහි ලා නිශ්ශංක විජේමාන්නගේ නවකතා පිළිබඳ කරනු ලබන අධ්‍යයනය අරමුණු රාශියකින් යුක්ත වූවකි. රාජ්‍ය සාහිත්‍ය සම්මාන ඇතුළු සම්මාන රාශියක් ලැබීමට තරම් දක්ෂ ලේඛන කෞශල්‍යයකින් හෙබි විජේමාන්න පිළිබඳ සැලකිය යුතු මට්ටමක විචාරක පාඨක අවධානයක් යොමු වී නො තිබීම; නිර්මාණ තුළ පවතින රචනා ශෛලිය භාෂා භාවිතය ආදී සුවිශේෂීතා අවධානයට ලක් වී නො තිබීම; නිර්මාණයකරණයේ දී නිර්මාණය සඳහා තේමා කොට ගන්නා කාලීන සමාජ ප්‍රස්තුත පිළිබඳ අධ්‍යයනයන් අවම මට්ටමක පැවතීම ආදී කාරණා අධ්‍යයනය අරමුණු ලෙස ගැනේ.

නූතන සිංහ, සමාජය තුළ මතු වූ සංස්කෘතික ගැටුම් තේමා ලෙස ගෙන නවකතා රචනා වී තිබේ. එම තේමාවන් වැඩි වශයෙන් මූලිකස්ථානයක් ගෙන ඇත්තේ ගැටුමට සම්බන්ධ පාර්ශවයන් විසින් තමා අයත් පාර්ශවයේ සාධාරණත්වය ප්‍රකාශමාන කිරීම උදෙසා කරන නිර්මාණාත්මක කාර්යක් ලෙසිනි. එහෙත් විජේමාන්න තම නවකතා තුළ සංස්කෘතික හා වාර්ගික ගැටුම් සඳහා බලපාන හේතු සාධක විවරණය කරමින් ගැටුමට සම්බන්ධ සමාජ හරස්කඩක් සාහිත්‍ය තුළ නිරූපණය කරයි. එය ගැටුම සමනය කිරීම විෂයෙහි සමාජය මෙහෙයවීම උදෙසා මිස, තම පාර්ශ්වය සාධාරණීකරණය කිරීමට ගන්නා උත්සාහයක් ද නොවේ. නො සන්සිඳෙන මානව හැඟීම මත නිර්මාණය වන ගැටුමට සම්බන්ධ කිසිදු පාර්ශවයක් පරාජය නො කොට ජයග්‍රහණය කිරීමට අවශ්‍ය විශ්වීය චින්තනය නවකතාව විසින් ගොඩනගනු ලබයි. එම චින්තනය නූතන වාර්ගික අර්බුද සමනය කරගැනීම විෂයෙහි මානව සමාජයට වැදගත් මඟපෙන්වීමක් සිදු කරයි.

සිංහල දෙමළ වාර්ගික ගැටුමට විරාමයක් ලැබෙන අවකාශයේ සිංහල මුස්ලිම් ආගමික ගැටුමක් වෙතට ලාංකික සමාජය තල්ලු වෙමින් තිබේ. මිනිසා බැඳ තබන ආගමික හා ජාතික බැමි ලිහා, විශ්වීය පුරවැසියෙක් නිර්මාණය කිරීම විෂයෙහි ලාංකික සමාජයට පණිවිඩයක් ලබාදීමට මෙම අධ්‍යයනය වැදගත් වේ. සාහිත්‍ය විචාරක රික්තයෙන් හා සාහිත්‍ය නිර්මාණ තේමාවන්හී දරිද්‍රතාවයන් සමනය කිරීම විෂයෙහි පාඨකයා හා විචාරකයා කැඳවීමට ද මෙ වැනි අධ්‍යයනයන් වැදගත් වේ.

SSSP14

# බද්දේගම ශ්‍රී විමලවංශ හිමිපාණන්ගේ ශාස්ත්‍රීය සේවය පිළිබඳ අධ්‍යයනයක්

එන්.ඒ.කේ.ටී. මධුශාණි

බද්දේගම විමලවංශ හිමියන් සාහිත්‍යට කළ සේවාව අතර ග්‍රන්ථකරණයේ දී සිංහල, පාලි හා සංස්කෘතයට පමණක් සීමා නොම වෙනත් භාෂාවන් පිළිබඳව අවධානය යොමු කරමින් ජනතාව තුළ භාෂා සාහිත්‍ය, සංස්කෘතිය හා කලා ශිල්ප කෙරෙහි උද්යෝගයක් ඇති කිරීමෙහි ලා ක්‍රියා කළ ආකාරය පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙහි මුඛ්‍යතම අරමුණ වශයෙන් පෙන්වා දිය හැකි ය. බද්දේගම විමලවංශ හිමියන් විසින් පුවත්පත් සඟරාවලට ලියන ලද ලිපි බෞද්ධ දර්ශනය හා සංස්කෘතිය ආශ්‍රය කරගෙන සදාචාරාත්මක මත ජනතාවගේ දැන ගැනීම සඳහා පමණක් ද යන්න අධ්‍යයනය කිරීම ද අරමුණක් වේ. සිංහල ජනතාවට හා භාෂාවට නිසි තැන ලබා දීමට හැකි ව්‍යාපාරයක නිරත වූ බද්දේගම විමලවංශ හිමියන් සිංහල ජාතික සංගමය නියෝජනය කරමින් භාෂා සටන කෙරෙහි දායකත්වය හා වාදවිවාදකරණයේ දි ආගමික වාදයන්ට පමණක් සීමා නො වී ශාස්ත්‍රීය වාදයන්ට දැක්වූ දායකත්වය අධ්‍යයනය කිරීමටත් අපේක්ෂා කෙරේ.

මෙහි දී බද්දේගම විමලවංශ හිමියන් එක් ක්ෂේත්‍රයකයට පමණක් සීමා නො වී ශාස්ත්‍රීය භූමිකාව තුළ වැඩි වශයෙන් අවධානයට ලක් කළ විෂය ක්ෂේත්‍ර මොනවා ද? යන්න විමර්ශනයට ලක් කෙරේ.

SSSP15

# නාඩගම් හා නූර්ති පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනයක්

(තෝරාගත් කෘති කිහිපයක් පහත ඇසුරින්)

ඩබ්ලිව්. ආර්. පී. ආර්. නිම්සරණි

සිංහල නාට්‍ය වංශය නාඩගම් යුගය, නූර්ති යුගය හා ටීටර් යුගය යනුවෙන් කොටස් 03කට බෙදා දැක්විය හැකි ය. නූර්ති හා ටීටර් යන කාල පරිච්ඡේදයන් එක්ව ගත්කල එයට ටවර් හෝල් යුගය යැයි නම් කිරීමට හැකි ය. නාඩගම් නූර්ති පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනයක් සිදු කිරීමේ දී ඒ සඳහා සාකච්ඡාවට බඳුන් කිරීමට කරුණු රාශියක් පවතී. නමුත් විස්තරාත්මක ව නූර්ති හා නාඩගම් අතර පවතින අසමානතා තෝරාගත් නාඩගම් හා නූර්ති කිහිපයක් ඇසුරින් පැහැදිලි ව අධ්‍යයනයක් සිදු කිරීමට දැනට කිසිවෙකු සමත් වී නොමැත. ඒ පිළිබඳ ව බොහෝ පොත් පත් තිබුණ ද පැහැදිලි ව මේ නූර්ති හා නාඩගම් අතර පවතින්නා වූ සම විසමතා පිළිබඳ ගවේෂකයෙකුට ඍජු ව ම අධ්‍යයනයට ගත හැකි තරමේ කෘති ප්‍රාමාණික නො වන බැවින් නාඩගම් අතුරින් වෙස්සන්තර නාඩගමටත් ඇහැළේපොළ නාඩගමටත් නූර්ති අතුරින් සිරිසඟබෝ නූර්තියටත්, හරිශ්චන්ද්‍ර නූර්තියත් ප්‍රාමාණික කොට මේ දෙක අතර සන්සන්දනාත්මක අධ්‍යයනයක් මෙහි දී සිදු වේ.

SSSP16

# කෝට්ටේ යුගයේ ජාතක කතා කාව්‍ය වර්ණනා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එම්.ජේ.එන්. සඳමාලි

සිංහල සාහිත්‍යය ඓතිහාසික වර්ධනය තුළ ජාතක කතා කවියට නැඟීම විවිධ කාල වකවානුවල සිදු වුව ද ඒවායින් ජාතක කතාවක් කවියට නැඟීමේ කාර්යයභාරය නියමාකාරයෙන් ඉටු වුණේ ද යන්න ගැටලු සහගත ය. සිංහල සාහිත්‍ය යුගයන්හි අද්විතීය ස්ථානයක් හිමි වන කෝට්ටේ යුගයේ රචිත විශිෂ්ට ජාතක කතාද්වයක් වශයෙන් වැදගත් වන කාව්‍යශේඛරය හා ගුත්තිල ජාතක කතා කාව්‍ය ජාතක කතා කවියට නැඟීමේ සම්ප්‍රදාය තුළ සැලකිය යුතු කාර්ය භාරයක් ඉටු කළ බව සත්‍යයකි. ඒ අනුව සිංහල සාහිත්‍ය තුළ මෙම කෘති ද්වය ලබනුයේ සුවිශේෂී ස්ථානයකි. වැඩි අවධානය දිනාගනිමින් ගුත්තිලය වැනි කෘති මුදුන් මල්කඩ සේ සැලකුව ද ඒවායේ වර්ණනා භාවිත අවස්ථාවන්හි උචිත භාවය ඇතැම් අවස්ථාවක ගැටලු සහගත ය. ඒ පිළිබඳ බොහොමයකගේ විවේචන විචාරයකට වඩා යොමු වී ඇත්තේ ඒවායේ සාධනීය ලක්ෂණ හඳුනාගැනීම පමණකි. ඒ නමුත් වඩාත් සුපරීක්ෂාකාරී ව කාව්‍යශේඛරයත්, ගුත්තිලයත් අධ්‍යයනය කිරීමේ දී එම ජාතක කතා කාව්‍යකරුවන් කතා සන්දර්භය තුළ යොදාගත් වර්ණනාත්මක අවස්ථාවන්හි උචිත අනුචිත බව සම්බන්ධ ව ගැටලු සහගත තත්වයන් ඇති වේ. ස්වභාවෝක්තිය ඉක්ම වූ, යථාර්ථයට සමරූපී නො වන බොහෝ වර්ණනා පවතිනවාය යන්න එය අවධානයෙන් අධ්‍යයනය කරන මධ්‍යස්ථ විචාරකයකුට හැඟී යන්නකි. ජාතක කතා කාව්‍යයට නැඟීමේ විශිෂ්ට කෘතිද්වය වශයෙන් කාව්‍යශේඛරයත්, ගුත්තිලයත් සැලකුව නමුත් එම කෘතිවල වර්ණනාවන්හි නො ගැළපෙන, ව්‍යාකූල වර්ණනා අන්තර්ගත බව පෙනේ.

ඒ අනුව මෙම පර්යේෂණය මඟින් අවධානය යොමු කෙරෙන්නේ කාව්‍යශේඛරයෙන්. ගුත්තිලයෙන් වර්ණනා අතර ඇති එම අනුචිත අවස්ථා හඳුනා ගැනීම ය.

SSSP17

# ගුත්තිල කාව්‍යයේ චරිත නිරූපණය පිළිබඳ අධ්‍යයනයක්

එස්.එස්. සමරසේකර

ගුත්තිලයේ චරිත නිරූපණය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් යන පර්යේෂණ මාතෘකාව ඔස්සේ සිදු කරනු ලබන පර්යේෂණයේ අරමුණු සහ අධ්‍යයනයේ වැදගත්කම පිළිබඳ සැකෙවින් හැඳින්වීමක් මෙහි දි සිදු වේ.

ජාතක කතා කාව්‍යයට නැඟීමේ දී ඉතා ජනප්‍රිය වූයේ ගුත්තිල කාව්‍යය යි. ගුත්තිල කාව්‍ය සම්බන්ධ ව ප්‍රාමාණිකයන් විවිධ අදහස් ඉදිරිපත් කර ඇත. එකී දැනුමට නව දැනුමක් එකතු කිරීම ට මෙම අධ්‍යයනයේ යෝජිත අරමුණකි. ගුත්තිල කාව්‍ය, ඊට අදාළ අනෙකුත් කෘතිවල සඳහන් වර්ණිත චරිත, ස්ථාන, අවස්ථා ඒ අයුරින් ම නිරූපිත නොවේ. විශේෂයෙන් ගුත්තිල කාව්‍යයේ සහ අනෙකුත් කෘතිවල ද ගුත්තිල මූසිල යන ප්‍රධාන චරිතද්වය පිළිබඳ අවධානය යොමු කරමින් අධ්‍යයනයක් සිදු කර ඇති නමුත් සෙසු චරිත පිළිබඳ අධ්‍යයනයක් සිදු වීම දුලබ ය. එකී අඩුලුහුඩුතා ඌනපූර්ණය කිරීම මෙම යෝජිත අධ්‍යයනය මගින් සිදු වේ. ජාතක කතාවකට ප්‍රස්තුත වූ ගුත්තිල පුවත කාව්‍යයක් බවට ප්‍රතිනිර්මාණය කිරීමේ දී නිර්මාණකරුවා ගොඩනගා ගෙන ඇති චරිත නිරූපණ කුසලතාව කෙබඳු ද යන්න මෙහි දී විශේෂයෙන් අධ්‍යයනයට පාත්‍ර විය.

SSSP18

# හය ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා (නව නිර්දේශය) පාසල් පෙළ පොතේ න,ණ,ල,ළ භේදය පිළිබඳ අධ්‍යයනයක්

එච්.ඩබ්ලිව්.කේ එරන්දිකා

සිංහල භාෂා සම්මතය තුළ ද පද යොදා ගැනීමේ දී අක්ෂර භාවිත කිරීමේ සම්මුතියක් පවතී. මෙහි දී සිංහල භාෂාවේ ණ,න,ළ,ශ,ෂ,ස අල්පප්‍රාණ - මහාප්‍රාණ භේදය ආදිය පිළිබඳ ව එම අක්ෂර ලේඛනයේ දී භාවිත කිරීම සම්බන්ධ ව බොහෝ දෙනා අතර ගැටලු පවතී. මේ ගැටලු නිරාකරණය කර ගැනීම සම්බන්ධ ව විද්වතුන් විසින් විවිධ ග්‍රන්ථ සම්පාදනය කරනු ලැබ ඇත.

පාසල් විෂය මාලාව තුළ සිංහල භාෂාව ඉගැන්වීම් සිදු වේ. මෙහි දී සිංහල භාෂාවේ ව්‍යාකරණ රීති සම්බන්ධ ව එන ඉගැන්වීම් අතර ණ,න,ළ,ල භේදය පිළිබඳ ව ඉගැන්වීම් ඇතුළත් කොට තිබේ. ණ,න,ළ,ල අක්ෂර භාවිත කිරීම් සම්බන්ධ ව පාසල් සිසුන්ට අවශය මූලික අවබෝධය ලබා ගැනීමට අවශ්‍ය උපක්‍රම හඳුනා ගැනීම මෙහි අරමුණකි.

SSSP19

# හරණ ගණිතාචාර්ය පිළිබඳ මානවවංශවේද අධ්‍යයනයක්

ගයත්‍රි හංසිකා

මහනුවර වැලිවිට සරණංකර හිමියන්ගෙන් ආරම්භ වූ ශාස්ත්‍රීය ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් ලෙස රුහුණු ප්‍රදේශයේ මුල් කර ගෙන සාහිත්‍ය බිහි විය. මාතර යුගය තුළ දී බිහි වූ ගිහි පැවිදි කවියන් අතුරින් හරණ ගණිතාචාර්යවරයා සුවිශේෂි කවියකු විය. පාලි-සංස්කෘත භාෂා හසුරවමින් මාතර කවිය තුළ සුවිශේෂත්වයක් ඇති කිරීමෙහි පුරෝගාමියා වූයේ මෙතුමා ය.

සිංහල කවිය විෂයෙහි ආකෘතියේ සහ භාෂාවේ වෙනස් ස්වරූපයක් විශද කරන වස් කවි, සෙත් කවි ආදීයත් නීල කොබෝ සන්දේශය වැනි කාව්‍යය සංග්‍රහත් රචනා කරමින් මාතර සාහිත්‍ය යුගයේ කැපී පෙනෙන කවියකු ලෙස හරණ ගණිතාචාර්ය සැලකුණ ද ඔහු පිළිබඳ ප්‍රාමාණික ශෘස්ත්‍රීය අධ්‍යයනයක් මෙතෙක් සිදු වී නැත. එබැවින් මෙම පර්යේෂණය ඔහුගේ සාහිත්‍ය ශක්‍යතාව නක්ෂත්‍ර ප්‍රවීණත්වය සහ ජ්‍යෝතිෂය නිපුණත්වය පිළිබඳ ව සොයා බලමින් කවියෙකුගෙන් ඔබ්බට විහිදෙන පුද්ගල චරිතභාවය පිළිබඳ මානවවංශවේද අධ්‍යයනයකි.